VIDUS 2-4-1

සංවර්ධන සැලසුම් කිරීමේ නව විෂය සීමා

එච්. එන්. එස්. කරුණාතිලක

නියෝජ්‍ය අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව

රටෙහි ශීඝ්‍ර සංවර්ධනය උදෙසා වැඩ සටහනක් දියත් කිරීමට පෙර ප්‍රලිඛිත ආර්ථික සංවර්ධන සැලැස්මක් තිබීම අවශ්‍ය යයි පසුගිය දශක දෙක ඇතුළත දේශපාලනඥයෝ හා පරිපාලකයෝ විශ්වාස කළහ. 1960 – 1965 දක්වා පැවති එක්සත් ජාතික පක්ෂ රජය හා මේ වසරේ තේරීපත්වූ නව රජයද හැරුණු විට අන් සෑම රජයක් විසින්ම සංවර්ධන සැලැස්මක් සම්පාදනය කරනු ලැබිණ. 1955 දී සම්පාදිත පළමු විධිමත් සැලැස්ම ''සය අවුරුදු ආයෝජන වැඩ සටහන'' යනුවෙන් හඳුන්වන ලදී. 1956 දී බලයටපත් මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුව සය අවුරුදු වැඩ සටහනෙහි අන්තර්ගත විෂය ප්‍රමාණයෙන් හා උපාය විධිවලින් සෑහීමට පත් නොවූයෙන් ඔවුන්ගේ ආර්ථික දර්ශනයට අතිශයින් ගැළපෙන සැලැස්මක් සකස් කිරීම ඇරඹීය. මෙම කටයුත්ත ක්‍රම සම්පාදන කාර්යාංශයට පැවරුණු අතර 1958 දී දස අවුරුදු සැලැස්ම ඉදිරිපත් කරන ලදී. විද්වත්තු එය උත්කෘෂ්ට නිර්මාණයකැයි පැසසූහ. එසේ වුවත්, මෙයද අනිකුත් සැලසුම් මෙන් ක්‍රියාත්මක කරනු නොලැබූයෙන් ඉන් ටික කලකට පසුව දෑවුරුදු ක්‍රියාත්මක කරවුම් වැඩ සටහනක් ඉදිරිපත් කරන ලදී. සැලසුම් කාර්යයෙහි මීළඟ විශාලවූත් විශාල ප්‍රචාරයක් දෙන ලද්දාවූත් අත්හදා බැලීම 1972 දී සම්පාදිත පස් අවුරුදු සැලැස්ම විය. දැඩි අපේක්ෂාවන්ගෙන් හා උනන්දුවෙන් යුතුව මෙම සැලැස්ම නිකුත් කරනු ලැබූ අතර බලගතුම ප්‍රශ්නය ලෙස සැලකෙන රැකියා වියුක්තිය ඇතුළු අනිකුත් උග්‍ර ප්‍රශ්නවලට මෙමගින් විසඳුම් ලබාගත හැකියයි බැලූ බැල්මට පෙණුනි. එකද සැලැස්මක්වත් කොටස් වශයෙන් හෝ ක්‍රියාත්මක කළ නොහැකි වූ බැවින් ඒවායේ අසාර්ථකත්වයට නොයෙකුත් හේතූන් ගෙනහැර දක්වනලදී. මූල්‍ය සම්පත් ඌණතාවය (විශේෂයෙන් විදේශ ධනය) ව්‍යාපෘතීන්හි විශාලත්වය හා ප්‍රතිඵල ලබාගැනීමට දීර්ඝ කාලයක් ගතවීම හා ක්‍රියාත්මක කිරීමට අපහසුවීමද එසේ දක්වන ලද හේතූන්ගෙන් සමහරකි.

මීට පෙර පැවති ආණ්ඩු කිහිපයක්ම සැලසුම් පිළියෙල කිරීම උදෙසා සෑහෙන කාලයක් මිඩංගු කළ අතර සංවර්ධන වැඩ එතෙක් ඇණහිටවනු ලැබිණ. 1956 දී බලයට පත්වූ මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුවට දස අවුරුදු සැලැස්ම සකස්කිරීම සඳහා අවුරුදු දෙකක් ගතවිය. එමෙන්ම 1970 දී බලයට පත් වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජයද සැලැස්මක් පිළියෙල කිරීම සඳහා දෑවුරුද්දක් ගත කළාය. ලේඛනයක් පිළියෙල කළ පමණින්ම රටෙහි ප්‍රශ්න විසඳීමට එමගින් පිටුවහලක් ලැබෙන බව හා එබඳු ලේඛනයක් නිකුත් කිරීමෙන් සියල්ල යහපත් වන බව මහජනතාවට ඒත්තු ගැන්විය හැකි යයිද සැලසුම්කරුවෝ හා පරිපාලකයෝ විශ්වාස කළහ. අද මෙන් එක්දහස් නවසිය පණස්ගණන්වල ආර්ථිකයට උග්‍ර ප්‍රශ්නවලට මුහුණ පෑමට සිදු නොවීය. රැකියා වියුක්තිය අද මෙන් හතරෙන් පංගුවකටත් වඩා අඩු වූ බැවින් සැලසුම් පිළියෙල කිරීමට කාලය මිඩංගු කිරීමට පුළුවන් තත්ත්වයක් පැවතිණි. වඩාත් නිදහස් ආර්ථිකයක් හා අයහපත් නොවූ විදේශ විනිමය තත්ත්වයක් පැවති අතර, සාපේක්ෂව බැලීමේදී බඩු මිල අඩු විය; බඩු හිඟයක්ද නොපැවතිණ. එසේ හෙයින් මහජනයා අතර නොඉවසිලිමත් ගතියක් නොවීය. අතෘප්තිය හෝ අසහනය හෝ නොවූ තරම්ය.

1972 පස් අවුරුදු සැලැස්ම සකස් කරන ලද දේශපාලනමය හා ආර්ථික පසුබිම මීට හාත්පසින්ම වෙනස්වූවකි. 1971 අප්‍රේල් මස හටගත් ත්‍රස්තවාදී අරගලය සැලැස්ම කඩිනමින් නිකුත් කිරීමට හේතුවූ එක් කරුණකි. මෙහිදී රජයට වැදගත් තීරණ කිහිපයක්ම ගැනීමට සිදුවිය. මහාචාර්ය ඩඩ්ලි සියර්ස් මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ විශේෂඥ කණ්ඩායමේ උපදෙස් මත ඉඩම් ප්‍රතිසංස්කරණ වැඩ සටහනක් ක්‍රියාත්මක කරවීම මින් එකකි. අනික නම්, පස් අවුරුදු සැලැස්ම නිකුත් කිරීම හා ඒ කෙරෙහි තැබූ විශ්වාසයයි. මෙබඳු පියවර ගැනීමට හේතු වූයේ මූලික ප්‍රශ්න විසඳීමෙහිලා සැලැස්ම උපකාරීවන බව හා ඉඩම් හිමියන්ට හා ව්‍යාපාරිකයන්ට පහරදීම හා ධනය යළි බෙදහැරීම ඉලක්ක කොටගත් ප්‍රතිපත්තීන්ගෙන් පොදු ජන සිත් දිනාගැනීමට හැකියයි රජය විශ්වාස කිරීමයි. එක්තරා දේශපාලන දෘෂ්ටියකට වහල්වූ රජයකට මෙබඳු ප්‍රතිපත්තීන්ගෙන් රැකියා නියුක්තිය, ආදයම් උත්පාදනය හා නිෂ්පාදකතාවය කෙරෙහි ඇතිවන බලපෑම් එතරම් වැදගත් යයි සිතීමට වේලාවක් නොවීය. ධනපති පන්තිය විනාශ කර සමාජවාදය කරා යොමුකළ දෘෂ්ටිවාදයක් කෙරෙහි ඔවුහු විශ්වාසය තැබූහ. දෘෂ්ටිවාදයකට වහල්වූ ප්‍රතිපත්තිවලට වඩා ජීවිතයේ මූලික අවශ්‍යතාවයන් විශේෂයෙන් ආහාරපාන හා රෙදිපිළි සපයාගැනීම ගැන මහජනතාව වැඩි උද්‍යොගයක් දැක්වූ බව වටහා ගැනීමට මොවුහු අසමත් වූහ.

1972 පස් අවුරුදු සැලැස්ම සකස් කළ අය, කලින් සම්පාදනය කර තිබූ සැලසුම්වලට අත්වූ ඉරණම මෙනෙහි කළ බවක් නොපෙනේ. මේවා හැමෙකක්ම අසාර්ථකවීමට හේතුවූයේ, මෙම සැලසුම් ප්‍රබල අපේක්ෂාවන්ගෙන් යුතු එසේම එකක් නොමැතිව අනිකක් ක්‍රියාත්මක කළ නොහැකි දැවැන්ත ව්‍යාපෘතීන් ගණනාවකින් යුතුවීම හා ඒවා කෙසේ ක්‍රියාත්මක කළ යුතුදැයි ප්‍රමාණවත් ලෙස සඳහන් කර නොතිබීමය. එපමණක්ද නොව යෝජනා ක්‍රියාත්මක කරවන අවධියේදී ව්‍යාපෘති සඳහා වෙන්කල මූල්‍ය සම්පත්, අයහපත් ගෙවුම් ශේෂ තත්ත්වය හේතුකොටගෙන නොලැබී ගියේය. ඇත්ත වශයෙන්ම ඊට පෙර වූ සැලසුම් අසාර්ථක වූයේ කවර හේතුවක් නිසාද යන්න 1972 හි ක්‍රම සම්පාදකයන් විසින් අධ්‍යයනය කළ යුතුව තිබිණි. ඔවුන් විසින් මුලින්ම කළ යුතුව තිබුණේ අනාගතය දෙස බලා අපනයනයන්ගෙන් හා වෙනත් මූලාශ්‍රවලින් උපයාගත හැකි සම්පත් කවරේදැයි නිවැරදිව ප්‍රක්ෂේපනය කිරීමයි.

ක්‍රම සම්පාදන ව්‍යායාමයේ ඉතාමත්ම වැදගත් කොටස නම්, මූල්‍ය සම්පත් පිළිබඳ තාත්වික තක්සේරුවක් කිරීම හා තමන් බලාපොරොත්තු තබා ඇති ප්‍රමාණයට වඩා අඩු ඉපයුමක් ලැබේය යන පදනම මත ප්‍රක්ෂේපන පිළියෙල කිරීමද වේ. අවම මූලාශ්‍ර ප්‍රමාණයක් ලබාගත හැකිය යන අභ්‍යුපගමය මත සාමාන්‍ය පරිමාණයේ වැඩ සටහනක් ඔවුන් විසින් සකස්කළ යුතුව තිබිණි. පස් අවුරුදු සැලැස්මේ අසාර්ථකත්වයට හේතු වශයෙන් දක්වනු ලැබූයේ, ඔපෙක් (තෙල් නිපදවන හා අපනයනය කරන) රටවල් තෙල් මිල ඉහළ නැංවීම හා අනතුරුව ප්‍රධාන වශයෙන් එළදාව නිසරු වීම නිසා ආහාර හිඟවීම හා ආහාර මිල ඉහලයාමද හේතු කොට ගෙන ඇතිවූ ලෝක ආර්ථික අර්බුදයට පසුව හටගත් විදේශ විනිමය දුෂ්කරතාවයන්ය.

බහුතර ජනතාව ක්‍රියාශීලී ලෙස සහභාගි නොවන්නාවූ සැලැස්මකට ඔවුන්ගේ ආධාරය ලබාගැනීම හෝ තරුණයන්ගේ විශ්වාසය දිනාගැනීම හෝ කළහැකි නොවේ. 1972 පස් අවුරුදු සැලැස්ම මහජනයා පිළිවිසීමෙන් සකස් කරන ලදැයි පැවසුණද එය සත්‍යයෙන් තොරය. සැලැස්ම සකස් කරනු ලැබූයේ සෑහෙන දුෂ්කරතාවලින් ගහණ වූ සමයකදීය. 1971 හි ත්‍රස්තවාදී අරගල හේතුකොටගෙන පාලන තන්ත්‍රය හා තරුණයන් අතර සැලකිය යුතු පරතරයක් පැන නැඟී තිබුණ අතර, මහජනතාව හා පාර්ලිමේන්තුවේ ඔවුන්ගේ නියෝජිතයන්ද අතර පැවති සෑම සංනිවේදන මාර්ගයක්ම මුළුමනින්ම පාහේ බිඳීගොස් තිබුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ව්‍යාපෘති ගණනාවක්ම සංයෝගකර, වර්ධන අනුපාතය, ප්‍රතිශීර්ෂ ආදයම, ඇති කළ හැකි නව රැකියා නියුක්තියේ වාර්ෂික මට්ටම් බඳු වූ මූලික විචල්‍යයන් මූලික පරමාර්ථයන් ලෙස දැක්වීම හැර ක්‍රම සම්පාදකයන්ට කළ හැකිවූ වෙනත් කාර්යයක් නොවීය. සංවර්ධනය වන්නාවූ රටක එළදායී සැලසුම් කිරීමට පදනම් විය යුත්තේ උපයෝගීතාවාදයට අනුකූල වූ කරුණුය. ග්‍රාමීය අංශය වඩාත් ප්‍රබලවූ මෙන්ම, බහුතර ජනකාය අයත්වන ග්‍රාමීය අංශයක් පවත්නා ශ්‍රී ලංකාව බඳු රටක මෙය වඩාත් වැදගත් වන බව

සැලකිය හැකිය. වඩාත් ප්‍රබල කාර්මික ජනගහණයක් ඇති වෙනත් අර්ථ ක්‍රම පවතින රටවල් සම්බන්ධයෙන් පිළිගත් ක්‍රම සම්පාදන විධි වඩා ගැලපෙන්නේ, ඒවා කාර්මික කටයුතු හා සම්බන්ධවන බැවින් හා එබඳු රාමුවක් ඇතුළත, ක්‍රම සම්පාදනයෙහිලා රජයේ බලපෑම හා නිලධාරි සහභාගිත්වය බාධාවක් වශයෙන් නොපවතින බැවින්ය.

අතීතයේදී විදේශාධාර හා තාක්ෂණය කෙරෙහි දැඩි විශ්වාසයක් ඇතිව නවීන නාගරික අංශයේ වර්ධනය අනුව සංවර්ධන උපාය ක්‍රම යොදාගැනීම බොහෝදුරට අනුගමනය කරන ලද පිළිවෙත විය. එකල ඵල නෙලා ගැනීමට දීර්ඝ කාලයක් ගතවන විශාල ව්‍යාපෘති ලෙස සංවර්ධනය සැලසුම් කරන ලද අතර, මෙයින් ගැමි ආර්ථික යට කිසිදු බලපෑමක් ඇති නොවීය. ග්‍රාමීය ආර්ථිකයට වාසි ගෙන දුන් ගංගා නිම්න හා වාරිමාර්ග යෝජනා ක්‍රම පමණක් මේ ගණයට අයත් නොවන බව පැවසිය යුතුය. රාජ්‍ය සංස්ථා පිහිටුවීම යථෝක්ත වර්ගයට අයත් සංවර්ධනයෙහිලා යොදගත් උපක්‍රමයකි. අඩු නිෂ්පාදනය, අකාර්යක්ෂමතාවය, දූෂණය හා නාස්තිය සම්බන්ධ යෙන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය සංස්ථා හා සමකළ හැකි තවත් ඒවා නැත.

ජනගහණයෙන් හතරෙන් තුන් කොටසකට වැඩි ප්‍රමාණයක් ගම්වල වෙසෙන ශ්‍රී ලංකාවේ, සැලැස්මක් මගින් ගැමි ජනතාවගේ අවශ්‍යතා හා අභිලාෂයන්ට සෑහෙන වැදගත් තැනක් හිමිවිය යුතුය. හැබෑ මහජන සහභාගිත්වයක් ඇතිවිය හැක්කේ මෙම කාර්යාවලිය තුලින් පමණි. සාමාන්‍යයෙන් නිලධාරීන් හා ගැමි ජනතාව අතර පවතින සංනිවේදන මාර්ග ඉතා දුර්වල ඒවා වන අතර, නාගරික ජනතාව හා කාර්මික ජන කොට්ඨාශ කෙරෙහි ස්වභාව යෙන්ම හටගත් පක්ෂපාතිත්වයක් නිලධාරීන් තුළ පවතී. නගරය මූලස්ථාන කොටගත් නිලධාරීන්ට ජනතාවගේ අභිලාෂයන් හා ඔවුන්ගේ අවශ්‍යතාවයන් ගැන හැඟීමක් නැතිවාක් මෙන්ම ඊට ප්‍රතිචාර දැක්වීමට ඔවුන්ට හැකියාවක් නොමැති බැවින් ගැමියන්ගේ ගැටළු නිරාකරණය කිරීමට හැකි හොඳම මාර්ගය සලසා දිය හැකි තත්ත්වයක ඔවුහු පසු නොවෙති. මීට පෙර වූ සෑම සැලැස්මකම සංවර්ධන කාර්යාවලියට ගැමි ජනතාවගේ ක්‍රියාශීලී සහභාගිත්වය ලබාගන්නා උපාය ක්‍රම දක්නට නොලැබිණි. මින් බොහොමයක ගැමි අංශය පිළිබඳව කිසිදු සඳහනක් පවා කර නැති අතර, ගම්වල සමාජ–ආර්ථික තත්ත්වයන් විග්‍රහ කිරීමට පවා කිසිදු ප්‍රයත්නයක් දරා නැත.

නව සංවර්ධන උපාය ක්‍රම ආරම්භ කළ යුත්තේ, ගැමි ජනතාව ගේ අභිලාෂයන් හා අවශ්‍යතාවන් ගැන හොඳ අවබෝධයක් ඇතිවය. ශ්‍රී ලංකාව බටහිරින් උපුටාගත් මධ්‍යගත ක්‍රමසම්පාදන වර්ගවලින් ගැමි ජනතාවගේ ගැටළු නිරාකරණය කිරීම හෝ ඔවුන්ගේ අවශ්‍යතාවන් සපුරාලීම හෝ කළ නොහැක. එසේ කළ හැක්කේ, විචිත්‍ර වූත්, විශාල වූත් ව්‍යාපෘතීන් සමඟ ගම් මට්ටමේ කුඩා පරිමාණයේ සැලසුම් රාශියක් කැටි කරගත් ප්‍රධාන සැලැස්ම කින් පමණකි. නාගරික ක්‍රම සම්පාදකයන්ට වැය කළ හැකි කාල සීමාව ඇතුලත ගතානුගතික ක්‍රම සම්පාදන ක්‍රමය යටතේ මෙම කාර්යය මුදුන්පත් කරගත නොහැක. සැලසුම් පිළියෙල කිරීමට පෙර ගමක් හෝ ගම් සමූහයක් ආශ්‍රිතව සමීක්ෂණ හා අධ්‍යයනයන් ගණනාවක්ම පැවැත්විය යුතු බැවින් ඒ සඳහා සෑහෙන කාලයක් අවශ්‍ය වනු ඇත. යෝජනා ක්‍රම සකස් කරනු ලබන අතරම ගැමි මට්ටමෙහිදී වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට පියවර නොගන්නේ නම්, අවුරුදු 5 ක් හෝ 6 ක් බලයේ සිටින රජයකට මෙබඳු සැලැස් මක් සකස් කළ හැකි නොවේ. ජාතික මට්ටමින් මධ්‍යගත ක්‍රම සම්පාදනය වැදගත් ලෙස සලකනු ලැබේ නම්, එහි පරමාර්ථය විය යුත්තේ නිර්මාණය කරනු ලබන නව සමාජය පිළිබඳ පළල් අවශ්‍යතාවන් ගැන අවබෝධයකින් කටයුතු කොට ගම්වලට අවශ්‍ය මූල්‍ය හා ශිල්පීය ආධාර සලසාදීමය. මූල්‍ය සම්පත් ඒකරාශි කිරීමේදී හා මුදල් වෙන් කිරීමේදී, පළමුව අරමුදල් මධ්‍යගත කර ඉන්පසු ප්‍රාදේශීය වියදම් අරබයා අරමුදල් විමධ්‍යගත කිරීමේ සම්මත ක්‍රමය වෙනුවට ප්‍රාදේශීය උත්පාදිත අරමුදල් එහිදී වැය කළ හැකිවන පරිදි ලිහිල් ක්‍රමයක් ඇති කළ යුතුය.

වත්මන් රජය විරාගත ක්‍රමය අනුව සැලැස්මක් සකස්කිරීම උදෙසා දීර්ඝ කාලයක් මිඩංගු නොකරනු ඇත. එසේ කළහොත් ඒ සඳහා නොඅනුමානවම අවුරුද්දක් හෝ ඊටත් වැඩි කාලයක් වැය කළ යුතු වන අතර, සැලැස්ම සූදානම් වනතෙක් සියල්ලන්ම කිසිදු කටයුත්තක නොයෙදීමට තීරණය කිරීමේ බියද පවතී. සාම්ප්‍රදායික සැලැස්ම මූලික වශයෙන් යෝධ ව්‍යාපෘතීන් පිළිබඳව සකස් කොට ඇති එකක් වන බැවින්, මුළු ප්‍රදේශය පුරා බලපාන සැලසුම් සහිතව රැකියා නියුක්තිය ඇති කළ හැකි ග්‍රාමීය මට්ටමේ කුඩා ව්‍යාපෘති කෙරෙහි සැලකිය යුතු අවධානයක් යොමු කිරීම අපහසු වන්නේය. රජය විසින් ළඟදී හඳුන්වා දීමට යෝජනා කර ඇති දිස්ත්‍රික් මට්ටමේ විමධ්‍යගත පරිපාලනය ශීඝ්‍ර ග්‍රාමීය සංවර්ධනය උදෙසා අවශ්‍ය මූලික පරිපාලනමය පූර්ව අවශ්‍යතාවයයි. ඇමතිවරයෙකු යටතේ දිස්ත්‍රික් මට්ටමේ සංවිධානයක් මගින් මෙහෙයවනු ලබන විමධ්‍යගත ක්‍රම සම්පාදන යන්ත්‍රණයක් තුලින් විශිෂ්ඨතම ප්‍රතිඵල ලබාගත හැකි බව ප්‍රථම වරට රජය පිළිගෙන ඇත.

මේ දක්වා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේදී ගම සමග සම්බන්ධතා පවත්වනු ලැබුයේ, පරිපාලනාත්මක තත්ත්වයක කටයුතු කළ හෝ කෘෂිකාර්මික හා ගැමි කර්මාන්ත ඵලද වර්ධනය කර ගැනීමට විශේෂඥ සේවා සැලසූ ව්‍යාප්ති නිලධාරීන්, වගා නිලධාරීන්, අත්කම් උපදේශකවරු, ප්‍රාදේශීය ආදායම් නිලධාරීන් බඳු වූ රජයේ නිලධාරීන් මගිනි. පරිපාලනමය රාමුවේ බරපතල අඩු ලුහුඬුකම් හේතුකොටගෙන මෙම නිලධාරීහු කිසිවිටෙක ගැමි ජනතාව වෙතට නොගියහ. කෘෂිකාර්මික සංවර්ධනයෙහි ලා වැදගත් කාර්යභාරයක් ඉටු කළ යුතු ව්‍යාප්ති නිලධාරීන් බඳුවූ ඇතැම් නිලධාරීන් ගම්වලට නොගිය බැව් සමීක්ෂණවලින් හෙළි වී ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් කෘෂිකාර්මික සංවර්ධනයට ඔවුන්ගෙන් සිදුවී ඇත්තේ අවම සේවයකි.

මෙමගින් යෝජනාකර ඇති ක්‍රමසම්පාදන සංවිධානයෙහි නිලධාරීන්ගේ හා විශේෂඥයන්ගේ කාර්යය වනුයේ ගමෙන්ම තෝරාගත් උගත් ගැමියන් පුහුණු කරවීමය. එවිට ඔවුන්ට ගැමි මට්ටමෙහිදී කණ්ඩායම් සමඟ සම්බන්ධතාවයෙන් කටයුතු කළ හැකිය. ඔවුන් දම නිලධාරීන් හෝ සංදම නිලධාරීන් (Chain officers or link cadres) යනුවෙන් හැඳින්විය හැකිය. ගම් 20,000 ක් පමණ ඇතැයි අනුමාන කළහොත්, එක් ගමකට සංදම නිලධාරීන් පස් දෙනෙකු බැගින් අවශ්‍ය වන බැවින් එමගින් පමණක් රැකියා 1,00,000 ක් ඇතිකළ හැකිවේ. ගැමි ජනයා වෙනස් වූ සංස්කෘතික, සමාජීය හා භාෂාමය පසුබිමක් ඇත්තාවූද සිය සමාජයට පිටස්තරවූද අයට වඩා, ඔවුන් දන්නා හඳුනන, ගමෙහිම වාසය කරන ඔවුන්ගේම අයකු සමඟ කිට්ටුවෙන් වැඩ කිරීමට වඩා මනාපයක් දක්වනු ඇත. පුහුණු කළ මෙම නිලධාරීන් ගමත්, පාලන තන්ත්‍රයේ උසස් පෙළේ නිලධාරීනුත් අතර පවතින වැදගත් පුරුක වනු ඇත. පුහුණු කළ නිලධාරීන්, ගැමි මට්ටමේ යෝජනා ක්‍රම වලට අවශ්‍ය ශිල්පීය ආධාර සලසාදීම හා ප්‍රගතිය අවලෝකනය කිරීමෙහිද යෙදෙනු ඇත. කෘෂිකාර්මික පුහුණුවක් ලද නිලධාරීන් ඇතැම් ගම්වලට අවශ්‍ය වන අතර, තවත් ගම්වලට ප්‍රවාහණය, ඛණිජ උපයෝජනය ආදී වූ ක්ෂේත්‍ර පිළිබඳ පුහුණුව ලැබූවන් අවශ්‍ය වනු ඇත.

ග්‍රාමීය මට්ටමෙහි වඩාත් යෝග්‍ය වූ පළාත් පාලනයට අනුබද්ධ වූ සංවර්ධන ආයතනයක් සකස් කළ යුතු අතර මේ සඳහා දැනට පවතින පළාත් පාලන ක්‍රමය සංස්කරණය කළ යුතුවේ. මුළු ගමම සංවර්ධනයෙහි සහභාගිවන්නේ නම් ගම්වාසීන් රැස්වී නිලධරයන් තෝරා පත්කළ යුතුය. යෝජිත ක්‍රමය අනුව ගමේ සියලු දෙනාම රැස්වී සභාපතිවරයකු තෝරා පත්කරන අතර, ඔහු ගමෙහි ප්‍රධාන පරිපාලන නිලධාරි හා සංවර්ධන බලධරයාද වනු ඇත. කොට්ඨාශ පදනම්ව නියෝජිතයන් පත් නොකරනු ලබන අතර ග්‍රාමීය කමිටුව මගින් නියෝජනය කෙරෙනුයේ වෙන් වෙන් කොට්ඨාශ නොව මුළු ගමමය. ගම් සභාවේ කාර්ය වනුයේ, සංඛිත ග්‍රාමීය කණ්ඩායම්වල සහභාගිත්වයෙන් අලුත් යෝජනා ක්‍රම ගැන සිතා බැලීම, සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා අගැයුම් කිරීමත්ය. සංදම නිලධාරීන් මෙම කාර්යාවලියේ උත්ප්‍රේරක බලය වශයෙන් කටයුතු කරන අතර, යෝග්‍ය දැනුම මිනුම, සම්පත් හා ප්‍රවෘත්ති සම්ප්‍රේෂණය කිරීම සඳහා ගැමි ජනතාව හා ගමෙන් පරිබාහිර වූ විශේෂඥයන්ද අතර දෙපැති සංදමයක් වශයෙන් කටයුතු කරනු ඇත.

දිස්ත්‍රික් මට්ටමෙහි සංවර්ධන ව්‍යායාමයේ සාමූහික සමායෝජනය අධීක්ෂණය කරනු ලබන්නේ දිස්ත්‍රික්කය ඇතුලත ඡන්ද කොට්ඨාශ කිහිපයක්ද පාලනය කරන්නාවූ දිස්ත්‍රික්ක ඇමතිවරයා විසිනි. ඡන්ද කොට්ඨාශ හා ගම්වල අවශ්‍යතාවන් සපුරාලීමට අවශ්‍ය අංගෝපාංගයන්ගෙන් සමන්විත කාර්යාංශයක් ඔහුට ලැබෙනු ඇත. දිස්ත්‍රික් ඇමතිවරයාගේ සභාව, දිස්ත්‍රික්කය තුළ ඡන්ද කොට්ඨාශවල මන්ත්‍රීන්ගෙන් සමන්විත වනු ඇත. මෙම සභාවට පහළින්, සෑම ගම් සභාවකින්ම තෝරා පත්කරගත් සභාපතිවරුන්ගෙන් සැදුම්ලත් ඡන්ද කොට්ඨාශ සභාවක් ඇත. ඡන්ද කොට්ඨාශ සභාවේ සභාපතිත්වය දරනුයේ ඡන්ද කොට්ඨාශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාය. සංවර්ධන සැලසුම් කිරීමෙහි දිස්ත්‍රික් ඇමතිවරයා යටතේ පවත්නා දිසා සභාවේ කාර්යය වනුයේ ග්‍රාමීය මට්ටමෙහිදී ඡන්ද කොට්ඨාශයත් විශේෂ කාර්ය ක්ෂේත්‍ර හා අදල රජයේ දෙපාර්තමේන්තු හා අදල කැබිනට් ඇමතිවරු ඇතුලුව රටෙහි උසස් පාලන යන්ත්‍රයත් අතර සම්බන්ධතාවය ඇතිකරලීමය.

මෙම රාමුව ඇතුලත අතිශයින්ම වැදගත් ඒකකය වනුයේ ගම් සභාවයි. නව රැකියා ඇති කිරීමේ කාර්යයන් ඉටුවිය යුත්තේ ගම් සභාව මගිනි. සැලසුම් කිරීම, තීරණ ගැනීම හා ඒවා ක්‍රියාත්මක කිරීම පිළිබඳ ස්වතන්ත්‍රතාවය එයට තිබිය යුතුය. සමූපකාර, තරුණ සමාජ හා ගොවි සංවිධාන බඳුවූ විශේෂ අරමුණු පෙරදැරි කොටගත් ග්‍රාමීය සංවිධාන මගින් ගම් සභාව කටයුතු ආරම්භ කළ යුතුය. විශේෂඥ නිලධාරීන්ද අනුයුක්ත කර ඇති ගම් සභාවේ පළමු කාර්යය විය යුත්තේ, ඒ ඒ ගමෙහි සම්පත් පිළිබඳ සමීක්ෂණයක් පැවැත්වීමය. මෙය කාර්යක්ෂම අන්දමින් ඉටු කිරීමට නම් පිටස්තර විශේෂඥයන්ගේ සහායද ඔවුන්ට ලබා ගැනීමට සිදුවනු ඇත. අතිශය බහුල සම්පත් කවරේදැයි නිර්ණය කරගැනීම පමණක් නොව පහසුවෙන් අලෙවි කළ හැකි භාණ්ඩ හා සේවා නිපැයුම සඳහා සහ සාර්ථක කර්මාන්තවල න්‍යෂ්ටිය වශයෙන් යොදගත හැකි සම්පත් සොයාගැනීමද සම්පත් සමීක්ෂණයේ අරමුණ විය යුතුය.

අතිරික්ත ශ්‍රමය ගම් බොහොමයක අතිබහුල සම්පත වන බැවින් ව්‍යාපෘතිවල මිනිස් බල අවශෝෂණ ධාරිතාව පිළිබඳව සැලකිල්ල දක්විය යුතුය. මෙම තත්ත්වය වෙනස්වන අවස්ථාද ඇත. උදහරණ වශයෙන් වටාපිටාවේ පිහිටි වතුවල ප්‍රමාණවත් රැකියා ලබාගත හැකි උඩරට වතුකරයේ ගම්මාන ගෙන හැර දක්විය හැකිය. වියළි කලාපයේ වැඩි කොටසක මීට හාත්පසින්ම වෙනස් වූ තත්ත්වයක් දක්නට ඇති අතර මේවා වෙනුවෙන් ශ්‍රම ප්‍රකර්ෂ (සේවකයින් වැඩි ප්‍රමාණයක් යොදගත හැකි) යෝජනා ක්‍රම සම්පාදනය කළ යුතුය. ආයෝජන සැලසුම් කිරීමේදී ඉතාමත් වැදගත් වනුයේ මූලික පාරිභෝගික අවශ්‍යතාවයන් පිරිමසාලන සාපේක්ෂක සරල ව්‍යාපෘති පිළිබඳව කල්පනා කිරීමය. මෙයින් අදහස් වනුයේ ගමෙහිම හෝ තදසන්න නගරවල පහසුවෙන් විකුණා ගත හැකි පළතුරු, එළවළු හෝ වෙනත් ආහාර වර්ග වගාකිරීම වැනිවූ ප්‍රාථමික කටයුතු කෙරෙහි ආරම්භක කටයුතු යොමුකරවීමය. එළවළු හා පලතුරු නියත ඉල්ලුමක් මෙන්ම අධික ඉපැයුමක්ද ඇති භාණ්ඩවන බැවින් නගරාසන්න ගම්වල මෙබඳු වගා සඳහා හොඳ අනාගතයක් ඇත. මේ සඳහා අවශ්‍ය වනුයේ සුළු ප්‍රාග්ධනයකි. එමෙන්ම, වී හා වෙනත් දිගුකාලීන වගාවන් මෙන් එක් සමයකට පමණක් සීමා නොවන බැවින් මේවා අවුරුද්ද මුළුල්ලේම වගාකළ හැකිවන හෙයින් ගැමි පවුල්වලට ජීවනෝපායද එමගින් සැලසේ. සංවර්ධන සැලසුම් කිරීමෙහි දක්නට ඇති ගැටළුවක් නම්, කඩිනම් නියත ප්‍රතිඵල ලබාගත හැකි සරල යෝජනා ක්‍රම සැලකිල්ලට නොගෙන, දැවැන්ත ව්‍යාපෘති පිළිබඳව කල්පනා කිරීමය.

සම්පත් සමීක්ෂණය සම්පූර්ණ කළාට පසුව, ගම් සභාවේ කාර්යය විය යුත්තේ ගැමි අවශ්‍යතා, අභිලාෂ, ගමෙන් ලබාගත හැකි යෙදවුම් ප්‍රමාණය, ඵල නෙලා ගැනීමට ගතවන කාලය හා දිස්ත්‍රික්කයේ ආදයම් ශීඝ්‍රයෙන් නැංවීම සඳහා ගැමියන් විසින් කළ හැකි සේවය යන කරුණු අනුසාරයෙන් ව්‍යාපෘති සාකච්ඡාවට භාජන කිරීමය. ව්‍යාපෘතියක් ප්‍රමාණවත් ලෙස ක්‍රමවත්ව සකස්කරනු ලැබූවාට පසුව කළ යුතු කාර්යය නම් එය වහා ක්‍රියාත්මක කරවීමට හා බැහැරින් ලබාගත යුතුවන ද්‍රව්‍ය යෙදවුම් හා උපකරණ ප්‍රමාදයකින් තොරව ලබාගැනීමට හැකි සංවිධානයක් පිහිටුවා ගැනීමයි. කිසියම් ව්‍යාපෘතියක් තරහ කොට ලබාගත යුතු සම්පත්වලට බරක් වන්නේ නම් පලමුවෙන්ම දිස්ත්‍රික් ඇමතිවරයා හා ඔහුගේ නිලධාරීන් විසින් ඊට අනුමැතිය ලබාදිය යුතුවන හෙයින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම ඉතා දුෂ්කර කටයුත්ත ලෙස සැලකිය හැකිය.

සියළුම ව්‍යාපෘතීන් සඳහා මුදල් යෙදවීමට ප්‍රමාණවත් මූලාශ්‍ර නොමැති නම්, සෑම ව්‍යාපෘතියක් සඳහාම මුදල් ආධාර ලබා ගැනීමේදී දුෂ්කරතාවලට මුහුණපෑමට සිදුවනු ඇත. දැන් පවත්නා තත්ත්වය අනුව, දිස්ත්‍රික් සංවර්ධන වැඩ සටහන මගින් සෑම ගමකටම අඩු වශයෙන් ව්‍යාපෘතීන් දෙකක් සඳහා වත් සම්පත් සැපයිය යුතු අතර, ගම් 20,000 ගණනක ව්‍යාපෘතීන් 40,000 ක් පමණ එක්වර දියත් කළ යුතුවන බව මෙයින් අදහස් වේ. සෑම ව්‍යාපෘතියක් මගින් කෙලින්ම හෝ අනියම් වශයෙන් 10 දෙනෙකුට රැකියා සැපයේ නම් (මෙය සාමාන්‍ය ඇස්තමේන්තුවකි) මෙමගින් 400,000 දෙනෙකුට රැකියා සැපයිය හැකිය. තෝරාගන්නා ලද ව්‍යාපෘති එතරම් වියදම් අධික ඒවා නොවේ නම්, ප්‍රාග්ධන සම්පත් හා උපකරණ පහසුවෙන් ලබාගත හැකිවේ. එබැවින් එමගින් මධ්‍යගත අය වැයට වැඩි බරක් දැරීමට සිදුනොවේ. එමෙන්ම අනික් අතට, මධ්‍යගත අයවැය මගින් සම්පත් සැපයිය නොහැකි නම් ග්‍රාමීය මට්ටමේ සංවර්ධන ව්‍යායාමයනට වෙනත් මූලාශ්‍රයන්ගෙන් මූල්‍යාධාර ලබාගැනීමට සිදුවනු ඇත.

වැවිලි හා පෞද්ගලික අංශයේ සංවිධාන වල සේවය අවශ්‍යවන අවස්ථාවකි මෙය. මුදල් දීමනා ආකාරයෙන් හෝ දිස්ත්‍රික්කයේ සාර්ථක ව්‍යවසායයන්ගෙන් බද්දක් අයකර ගැනීමෙන් හෝ ආධාර උපයාගත හැකිය. පෞද්ගලික හෝ රජය සතු මහා පරිමාණ කර්මාන්තවලින් මෙය ලබාගත හැකිය. ප්‍රදේශයේ ව්‍යවසායයන්ගෙන් හෝ සලසන සේවාවලින් බදු අයකර ගැනීම සඳහා ග්‍රාමීය බලමණ්ඩලවලට අධිකාර බලය තිබිය යුතු අතර මෙම අරමුදල් මධ්‍යගත අයවැයෙන් ලබාගැනීම අවශ්‍ය නොවේ. තදසන්න කර්මාන්ත හෝ ව්‍යාපාර ආයතනයන්ගෙන් උපකරණ ලබාගැනීම හෝ ඒවායෙහිදී උපකරන නිමවා ගැනීමටද ග්‍රාමීය සංවිධානවලට ඉඩකඩ ඇත. යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරවීමේ කාර්යය මුළු ගමටම පැවරිය නොහැකි හෙයින්, ඒවා ක්‍රියාත්මක කරවීමේ හා දෛනික කළමනාකරණ කටයුතු ගමෙහි නිපුණත්වයෙන් යුතු අයට පැවරිය හැකිය. මෙම කාර්යය සඳහා හැකියාවන් ඇති හා නිපුණත්වයෙන් යුතු හොඳම අය මහජනයා විසින් ඔවුන් අතුරෙන් තෝරාගත යුතු අතර රැකියා විරහිත උගත් ගැමියන් බොහෝ දෙනෙකු සිටින බැවින් මෙය එතරම් දුෂ්කර කාර්යයක් නොවනු ඇත.

ගමට පුනර්ජීවනයක් ලබාදීම හා මිනිස් බලය නගර කරා ඇදීයාම වැලැක්වීමේ සාර්ථකම මාර්ගය නම්, ග්‍රාමීය මට්ටමේ සංවර්ධනයයි. රැකියා නොමැති අයට ඔවුන්ගේම ගම්වලදී රැකියා ලබාදී, ගැමි ආදයම නංවාලීමේ කඩිනම් ක්‍රමයද මෙයයි. උත්කෘෂ්ට අභිලාශයන් සහිත ගැමි තරුණයන්ට නගරබද කර්මාන්තයක හෝ මධ්‍යගත පරිපාලනයෙහි හෝ රැකියාවක නියුතුවීමෙන් ලබාගත නොහැකි නායකත්වයකුත්, වගකීම පිළිබඳව හා මෙහෙයවීම පිළිබඳව හැඟීමකුත් ලබාගැනීමට එයින් ඉඩ ප්‍රස්ථාව සැලසෙනු ඇත.

VIDUS 2-4-4

රාජ්‍ය මුදල් ප්‍රතිපත්තිය – ප්‍රශ්න හා ප්‍රාර්ථනා

එච්. ඇම්. ආර්. ඇල්ලෙපොල

ජ්‍යෙෂ්ඨ අර්ථ ශාස්ත්‍රඥ, ශ්‍රී ලංකා මහ බැංකුව

''රජය'' යන පැරණි තේරුම අනුව, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය රැකීම, යුක්තිය පසිඳලීම හා සෞඛ්‍යාරක්ෂක කටයුතු වැනි පොදු සේවා සැපයීම සඳහා අවශ්‍ය බදු රැස්කිරීමේ කාර්ය පැවරී ඇත්තේ යයිද, රටේ නිෂ්පාදනය තනි පුද්ගලයන් අතේ තිබීම අක්‍රමික හා අයතුවුදුයක යයිද සලකන ලද රාජ්‍යයක්ව පැවති ශ්‍රී ලංකාව පසුගිය දශක තුන ඇතුලතදී සැහෙන පමණ එම තත්ත්වයෙන් ඈත්වී ඇත. අද සියළුම දේශපාලන මතිමතාන්තර අනුව බැලුවත් ''රාජ්‍යය'' සතු කාර්ය හාර්ය ඉතා පළල් ක්ෂේත්‍රයකට අයත් වන්නේය.

මීට හේතුවූ කරුණු රාශියක් ඇතත් ප්‍රධාන බලපෑම් දෙකක් ඇත්තේය. පසුගිය මහා යුද්ධයෙන් පසුව අතිශයින් ජනප්‍රිය වූ කේන්ස්ගේ ආර්ථික න්‍යාය අනුව රාජ්‍යය සතු කාර්ය හාරය පළල් වීම යුක්ති සහගත යයි දක්වීමට උත්සාහයක් දරා ඇත. කේන්ස්ගේ මේ ආර්ථික පිළියම ඉදිරිපත් කරන ලද්දේ ලොව දරුණු ආර්ථික අවපාතනයකට හාජනය වූ, ප්‍රමාණවත් ද්‍රවශීලතාවයකින් පණ ගැන්විය හැකිවූ අර්ථ ක්‍රම සඳහාය. එසේවුවද, කේන්ස්වාදය අනුගමනය කළ හෝ ඉන් ආභාෂය ලැබූ ප්‍රතිපත්ති සැලසුම් කළ අය සෑම වර්ගයකටම අයත් අර්ථ ක්‍රම සඳහා රාජ්‍ය වැය යොදා ගැනීමට කේන්ස්වාදයෙන් ඉඩ ලැබී ඇතැයි සිතූහ.

දෙවනුව රජයට ආර්ථික කළමනාකරණය පිළිබඳ වඩා දැඩි වගකීමක් පවරන සමාජවාදයට නැඹුරුවූ සංකල්පය අනුවද, ආර්ථික කටයුතුවල පළල් වශයෙන් රජය මැදිහත්වීම යුක්ති සහගත ලෙස සැලකිණ. මෙම ආකාරයෙන් සිතීම හේතුකොට ගෙන රජයේ අනුග්‍රහය සහිත ආර්ථික සංවර්ධනයට හා ශුභසාධනයට අදාළ ප්‍රතිපත්ති ගණනාවක්ම සකස්කිරීමට අනුබලයක් ලැබුණේය. මෙහි බලපෑම කොතෙක්ද කිවහොත් මෑත අවුරුදුවලදී ශ්‍රී ලංකාවේ ශුභසාධනය සඳහා වැයකළ මුදල සංවර්ධනය උදෙසා යෙදවූ මුදලට බොහෝ දුරට සමාන විය.

දේශපාලන දර්ශනයේ මෙම ආකල්ප කරණකොටගෙන, නිෂ්පාදන හා බෙදහැරීම කටයුතු ඇතුළු ආර්ථිකයේ සෑම මට්ටමකම කටයුතුවලට රජය කෙලින්ම මැදිහත්වී වඩාත් පුළුල්වූ කාර්යහාරයක් ඉටුකිරීමට සිදුවූ බව ප්‍රකට කරුණකි. එමනිසා සමස්ත ආර්ථික ප්‍රතිපත්තියේම අංගයක් වශයෙන් රාජ්‍ය මුදල් ප්‍රතිපත්තියේ කාර්යහාරය තක්සේරු කළ යුත්තේ වඩාත් පෘථුල රාමුවක් තුළය. මෙය හුදෙක් අයවැයෙහි ආදායම් හා වියදම් තුලනය කිරීමට සීමාවූ ව්‍යායාමයක් ලෙස තවදුරටත් නොසැලකිය හැකිය. නිෂ්පාදනය, බෙදහැරීම හා ස්ථාවර ආර්ථිකයක් ඇතිකිරීමේ වඩාත් පෘථුල අරමුණු ඉෂ්ඨ කරගැනීමෙහිලා අර්ථ ක්‍රමයක් කරා මඟ පෙන්වන හා මෙහෙයවන ප්‍රතිපත්ති ප්‍රකාශනයක් වශයෙන් රාජ්‍ය මුදල් ප්‍රතිපත්තිය විමසා බැලිය යුතුය.

එහෙත් රාජ්‍ය මුදල් ප්‍රතිපත්තියේ මූලික උපකරණය වන අය-වැය වූ කලී නියමිත අවධියක් සඳහා සැලසුම්කොට ඇති ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශනයකි. ආදායම් හා වියදම් ප්‍රකාශනයක් වශයෙන් පවතින අය-වැය, නීතියට අනුකූලව, විසර්ජනය හා වියදම් පාලනය සඳහා යොදාගන්නා පදනම වෙයි. මුදල් වියදම් කරන දෙපාර්තමේන්තු වාර්ෂික විසර්ජන පනතේ නියම කර ඇති සීමා හා උපදෙස් අනුගමනය කිරීමට බැඳී ඇත. ඒවා උල්ලංඝනය කළහොත් ජාතික රාජ්‍ය සභාව මගින් පත්කර ඇති රාජ්‍ය ගිණුම් කමිටුවට වගකිව යුතුය. වියදම් හා ආදායම්වල ප්‍රමාණය හා අරමුණු නියම කිරීමෙන් ආර්ථික සංවර්ධනය, ඉතිරි කිරීමට අනුබල දීම, ආදායම් ප්‍රතිව්‍යාප්තිකරණය හා ආර්ථික කටයුතු ස්ථාවරකරණය ද ඇතුළත් විවිධ අරමුණු මුදුන්පත් කරගැනීම සඳහා රජයක ආර්ථික ප්‍රතිපත්තිය බලාත්මක කරන මූලික උපකරණය වශයෙන් සලකනු ලබන අයවැය උපයෝගී කරගනු ලැබේ.

සංවර්ධිත රටවල රාජ්‍ය මුදල් ප්‍රතිපත්තිය සාමාන්‍යයෙන් සම්බන්ධව පවතින්නේ ආර්ථික ස්ථාවරභාවය සමඟය. සමාහාර ඉල්ලුම පාලනය කිරීම සඳහා බදු හා වියදම් මාර්ග උපයෝගී කරගනු ලැබේ. ආර්ථික අවපතනය බලපවත්නා අවධිවලදී ප්‍රබල ඉල්ලුමක් ඇති කිරීම සඳහා බදු අඩුකිරීම හෝ රාජ්‍ය වැය වැඩි කිරීම හෝ කරනු ලැබේ. මෙම උපක්‍රමය යොදනු ලබන්නේ අර්ථ ක්‍රමයේ නිපැයුම හා සේවා නියුක්තිය වර්ධනය කිරීමටය. එමෙන්ම උද්ධමනය ඇතිවිය හැකි සමෘද්ධිමත් අවධිවලදී ද සමාහාර ඉල්ලුම ඉහළ යාම සීමා කිරීම සඳහා අධික බදු පැනවීම හා රාජ්‍ය වැය කපාහැරීමද සිදු කෙරේ. හාණ්ඩ සඳහා ඇතිවන ඉල්ලුම හසුරුවා ගැනීම හා ප්‍රතිචක්‍රීය ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ මෙබඳු ක්‍රියාමාර්ග සාමාන්‍යයෙන් අදාලවනුයේ ඉල්ලුමෙහි වෙනසියාවන්ට ඔරොත්තු දෙන්නාවූ නව සංකීර්ණ ආර්ථික ව්‍යුහයක් පවතින ආර්ථික රටාවකටය. ඌන සංවර්ධිත රටවලට මෙබඳු ක්‍රම ගැලපේද යන්න දැඩි මතභේදයට හාජනය වී ඇත. සංවර්ධිත ක්‍රමෝපායයන් අනුගමනය කර ඌන සංවර්ධිත රටවල අර්ථ ක්‍රමයෙහි ඉල්ලුම උත්තේජනය කිරීම සඳහා වියදම් වැඩිකිරීමට හෝ බදු අඩුකිරීමට හෝ උපදෙස් දීම අසීරුය. ඵලදායී ඉල්ලුම වැඩිකිරීමෙන් සම්පත් යෝජනය සඳහා අඩුවෙන් මුදල් යෙදවීම හෝ අයබදු කපා හැරීම හෝ නිසා නියත වශයෙන්ම උද්ධමනකාරී තත්ත්වයක් හටගන්නේය. එමෙන්ම අනික් අතට, ඌන සංවර්ධිත අර්ථ ක්‍රමයක පවා පොතේ සඳහන් අධික බදු පැනවීම හා වැය කපාහැරීම ආශ්‍රිත ඉල්ලුම හැසිරවීමේ ප්‍රතිපත්ති හා පෙර අනුගමනය කරන ලද මූල්‍ය ප්‍රසාරණ ප්‍රතිපත්ති නිසා හටගත් අතිරික්ත ද්‍රවශීලතාව (මුදල් සම්හාරය) අඩුකිරීමද අදාළ වන්නේ සීමිත ප්‍රමාණයකින් බව මෙහිදී සඳහන් කළ යුතුය.

සංවර්ධනය වන්නාවූ රටවල් ගණනාවකටම ඉතාමත් අඩු ආදායම් මට්ටමක් සහිත පටු ආර්ථික පදනමක් තුළ කටයුතු කිරීමට සිදුවී ඇති බව නොරහසකි. ඔවුන්ට මුහුණ පෑමට සිදුවී ඇති ප්‍රශ්නය නම් එම ආර්ථික ව්‍යුහය ඇතුලත හෝ ඉන් පරිබාහිරව තැන්පත් කරන ලද ඉතිරි කිරීම් උචිත ආයෝජන සඳහා යෙදවීමේදී පැන නගින බාධක මැඩ පැවැත්වීමයි. එබැවින් ආර්ථික රාමුවට පුනර්ජීවයක් ලබාදී ආර්ථික ක්‍රමයේ නිෂ්පාදන ධාරිතාව නංවාලිය හැකි ආයෝජන හා ඉතිරිකිරීම් මගින් මෙයට තිර විසඳුමක් සොයා ගත යුතුය. ප්‍රවර්තන ආදායමෙන් කොටසක් ඉතිරි කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රාග්ධන සංචිතයක් ඇතිකොට පමණක් මුදුන් පත්කර ගතහැකි සංවර්ධන කාර්යාවලිය කෙටි කරගත හැකි මාර්ගයක් ධනවාදී රාමුවක් තුලින් හෝ සමාජවාදී රාමුවක් තුලින් හෝ සොයාගත හැකියයි සිතීම වරදකි. අභ්‍යන්තර ඉතිරි කිරීම්, බාහිර ඉතිරි කිරීම්වලින් තරකළ හැකි වුවද, එබඳු ආයෝජන මගින් ආර්ථික අතිරික්තයක් බිහිවී අර්ථක්‍රමයේ ශුද්ධ අගය වර්ධනය වීම සිදුවේ දැයි වගබලා ගත යුතුය. ඒ අනුව ආර්ථික සංවර්ධනය සඳහා උත්සුක වන්නේ නම් ඉතිරි කිරීම සඳහාද උත්සුක විය යුතුය. අනුගමනය කරන ආර්ථික ප්‍රතිපත්තිවලින් ප්‍රවර්තන පරිහෝජනය සීමාකිරීමට උත්සුක බවක් නොදක්වන්නේ නම් සංවර්ධන ප්‍රතිපත්තිවලින් ප්‍රතිඵල ලබාගත නොහැකිය.

ඉතිරිකිරීම් හා ආයෝජනය

ආර්ථික න්‍යායයන්හි ඉතිරිකිරීම් හා ආයෝජන පිළිබඳ සංකල්පය පරීක්ෂා කිරීමෙන් ඉතිරිකිරීම් හා ආයෝජන වර්ධනයෙහිලා රාජ්‍ය මුදල් ප්‍රතිපත්තියේ ඇති වැදගත්කම වටහාගත හැකිය. කිසියම් අර්ථ ක්‍රමයක චක්‍රීය ආදායම් වහනය පිළිබඳ මූලධර්ම ගැන සලකා බලන කල්හි සැබෑ සම්පත්වලින් කරන සෑම ගනුදෙනුවකටම සම්බන්ධව සාධක ගෙවීම් හෝ මුදල් ආදායම් හෝ පවතින බව අපි දනිමු. කිසියම් අර්ථ ක්‍රමයක ඉතිරිකිරීම එහි ආයෝජනයට

අනුරූපවේය යන මතයෙන් අදහස් කෙරෙනුයේ පරිභෝග නොකළ මූල්‍ය ආදායම හා පරිභෝග නොකළ සැබෑ සම්පත් අතර වෙනස් නොවන සමතාවක් පවත්නා බවය. මෙම පරිභෝග නොකළ ආදායමෙන් කොටසක් පුද්ගලයන් අත අක්‍රිය මුදල් ශේෂ වශයෙන් හා ඊට අනුරූප වූ තථ්‍ය සම්පත් තොග හෝ ඉන්වෙන්ටරි හෝ වශයෙන් සමුච්චිත වීම වැළැක්විය නොහැක. මෙම ආර්ථික පැවැත්ම යටතේ නම් ඉතිරි කිරීම හා ආයෝජන අතර සමතාව සැමවිටම සත්‍යවන අතර විශ්ලේෂණය කොට දැක්වීමට කිසිම හරයක් නැති පුනරුක්තියක් පමණක් බවට පත්වේ.

කිසියම් අර්ථ ක්‍රමයක් සඳහා සැලසුම් කොට ඇති හෝ බලා පොරොත්තුවන ඉතිරිකිරීම් ප්‍රමාණය එම කාලය ඇතුළත යෙදවීමට සැලසුම් කොට ඇති ආයෝජන ප්‍රමාණය හා සමාන කිරීමට ප්‍රයත්නයක් දරන විට මෙම සංකල්පයෙහි වැදගත්කම ඔප්පු වන්නේය. නිශ්චල සම්පත් පිළිබඳ ගනුදෙනු ප්‍රමාණවත් ලෙස මුදල් තත්ත්වයට පරිවර්තනය කළ හැකි සංවර්ධනය වී ඇති ආර්ථිකයක පරිභෝග නොකළ මූල්‍යජ ආදායම, මුදල් කටයුතු පිළිබඳ අතරමැදි සංවිධාන ගණනාවක් මගින් පරිභෝග නොකළ සැබෑ සම්පත් මිලට ගැනීම සඳහා යොදවනු ලැබේ. මෙම ආයතන ප්‍රාග්ධන යෝජනා අංශය හෝ බැංකු කටයුතු අංශය හෝ යන කවර අංශයකට අයත් වුවද ඉතිරිකරන්නා හා ආයෝජකයා අතර ගනුදෙනු කිරීමේ පුරුක වන්නේය. මෙබඳු ආයතනික වාතාවරණයක් යටතේ සැබෑ සම්පත්වලින් සෑහෙන කොටසක් ආයෝජනය කිරීම සඳහා වෙන්කර ගන්නේ ව්‍යාපාරිකයාය. පොළී අනුපාතයෙන් පිළිබිඹුවන මූලධනයේ සාපේක්ෂක වටිනාකම හා ලාභයෙන් පිළිබිඹුවන මූලධනයෙන් ලැබෙන ආදායම අතර පවතින එම තුලිතතාවයෙන් ආර්ථික කටයුතුවල වර්ධනය හා විශාලත්වය පාලනය කෙරේ. ප්‍රාග්ධනය හා ආයෝජනය සඳහා අධික ඉල්ලුමක් ඇතිවුවහොත්, ආයෝජනයෙන් ලැබිය හැකි ආදායමට වඩා ප්‍රාග්ධන පිරිවැය ඉහළ නගින අතර ඒනිසා පාඩු පිට කරගෙන යන ව්‍යවසායයන් වසා දැමීමටද සිදුවිය හැකිය. එපරිද්දෙන්ම අධික ලාභ ලැබීම හේතුකොටගෙන, නිෂ්පාදන අඩුවීම් පියවා ගැනීම සඳහා පරිභෝජනයට ඇති සම්පත් අඩුවෙන් යෙදවීමට කර්මාන්ත හිමියන් පෙළඹීමද ස්වභාවිකය. එමනිසා වෙළඳ යන්ත්‍රණය මගින්, මිළ ගණන්වලින් පෙන්නුම් කරනු ලබන පාරිභෝගිකයාගේ තෝරා ගැනීමට අනුකූලව සම්පත් කාර්යක්ෂම ලෙස යොදගැනීම සිදුවන්නේය. බැංකු හා මූලධන වෙළඳ පොළවල්, කර්මාන්තහිමියන්, පොළී අනුපාතිකයන්, ණයට දියහැකි අර මුදල් හා ලාභ ආදී වූ මූල්‍ය අතරමැදි අවස්ථා මෙම ක්‍රියා පරිපාටියෙහි සාමාන්‍ය කාර්යාවලියට අයත්වන බව පැහැදිලිවම පෙනේ.

ආර්ථිකයක ඉහත කී තත්ත්වයන්ගෙන් එකක් හෝ කිහිපයක් හෝ ඌනවීම හෝ ප්‍රමාණවත් නොවීම් හෝ සිදුවූවහොත්, ආර්ථික කටයුතුවල වර්ධනය හා ධාරිතාව අපේක්ෂිත මට්ටම කරා ගෙන යාමට එබඳු ආර්ථිකයකට හැකිවේද? ඉහත කී ඌනතා එකක් හෝ ඊට වැඩි ගණනක් නිසා ආදායම් චක්‍රීය වහනයට බාධා ඇතිවන අතර ඉන් ආර්ථික කටයුතු කෙරෙහි අහිතකර බලපෑමක්ද ඇති වන්නේය. ආයතනික රාමුව ඇතුළත පවතින ඌනතාවලින් මූල්‍යජ ආදායම යටිමඩි ගැසීමට හා එමගින් ආර්ථිකයෙහි අනවශ්‍ය තොග හා භාණ්ඩ ප්‍රමාණයක් ගොඩ ගසා ගැනීමද සිදුවේ. ආදායමේ චක්‍රීය වහනයෙන් එක්තරා කොටසක් ඉවත් කළහොත්, ආර්ථික කටයුතුවල ප්‍රතිලෝම දහරයක් පහළවේ. එමෙන්ම, ආර්ථිකයේ චලනයන්හි ස්පන්දනයට ඔරොත්තු නොදෙන පොලී ව්‍යුහයකින් සම්පත් වෙන්කර දීමේ කාර්යයෙහිලා ආර්ථිකයට මඟ පෙන්වීමක්ද ඇති නොවන්නේය.

මුදල් බවට පරිවර්තනය නොවූ ආර්ථික ගනුදෙනුවලින් ක්‍රියාකාරී මට්ටම පහත වැටීමට ඉඩ ඇත්තේය. මෙම තත්ත්වයන්හි ඇතිවන ඌනතා ආර්ථික ක්‍රියාකාරීත්වය කෙරෙහි බලපානු ඇත. ආර්ථිකයේ ගනුදෙනු මුදල් බවට පත්කිරීමට ප්‍රමාණවත් හා යෝග්‍ය ආයතනික රාමුවක් මගින් හා සැබෑ සම්පත් ගනුදෙනුවල ප්‍රතිරූප වශයෙන් පවතින මූල්‍ය වත්කම් හා බැරකම් උපදවන ආන්තරිකත්වයක් මගින් ආර්ථිකයේ ශුද්ධ ධන සම්පත් වැඩිවේ. මුදල් ඉතිරි කිරීම ඉහළ ගොස් අවසානයේදී ඵලදායී ආයෝජන කෙරෙහි යොමුවීමද සිදුවේ. රටේ අවශ්‍යතාවන්ට ඔරොත්තු දෙන පොළී ව්‍යුහයක් අනුවම සම්පත් විභාජනය සිදුවන්නේය. එමනිසා ආර්ථික ක්‍රම සම්පාදනය හා රාජ්‍ය මුදල් ප්‍රතිපත්තිය ආර්ථිකයේ මෙබඳු ක්ෂේත්‍රයන් උත්තේජනය කිරීම සඳහා උපයෝගී කරගත යුතුය.

ආයතනික රාමුව තුළ පවත්නා ඌනතා හා සංවර්ධනය දිරිගන්වන්නාවූ ආර්ථික විචල්‍යයතා රටේ අවශ්‍යතාවලට ඔරොත්තු නොදීමද ආර්ථික ක්‍රියාකාරිත්වයෙහි විශාලත්වය අඩුවීමද ආර්ථිකයෙහි සෑහෙන ඉතිරි කිරීම් ප්‍රමාණයක් ඇතිකිරීමට බාධාවක්ව පවතී. ශ්‍රී ලංකාවේ පසුගිය දශකය තුළ හෝ ඊටත් වැඩි කාලයක් තුළ දේශීය ඉතිරිකිරීම් මට්ටම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට දහතුනකට ආසන්නව පවතී. විටින් විට නිකුත් කරන ලද ක්‍රම සම්පාදන ලේඛනවලින් අපේක්ෂිත මට්ටමට ආර්ථිකය නගා සිටුවීමට හෝ ආර්ථිකයේ වර්තමාන යැපුම් මට්ටම ඉහළ දැමීමට හෝ මීට කලින් තිබි ආර්ථික ප්‍රතිපත්ති සමත් වී නැති බව ප්‍රකට කරුණකි. වහාම ප්‍රමුඛත්වය දිය යුතු කටයුත්තක් වශයෙන් ජාතික ඉතිරිකිරීම් මට්ටම ඉහළ දැමීමට දැඩි ප්‍රයත්නයක් දැරිය යුතු බව මින් පැහැදිලි වේ.

ස්වේච්ඡා ඉතිරිකිරීම්වලින් එය ඉටු නොවේ නම් රජය මැදිහත් වීමෙන් එය ක්‍රියාත්මක කළ යුතුව ඇත. ස්වේච්ඡා ඉතිරිකිරීම් ප්‍රමාණවත් නොවීම සංවර්ධනය වන්නාවූ රටවල් බොහොමයකට මුහුණ පෑමට සිදුවී ඇති ප්‍රශ්නයකි. මෙම කාරණයට රජය මැදිහත් වනවිට ඉහළ මට්ටමක බදු පැනවීමක් අවශ්‍ය වන්නේය. පරිභෝජනය සඳහා යොදගන්නා ප්‍රවර්තන ආදායමෙන් වැඩි කොටසක් ඉතිරිකිරීම්වලට යොමු කිරීමට දේශපාලන වශයෙන් සම්මුතියකට එළඹීමෙන් පරිභෝජනය කල්දැමීම පිළිබඳ මූලික තීරණ රජය විසින් ගතයුතු වන බව මෙයින් අදහස් වේ. තාවකාලිකව මෙය පීඩාකාරී ව්‍යායාමයකි. එසේවුවද ආර්ථික සංවර්ධනයෙහිලා අර්ථවත් ප්‍රතිඵල ලබාගැනීමට නම් තීරණ ගැනීම පමාකිරීමෙන් වගකීම පැහැර හැරිය නොහේ.

ඉහත කී ඌනතා ගැන සලකා බලන විට, රාජ්‍ය මුදල් ප්‍රතිපත්තිය ඒ සියලුම අඩුලුහුඬුකම්වලට ප්‍රමාණවත් ආදේශකයන් නොවූවද, යෝග්‍ය ආර්ථික වාතාවරණයක් ඇති කිරීමෙන් එම අඩුලුහුඬුකම් හරිගස්සා සකස්කර ගැනීම සඳහා සාර්ථක ලෙස උපයෝගී කරගත හැකි ක්‍රමයකි. ඉතිරිකිරීම් කාර්යාවලිය උත්තේජනය කිරීම සඳහා එය යොද ගත හැක. එබඳු ඉතිරිකිරීම් ආයෝජනයන් සඳහා ප්‍රයෝජනයට ගැනීමට එය යොදගත හැක. මූල්‍ය ආන්තරිකත්ව මට්ටම ඉහළ නැංවීම සඳහා එය යොදගත හැක. සාර්ථක ප්‍රතිපත්තිමය උපකරණයක් වශයෙන් පොළී අනුපාතික ක්‍රමයට නව පණක් දීමට හා යළි ප්‍රතිෂ්ඨාපනය කිරීමටද රාජ්‍ය මුදල් ප්‍රතිපත්තිය යොදගත හැක. මේවා කිසිසේත් නොවෙනස්ව පවතින අරමුණු නොවේ. එක ප්‍රතිපත්තියක අරමුණු තවත් ප්‍රතිපත්තියක අරමුණු සමඟ සංඝටනය විය හැකිවුවද, රජයේ සමස්ත ප්‍රතිපත්තිය මගින් මේවා තුලනය කිරීම අවශ්‍යය.

ඉතිරිකිරීම් මට්ටම ඉහළ නැංවීම අවශ්‍යවන කල්හි රජය විසින් ස්වේච්ඡා හා අනිවාර්ය මුදල් ඉතිරිකිරීමට පෙළඹවීම සඳහා අයවැය ප්‍රතිපත්ති ප්‍රයෝජනයට ගත හැකිය. මූල්‍ය දිරිගැන්වීම් හා රාජ්‍ය මුදල් ප්‍රතිපත්තිය මගින්ද විවිධ ආයතන මගින්ද ඉටු කළ යුතු කාර්යයක් වශයෙන් ස්වේච්ඡා මුදල් ඉතිරිකිරීම පවතී. රාජ්‍ය මුදල් ප්‍රතිපත්තියේ විෂය ප්‍රමාණය වැඩිවශයෙන්ම, බදු පැනවීමෙන් මුදල් ඉතිරිකිරීමට බලකිරීම හා සම්බන්ධව පවතින බැවින් බදු අයකිරීම ගැන මඳක් විමසා බැලීම වටනේය.

බදු අයකිරීම

බදු අයකිරීම කෙලින්ම හෝ අනියම් වශයෙන් හෝ කළ හැකි බව අපි දනිමු. ආදායම් මත ඍජු බදු අයකළ හැකිවන අතර එය වැය කළහැකි ආදායම කෙරෙහි බලපානු ඇත. වෙළඳ පොළෙන් මිලට ගතහැකි භාණ්ඩ හා සේවා සඳහා බදු පැනවීමෙන් වියදම් මාර්ගයෙන් අනියම් බදු අයකළ හැකිය. මේ ක්‍රම දෙක යටතේම මිනිසුන්ගේ සැබෑ ආදායම කෙරෙහි බලපෑමක් ඇතිවේ. ඒ බලපෑම

ඇතිවන්නේ පරිභෝජනයට ගන්නා සම්පත්වලින් කොටසක් අයබදු මාර්ගයෙන් ඉතිරිකිරීම බවට හරවන ප්‍රමාණය අනුවය. එක්තරා අවස්ථාවක පවතින පරිභෝජනමට්ටම අඩුකිරීමට මහ ජනයා මැලිවන අවස්ථාවලදී ගතහැකි තවත් පියවරක් නම් උද්ධමන ක්‍රියා මාර්ගයකින් ආර්ථික සංවර්ධනය උදෙසා ධන සම්පත් උපයාගැනීමය. මේ ක්‍රියා මාර්ගයේ අවසන් ප්‍රතිඵලයද බදු අය කිරීමෙන් ලැබෙන ප්‍රතිඵලයට සමානය. මෙම ක්‍රියා මාර්ගයෙන් මුලින්ම සිදුවන්නේ රටේ සම්පත් රජය අතට යාමයි. එහි ප්‍රතිඵලයක් ලෙස මිල වැඩිවී ආදයමේ සැබෑ අගය පහත වැටෙන නිසා බදු අයකිරීමේ මූලික ලක්ෂණය එහි අන්තර්ගතව ඇත. එබැවින් මෙය වූ කලී පිරිවැය අතින් හා ඉපයුම අතින්ද දැඩි සීමාවන්ට යටත් වූ ක්‍රමයකි. එමෙන්ම, එබඳු උද්ධමනකාරී ප්‍රතිපත්ති පාලනය කරගත නොහැකි තත්ත්වයකට පත්වුවහොත් ලතින් ඇමෙරිකානු රටවල්, ඉන්දුනීසියාව හෝ කොරියාව බඳු ඇතැම් රටවල පසුගිය කාලයේදී දක්නට ලැබුණු උද්ධමනකාරී තත්ත්වයන් ඇතිවිය හැකිය. මේ අනුව බලන විට, ස්වේච්ඡා ඉතිරිකිරීම් මගින් හෝ බදු පනවා ඉතිරිකිරීමට බල කිරීම මගින් හෝ හැරුණු විට සම්පත් පරියෝජනය සඳහා වෙනත් ක්‍රමයක් නැති බව පෙනේ.

එපමණක්ද නොව, අයබදු පදනම්ව ඇති ඉතිරිකිරීම් වලින් අනාගත නිපැයුම වැඩිකිරීම සඳහා පූර්ව හිමිකමක් ඇති නොකෙරේ. එහෙත් බැඳුම්කර මාර්ගයෙන් හෝ වෙනත් ණයකර මාර්ගයෙන් හෝ යොදවා ඇති පුද්ගලික ඉතිරිකිරීම් කරණකොටගෙන ණය සේවා වියදම් ඇතිවනවා පමණක් නොව රජයේ ආදයම් වියදම් ප්‍රතිපත්තියට බාධකද ඇතිවේ. ප්‍රතිපත්තිමය උපකරණයක් ලෙස බදු අය කිරීමෙහි වෙනත් වාසි ඇත. ආර්ථිකයේ වෙළඳ බලවේගයන්හි නිර්බාධ ක්‍රියාකාරිත්වයෙන් උපදින ආදයම යළි බෙදහැරීම සඳහා එය උපයෝගී කරගත හැක. එසේවුවත් පොදු භාණ්ඩ ශුභසාධන හා සංවර්ධන වියදම් සැපයීම සඳහා රජය අනුගමනය කරන විවිධ ප්‍රතිපත්ති හේතුකොටගෙන බදු අය කිරීමෙන් බලාපොරොත්තුවන පරමාර්ථ යටපත් වීමට ඉඩ ඇත. වියදම් ප්‍රතිපත්තියට විශාල ලෙස බලපාන බැවින් පරමාර්ථානුගත සීමා වැදගත් වේ. නීතිය හා සාමය රැකීමටද මූලික පොදු භාණ්ඩ සැපයීමටද රජය මූලික වශයෙන් බැඳී ඇත. මේ සඳහා බදු අය කිරීම අවශ්‍යය. එවිට රජයට බදු අයකිරීම් මගින් ආදයම නැවත බෙදහැරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට ඉඩ ලැබේ. බදු අයකිරීමේ සාධාරණකම දැක්වීමට මෙහි දෙවනුව කී කාරණය නිසා ඇතැම් ශුභසාධන සේවා පවත්වාගෙන යාමට රජය බැඳී ඇත. තෙවනුව, ආර්ථික සංවර්ධනය උදෙසා මුදල් ඉතිරිකිරීම් උපයා ගැනීම සඳහා රජයට අයබදු ක්‍රමය උපයෝගී කරගත හැකිය. නියම ප්‍රශ්නය මතුවන්නේ මෙම අවස්ථාවේදීය. එනම්: පොදු භාණ්ඩ සැපයුම හා නැවත බෙදහැරීම සඳහා බදු අයකිරීම අවසන් වන්නේ කොතැනින්ද? සංවර්ධනය සඳහා බදු අයකිරීම ආරම්භ වියයුත්තේ කොතැනින්ද? යන්න විසඳා ගත යුතුය. ප්‍රායෝගික මට්ටමේදී මෙය වෙන් වෙන් වශයෙන් දැක්වීම කළ නොහැකි තරමය. රාජ්‍ය මුදල් වර්ගීකරණය පිළිබඳ සාමාන්‍ය ව්‍යවහාරය අනුව අයබදුවලින් ලැබෙන මුළු ආදයම ප්‍රවර්තන ආදයම වශයෙන් සලකනු ලැබේ. එමෙන්ම සෑහෙන ප්‍රමාණයකට ආදයම් නැවත බෙද හැරීම පදනම් කොට ගත් වියදම් සඳහා ධනය යෙදවීමටද රජයට සාධාරණ අයිතිවාසිකමක් ඇතැයි කිව හැකිය. එහෙත් කෙලින්ම රජයේ මැදිහත්වීම ඇතිව ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම, රාජ්‍ය මුදල් ප්‍රතිපත්තිය විය යුතු යයි ප්‍රකාශ කරන රජයක් මගින් ඉහත කී කරුණු දෙක වෙන්කොට හඳුනාගත යුතු වන්නේය.

වැය අංශයට අදාළ ආර්ථික කරුණු

වැය අංශයට අදාළ ආර්ථික කරුණු තීරණය කරගැනීම අසීරු දේශපාලන ප්‍රශ්නයක්ව පවතී. අපේක්ෂිත ආදයම් ප්‍රති ව්‍යාප්තියෙහි මට්ටම හා විශාලත්වය පරීක්ෂා කිරීමෙන් මෙම ගැටළුව වෙනත් අන්දමකින් නිරාකරණය කරගත හැක. ආදයම් ප්‍රති ව්‍යාප්තියෙහි විවිධ කරුණු එකකට එකක් සාපේක්ෂක වශයෙන් ගෙන සංවර්ධන අවශ්‍යතා සමඟ සංසන්දනය කර පරීක්ෂාවට භාජනය කළ යුතුය.

ශ්‍රී ලංකාවේ ආදයම් නැවත බෙද හැරීම සම්බන්ධයෙන් දියත් කරන ලද යෝධ වැඩ සටහන්වලින් පවා බලධාරීන් සමත්වී ඇත්තේ අඩු ආදයම් ලබන කොටස්වල ජීවන තත්ත්වයෙහි ආන්තික වර්ධනයක් ඇති කිරීමට පමණය. මෙම පන්තිවල පරිභෝජන මට්ටම හා ජීවන තත්ත්වයන් ''අන්තිම අඩු ලංසයෙන් වත් ප්‍රමාණවත්'' යයි හැඳින්විය හැකි තත්වයකට ගෙන ඒමට නම් තව තවත් ශුභසාධන වියදම් වැඩිකිරීමට අවශ්‍යව ඇත. මෙබඳු විසඳුමකින්, ජනතාව සදාකාලිකව දුගී බවෙන් හා අසහනයෙන් මිරිකී කල් ගෙවීමට කරුණු සැලසෙනවා පමණක් නොව අප ජනතාවගෙන් වැඩි දෙනෙකු තුළ පවතින අභිමානයත් ආත්ම විශ්වාසයත් නැතිව යන්නේය. මෙයට දීර්ඝ කාලීන විසඳුමක් ලබාගත හැක්කේ රැකියා නියුක්තියෙන් ලැබෙන ආදයම් පදනම් පළල් කොට ජනතාවගේ ආදයම් මට්ටම් ඉහළ නංවන ආර්ථික වර්ධනයක් මගිනි. රටේ ආර්ථික පිළිවෙත සර්ව-ශුභසාධන පදනමකට අයත්විය යුතු යයි එක් පක්ෂයක් කියන අතර තවත් පක්ෂයක් එය සර්ව-සංවර්ධන පදනමකට අයත්විය යුතු යයි කියති. මේ අන්ත දෙක මැදින් වැටෙන මැදහත් ආර්ථික පිළිවෙතක් ඇති බව පෙනේ. එනම් සංවර්ධන වැය සඳහා ප්‍රමාණවත් මුදලක් අයබදුවලින් ලබාගත හැකිවූ වරණීය ශුභ සාධනයකට අයත් ආදයම් ප්‍රති ව්‍යාප්ති පිළිවෙතක් අපට අනුගමනය කළ හැකිය.

වරණීය ශුභ සාධනයෙහි දැනට ක්‍රියාත්මක වන ශුභ සාධන වැඩ සටහන් වර්ගවල පහාද තරක සාපේක්ෂක වශයෙන් ගෙන පරීක්ෂාවට භාජනය කිරීමට මහ පැදෙනු ඇත. මෙබඳු වියදම් වලින් වැඩි කොටසක් අධ්‍යාපනය, සෞඛ්‍යය සඳහා වැයවන අතර, මහජනයාට දෙනු ලබන ආහාර සහනාධාර වශයෙන් හා විශ්‍රාම වැටුප් වශයෙන් පැවරූ ගෙවීම් යටතේද වැය වන්නේය.

මෙහිදීද ශුභ සාධන පරමාර්ථ කොටගත් ප්‍රති ව්‍යාප්තිය ආයෝජනයෙන් හා වර්ධනයෙන් වෙසෙසින් වෙන් වූ දෙයක් ලෙස සැලකිය නොහේ. අධ්‍යාපනය, මිනිසුන්ගේ සෞඛ්‍යය හා පෝෂණ මට්ටම ඉහළ නැංවීමෙන් මානව මූලධන තත්ත්වය උසස් කිරීම සඳහා වැයවන ශුභ සාධන වියදම්වලින් සංවර්ධනයට සේවයක් ඒකාන්තයෙන්ම සැලසේ. මෙය තවදුරටත් විස්තර කළ යුතුව ඇත. සාමාන්‍යයෙන්, රජයේ වියදම් පිළිබඳ ප්‍රමිත වර්ගීකරණය අනුව ආරෝග්‍යශාලා හා පාසැල් පිළිබඳ මූල් වියදම් නිසැකවම ප්‍රාග්ධන වියදම් ලෙස ගණන් ගනු ලැබේ. එමෙන්ම අධ්‍යාපන සේවා හා සෞඛ්‍ය සේවා සඳහා උපයෝගී කරගනු ලබන කල්පවතින උපකරණද මෙම ගණයෙහිලා සැලකේ. එහෙත් එම සේවාවලට අයත් වැටුප් හා වේතන ප්‍රවර්තන වියදම් වශයෙන් සලකනු ලැබේ. මෙය විවාදයට තුඩු දෙන කරුණකි. රෝහල් සඳහා සහ පාසැල් සඳහා කරනු ලබන ආයෝජනය ප්‍රාග්ධනය ලෙස සැලකේ නම්, මෙම ආයෝජනයන්හි නිෂ්පාදකතාවයට දායක වන දොස්තරවරු හා ගුරුවරුන් සඳහාවන වියදම් ද එම ගණයෙහිලා සැලකිය හැකිය. ''මානව ප්‍රාග්ධනය'' පිළිබඳ සංකල්පයක් උපයෝගී කරගන්නේ නම් මෙම කරුණු අවිවාදයෙන්ම පිළිගත යුතු වන්නේය.

මේ කාරණය අපි මඳකට පසෙකින් තබමු. පසුගිය දශක කිහිපය ඇතුලතදී මෙරට ජනතාවට නොමිලේ අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් සපයාදීමේ ප්‍රතිපත්තියක් රජය විසින් අනුගමනය කරගෙන එන්නේය. මෙහිදී පැන නගින ප්‍රශ්නය නම් මේ ශුභ සාධන සේවා සලසන ගමන්ම ලොව අනෙකුත් රටවල ඉහත කී ක්ෂේත්‍රයන්හි පවතින දියුණුවට සරිලන ප්‍රමාණවත් ප්‍රමිති තත්ත්වයන් පවත්වාගෙන යාමට රජයට හැකියාවක් තිබේද යන්නය. කිසිම අය කිරීමක් නොමැතිව අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවා සැපයුම ප්‍රශංසනීය ශුභ සාධන කාර්යයක් වුවද සංවර්ධන කටයුතු අරභයා සම්පත් පරිභෝජනය කිරීමෙහිලා රජයට ඇති හැකියාව එමගින් අඩාලවනු ඇත. එපමණක්ද නොව, මෙම සේවාවන් සඳහා අයබදුවලින් ලැබෙන මුදල් යෙදවීමට සිදුවී ඇති හෙයින් සංවර්ධන ව්‍යාපෘතීන් පිරිහෙන්නට හැර රාජ්‍ය ආදයමෙන් තවත් වැඩි කොටසක් ඉහත කී ශුභ සාධන සේවා සඳහා යෙදවීමට රජයට ශක්තියක් තිබේදැයි විමසා බැලිය යුතුය.

මෙම ප්‍රශ්නය පිළිබඳව පැවැත්වුනු පොදු සාකච්ඡාවලදී වැදගත් කරුණු දෙකක් පැහැදිලිව හඳුනා ගැනීමට අසමත්ව ඇත. ඉන් පළමුවැන්න රජය විසින් මෙම සේවා පවත්වාගෙන යාමේ යෝග්‍යතාවයයි. දෙවැන්න නම් එම සේවා සඳහා මුදල් සොයා ගන්නා ක්‍රමයයි.

ශ්‍රී ලංකාවේ දේශපාලන වාතාවරණය හා ආර්ථික කළමනාකරණයෙහි රාජ්‍ය කාර්යභාරය පැතුලවීමද අනුව මෙම සේවා පවත්වාගෙන යාම පිළිබඳව රජයට ඇති අයිතිය ගැන විවාද කළ නොහේ. ඒ නිසාම මෙම සේවාවල සම්පූර්ණ මූල්‍ය වියදම් රජය දැරිය යුතුයයි මෙයින් අදහස් නොකෙරේ. නීතිය ක්‍රියාත්මක කිරීම හා මූලික පහසුකම් සැලසීම බඳු පොදු සේවා සඳහාවන වියදම් ඉසිලීම සඳහා ප්‍රජාවගෙන් බදු අයකිරීමට රජයට අයිතියක් ඇතිවාක් මෙන්ම අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවා සඳහා බදු අයකිරීමටද රජයට අයිතියක් ඇත. බදු පැනවීමේදී සාමාන්‍යයෙන් අනුගමනය කරන සාධාරණ මූලධර්මය කඩ නොකර මෙය ක්‍රියාත්මක කළ හැක. ඒ ඒ පුද්ගලයාගේ තත්ත්වය අනුව ක්‍රමාංකික පරිමාණයකින් පිරිනමනු ලබන සහනාධාරවලින් දැනට වලංගුව පවතින වැඩසටහන්වල අන්තර්ගත ශුභ සාධන ලක්ෂණවලට හානියක් නොවනු ඇත. නිල වශයෙන් පිළිගත් දරිද්‍රතා මට්ටමෙන් පහළ දිළිඳු ජනයාට දැනට ලැබෙන ප්‍රතිලාභ කපා හරින්නේ නැතිව, ශක්තිමත් ජීවනෝපායක් ඇති අයට ඔවුන් භුක්ති විඳින සේවාවන් සඳහා මුදල් ගෙවීමටද සැලැස්විය හැක.

සෞඛ්‍ය සේවා සම්බන්ධයෙන් එක්සත් රාජධානියේ ජාතික සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය හා සමානවූ ක්‍රමයක් එම සේවාවල රැකියාවේ නියුක්ත අය වෙනුවෙන් ක්‍රියාත්මක කළ හැකිය. අධ්‍යාපන සේවා සම්බන්ධයෙන් එක්තරා සීමාවක් දක්වා නොමිලේ අධ්‍යාපනය ලබාදිය හැක. එතැන් සිට අධ්‍යාපනය සඳහා රජයේ මුදල් යෙදවිය යුත්තේ යෝග්‍ය වරණීය මිණුම් දණ්ඩකට යටත්වය. ශිෂ්‍යයන්ගේ තත්ත්වය නොසලකා පොදු ආධාර ක්‍රමයක් මගින් දක්ෂ සිසුන් වෙනුවෙන් මුදල් වැය කිරීම කළ හැකිය. මෙහිදී අප පළමුවෙන්ම වරණීය මූලධර්මය ක්‍රියාත්මක කිරීම පිළිගන්නවාදැයි තීරණය කළ යුතුය. එසේ තීරණය කිරීමෙන් පසුව, මහජනයාට අභිමත වන පරිදි ක්‍රියාත්මක කළ හැකි වරණීය මිනුම් දඬු රාශියක් ඇත. නිෂ්පාදකතාවය වැඩිකර සමස්ත ප්‍රජාවගේ සංවර්ධන මට්ටම හා තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහාද තව තවත් සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරවීම සඳහාද එමගින් මෙරට රාජ්‍ය මූල්‍ය තත්ත්වය යහපත් අතට හැරවීම සඳහාද දැනට සලසනු ලබන සේවා වඩා හොඳින් පවත්වාගෙන යාම සඳහාද මෙම මූලධර්මය අනුව කටයුතු කිරීම අතිශයින් වැදගත් වන්නේය.

රජයේ පවාරණ ගෙවීම්වලින් වැඩිකොටසක් කැප කෙරෙන ආහාර සහනාධාරය පිළිබඳවද ඉහත සඳහන් කළ පිළිවෙත අනුව ප්‍රතිකර්මයක් සොයාගත හැකිය. මෙහිදීද සහනාධාර ලැබිය යුතු පුද්ගලයන් හට දැනට ලබාදෙන ආහාර සහනාධාරය අවශ්‍යද නැද්ද යන්න ගැන ප්‍රශ්නයක් පැන නොනගී. ප්‍රශ්නය පැන නගින්නේ ආදායම් තත්ත්වය ගැන සැලකිල්ලක් නොදක්වා සියලු දෙනාටම ආහාර සහනාධාර ලබාදීමේ අවශ්‍යතාවය හා යෝග්‍යතාවය ගැනය.

එසේවුවද, රජයෙන් මහජනතාවට ලබාදෙන පවාරණ ගෙවුම් විශාල ප්‍රමාණයක් ගිලගන්නා ශ්‍රී ලංකාවේ ආහාර සහනාධාරය, ලෝකයේ වෙන කිසිම රටක නැති තරම් ආර්ථික කළමනාකරණයට අදාළ බරපතල දේශපාලන ප්‍රශ්නයක් බවට පත්වී ඇත. බැලූ බැල්මට මේ තත්ත්වයට හේතුවූ කරුණ වශයෙන් දශක තුනකට වැඩි කාලයක් තිස්සේ පාරිභෝගිකයින් තම පැත්තට නම්මවා ගැනීම සඳහා දේශපාලනඥයින් විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්තිය සඳහන් කළ හැකි වුවද ඊට වඩා මූලික හේතු කීපයක් ඇත.

(අ) අඩු සංවර්ධන අනුපාතයෙන් යුක්ත වූ ආර්ථිකය සාපේක්ෂක වශයෙන් නිශ්චලව පැවැති නියා ඒක පුද්ගල ආදායම් අංශයෙන් හෝ සේවා නියුක්ති අංශයෙන් හෝ සැලෙන දියුණුවක් ඇති නොවීම,

(ආ) රටට අවශ්‍ය ප්‍රමාණයට ධාන්‍ය වර්ග මෙරටින් නිපදවා ගැනීමට නොහැකිවීම යන කරුණු දෙක මෙහිලා සඳහන් කළ යුතුය.

තවදුරටත් පාරිභෝගිකයා සතුටු කිරීම සඳහා දේශපාලන විසඳුමකට එළඹීමෙන් සිදුවනුයේ ප්‍රශ්නය තව තවත් දිග්ගැස්සීම හා රජය දේශපාලන අවුල් ජාලයේ තවත් ගැඹුරට පැටලීම පමණි. යැපීම් කෘෂිකර්මය අලෙවි මූලික අංශයක් බවට පරිවර්තනය කර, යෝග්‍ය ආයෝජන යෝජනා ක්‍රම මගින් අවම දරිද්‍රතා සීමාවට ඉහළින් පිහිටි මට්ටමක් දක්වා ගොවීන්ගේ ආදායම වැඩි කිරීමට වර්ධනයට නැඹුරු වූ ආර්ථික ප්‍රතිපත්තියක් මගින් මීට වඩා තිර විසඳුමක් ලබාගත හැක.

දැනට පවතින කෘෂිකර්ම හා කර්මාන්තවල නිෂ්පාදනයට පහර නොවදින සේ ගම්බද ගොවීන්ගේ නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම සඳහා කෘෂිකර්ම අංශයෙහිද, රැකියා ජනනය කිරීම සඳහා කර්මාන්ත අංශයෙහිද ආයෝජනය කිරීමට මුල් තැනක් දිය යුතු බව පැහැදිලිය. එහෙත් මෙම පරමාර්ථ ඉටු කර ගැනීමට අවශ්‍ය සැලසුම් හා ව්‍යාපෘති නුදුරු අනාගතයේදී සකස් කරනවා නම්, එම යෝජනා ක්‍රමවලට අවශ්‍ය ධන සම්පත් සොයා ගැනීමේ ප්‍රශ්නයට රාජ්‍ය මුදල් ප්‍රතිපත්ති සකස්කරන්නන් විසින් මුහුණ දිය යුතුය.

ප්‍රතිපත්ති සකස් කරන්නන් විසින් අනුගමනය කළ යුතු වෛකල්පික මාර්ග ඉතා පැහැදිලිය. බදු ආදායම්වලට අනුකූලවූ මට්ටමක ශුභ සාධන වියදම් පවත්වාගෙන යාමට මැලිවීමෙන් වර්ධන කටයුතු අඩාල වන්නේය. මෙම විෂම චක්‍රයෙන් රජය මුදවා ගැනීමට ඇති අවසථාවද මගහැරී යන්නේය. අනික් අතට, සහනාධාර කපාහැරීමේ උපාය මාර්ගයක් ගතහොත් මහජනයා වහා ප්‍රකෝපවී විරෝධය පළ කිරීමට ඉඩ තිබේ. මෙම අනතුරුදායක තත්ත්වය හේතුකොටගෙන සහනාධාර අවශ්‍ය අයට සහනාධාර ලබාදීමේ යෝග්‍යතාවය ගැන කොහෙත්ම ප්‍රශ්න නොකළ යුතුය. ප්‍රශ්න කළ යුත්තේ, සිය පැවැත්ම සඳහා සහනාධාරයන්-බලාපොරොත්තු නොවන ජනතා කොටස් රාශියකට සහනාධාර සැලසීමෙ යුක්ති සහගතභාවයයි. සිය පැවැත්ම සඳහා සහනාධාර බලාපොරොත්තු නොවන පුද්ගලයන් ඉවත් කිරීම සඳහා වරණීය ප්‍රතිපත්තියක් අනුගමනය කර, සුදුසු ලෙස නියම කළ දරිද්‍රතා මට්ටමකින් පහළ ගණයකට වැටෙන පුද්ගලයන්ට පමණක් අත්‍යවශ්‍ය ආහාර සහනාධාර මිලකට ලබාදුනහොත් සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා සෑහෙන පමණ ධනය උපයාගත හැකිය.

පරතරයක් ඇතිව අය–වැය පිළියෙල කිරීමේ ඵල විපාක:

මුළු ආදායමේ ප්‍රමාණයම වාගේ ප්‍රවර්තන වියදම් සඳහා යොදා ගැනීමට පුරුදු වී සිටීම නිසා ක්‍රමයෙන් වැඩිවන සංවර්ධන වියදම් සඳහා මුදල් යොදවනු ලබන්නේ විදේශීය හෝ දේශීය ණය ලබා ගැනීම මගිනි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ලෝක යුද්ධයෙන් පසුව මේ රටේ මුදල් ප්‍රතිපත්තිය පරතරයක් සහිත අයවැය ලේඛන ඉදිරිපත් කිරීමේ කාර්යාවලියට කෙමෙන් ළඟා විය. මෙම කාල පරිච්ඡේදය මුළුල්ලේම ණය ලබාගැනීම වෙනුවෙන් දක්වන ලද තර්කය නම්, ආර්ථිකයේ නිෂ්පාදන ධාරිතාවය වර්ධනය කිරීම පිණිස රාජ්‍ය වැය යොදගත යුතුය යන්නයි. ණය වැඩිවීමේ වේගය මුල් වසර කිහිපය තුළ ඉතා අඩුවුවද, මෑත වසරවලදී එය ඉතා වැඩි වී ඇත.

රජය විසින් ලබාගන්නා ඔනෑම විශාල ණයක් ගැන සිතා බලන විට, ණය මුදල් පාලනයට සම්බන්ධ ප්‍රශ්න හැරුණ විට, ගෙවුම් ශේෂ ගැටළුවලින් අනූන මහා ණය බරකට කරගහන්නට සිදුවීම ස්වාභාවිකය.

මෙහිදී ණය බරෙහි කාල සීමාව හා එක් එක් පරම්පරාවට ඉන් ලැබෙන ප්‍රතිලාභයේ වටිනාකමද විභාග කර බැලිම වටී. සේවා වියුක්ත සම්පත් යොදවා ගැනීම පිණිස ලබාගත් දේශීය ණය වර්තමාන මෙන්ම අනාගත පරම්පරාවටද වාසි සහගත බව ප්‍රකට කරුණක් වුවද, ණය වෙනුවෙන් ගෙවන පොළිය වනාහි

අනාගත බදු ගෙවන්නන් බිල්ලට දී වර්තමාන පරම්පරාවට ලබා දෙන සහනාධාරයක් බැවින් එය ඔවුන්ට එතරම් බල නොපායි. ණය බර සම්බන්ධයෙන් සලකා බලන විට මීට වඩා සාර්ථක ක්‍රමයක් ඇත. එනම්: මහා බැංකුව මගින් පොලී රහිතව කාසි හෝ මුදල් නෝට්ටු අච්චු ගැසීම හා පොලී රහිත ණයට දීම යන ක්‍රම දෙක මගින් නිර්මාණය කරගන්නා මුදල් එබඳු ව්‍යාපෘතීන් සඳහා යෙදවීමය. හුදෙක් උපයෝගී කර නොගත් එබඳු ණය මුදල් නිර්මාණය කරගන්නේ සම්පත් ප්‍රයෝජනයට යොදා ගැනීමේ පරමාර්ථය උදෙසා පමණක් නම් එමගින් එතරම් උද්ධමනයක් ඇතිවිය නොහේ. අනික් අතට, නිෂ්පාදන සාධක මනාප ක්ෂේත්‍රයකට මාරුකිරීම සඳහා මුදල් ණයට ගන්නේ නම්, වෙළඳ පොලෙහි පොලී ප්‍රමාණය වැඩිවී පුද්ගලික ආයෝජන අනුපාතය කෙරෙහිද අහිතකර ලෙස බලපානු ඇත. මෙහිදීද අනාගත පරම්පරාවට ණය බර පැවරෙන අතර දැන් ගෙවන පොලිය වත්මන් පරපුරට ගෙවනු ලබන සහනාධාරයකි.

අවසාන දෙකෙහිදීම, විදේශ ණය වර්තමානයෙහි සැබෑ සම්පත් පැවරීමක් වන අතර, නියැකවම ණයබර අනාගත පරම්පරාව මත පැටවේ. එපමණක්ද නොව විදේශ ණය ගෙවුම් ශේෂය කෙරෙහි කෙලින්ම බලපායි. රජයේ අයවැය පරතරය පියවීම සඳහා ලබාගන්නා ණය ගනුදෙනුවල අපේ ආර්ථික ක්‍රමය තුළට කැවී ගිය විදේශ ණය ප්‍රමාණයක් පවතින බව ප්‍රායෝගික වශයෙන් සලකා බලන කල්හි පෙන්වා දිය හැකිය. එපරිද්දෙන්ම සෘජු විදේශ ණය මුදලකින් නොපියවූ අයවැය පරතරයක් නිසා ගෙවුම් ශේෂ පරතරයක් ඇතිවන බවද සත්‍යයකි. කවර ආකාරයකින් අයවැය පියවුවද, ඕනෑම පරතරයක් ආර්ථිකයේ ජාතික ගිණුම්වල ගෙවුම් ශේෂයේ පරතරයක් වශයෙන් හෝ එසේ නැතහොත් රාජ්‍ය නොවන අංශයේ ඉතිරිකිරීමක් වශයෙන් හෝ ඉස්මතු වනු ඇත. මෙය **කේන්සවාදයේ ආදායම් අනන්‍යතා** (Keynesian Income Identity) රාමුව තුලින් පහසුවෙන්ම දැක්විය හැකිය.

$$* \ Y = C + I + G - T + X - M$$

මෙම ප්‍රකාශය වෙනස් කර නැවත මෙසේ සකස් කළ හැකිය.

$$G - T = (S - I) + (M - X)$$

* සංකේත විග්‍රහය:

Y = දළ ජාතික ආදායම
C = පාරිභෝජනය
I = ආයෝජනය
G = රාජ්‍ය වැය
T = බදු ආදායම
X = අපනයන
M = ආනයන
S = ඉතිරි කිරීම

එක් අංශයක පරතරයක් පියවීම සඳහා ආර්ථිකයේ වෙනත් අංශවලින් මුදල් යෙදවිය යුතුවන බැවින්, රාජ්‍ය අංශයේ අයවැය පරතරයකට පෞද්ගලික අංශයේ ඉතිරිකිරීම්වලින් හා (M — X) වලින් දැක්වූ අයුරු විදේශීය වත්කම් අංශයෙන් පවරා ගැනීමෙන් මුදල් සැපයිය යුතුය. විදේශීය වත්කම් අංශයෙන් ආර්ථිකයට පවරන ලද ඉතිරිකිරීම්, ගෙවුම් ශේෂයේ පරතරයක් ලෙස දැක්වේ. විදේශ ණයෙන් රජයේ අයවැය පරතරය පියවීමට මුදල් සැපයෙන බව මෙයින් අදහස් නොවුවද, රජයේ අයවැය පරතරය මගින් මුළු ආර්ථිකයේ අපනයන ප්‍රමාණයට වැඩිවූ ආනයන ප්‍රමාණයක් ගෙන්වීම සඳහා ඉල්ලුමක් ඇතිවන බව එයින් අදහස් කෙරේ. රජයේ අයවැය පරතරයට අදාළ වැයකිරීම් නිසා සැලසුම් කළ ඉතිරිකිරීම් සැලසුම් කළ ආයෝජන හා සම බවට පත්වන තෙක් ඉපයුම් හා සේවා නියුක්තිය ඉහළ යන බව දැක්විය හැකිය. එසේම සැලසුම් කළ ඉතිරිකිරීම් දේශීය වත්කම් අංශයෙන් මුදා නොහළහොත් විදේශීය වත්කම් අංශයේ පරතරයක් මගින් බලෙන් ලබාගත යුතුය. රජයේ වියදම්වල වැඩිවීමකට (G) පසු බදු වැඩිකිරීමක් (T) සිදු නොකළහොත් කවර අවස්ථාවකදී හෝ එමගින් ආර්ථිකයේ විදේශ ණය පරතරය වැඩිවීම නොවැලැක්විය හැකිය. ආයාත සඳහා ඇති මේ ඉල්ලුම අඩුකිරීමට සාමාන්‍යයෙන් යොදා ගන්නා පිළියම නම් විනිමය අනුපාතයෙහි අගය අඩුකිරීමය. එහෙත් මේ අගය අඩුකිරීම නිසා විදේශීය ගෙවුම් තත්ත්වය තුලනය වන බව සහ රාජ්‍ය හා පෞද්ගලික අංශ දෙකෙහිම ධන ආයෝජනය සඳහා ඉතිරිකිරීම් පෞද්ගලික අංශයෙන් ලබාගත හැකි බවද ස්ථිර වශයෙන් කිව නොහැකිය. බ්‍රිතාන්‍යයෙහි හා ඉතාලියෙහි මෑත අත්දැකීම් අනුව, පුද්ගලික ආයෝජන පුද්ගලික ඉතිරිකිරීම් පමණට ඉහළ නැඟීම හා ගෙවුම් ශේෂ තත්ත්වය, අයවැය පරතරයට සමාන වූ තත්ත්වයකට පහත වැටීමද සිදුවී ඇත.

VIDUS 2-4-9

නව ආර්ථික ප්‍රතිපත්තියේ අංගයක් වශයෙන් අපනයන පිරි සැකසුම් කලාපයට ශිම්තැන

එච්. එන්. එස්. කරුණාතිලක

නියෝජ්‍ය අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව

අපනයන පිරි සැකසුම් කලාපයක් පිහිටුවීම සඳහා කර ඇති යෝජනාවෙහි යෝග්‍යතාවය හා ජාතික ප්‍රතිලාභ හැරුණුවිට, ආර්ථික ප්‍රතිපත්තියෙහි විෂය ප්‍රමාණය හා අරමුණු පිළිබඳ සැලකිය යුතු වෙනසියාවක සංකේතයක් වශයෙන්ද එය පවතී. මීට කලින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජය විසින්ද ශ්‍රී ලංකාවේ අපනයන පිරි සැකසුම් කලාපයක් පිහිටුවීමට අදහස් කරන ලදී. දැඩි පාලන විධිවිධාන සහිත ආර්ථික රාමුවක් ඇතුලත පවා මෙබඳු යෝජනාවක් සලකා බැලීමෙන් පෙනීයන්නේ දැඩි සීමා සහ රජයේ පාලනය යටතේ ගෙන ගිය ආර්ථික ප්‍රතිපත්තිය මුළුමනින්ම අසාර්ථක වූ බව එම රජය පිළිගත්තාසේය. වර්තමාන රජයේ නව ආර්ථික ප්‍රතිපත්තිය දෙස බැලිය යුත්තේ 1956 වසරේ සිට පිළිවෙලින් පැවත ආ ආණ්ඩුවල ප්‍රතිපත්ති අනුව හා අද පවතින තත්ත්වය යටතේ උපාය මාර්ග සියල්ලක්ම අභිනව දිශාවකට අවනත කිරීමේ අවශ්‍යතාවයද අනුවය. 1970 ට පසුව ආර්ථිකය ඉතා දරදඬු ස්වභාවයකට පත්වූ අතර, දේශීය හා විදේශීය ආයෝජනයට ඉතා අහිතකර වාතාවරණයක් ඇතිවිය. ආර්ථිකය දුර්වල කිරීමට තුඩුදුන් අන්තර් නාමඃ ප්‍රතිපත්ති හා හැම අංශයකම විහිදී ගිය සීමා කිරීම්ද පනවා තිබුණේය.

දැඩි පාලන ක්‍රම ඇති කිරීම

දෙවන ලෝක සංග්‍රාමයෙන් ශ්‍රී ලංකාවට පාලන ක්‍රම පද්ධතියක් උරුම වූ අතර එම කාලයේ පටන්ම ශුභ සාධන වියදම් රාශියක් සඳහා මුදල් වැය කිරීමටද සිදුවී ඇත. මේවා පසුගිය දශක දෙක ඇතුලතදී ශීඝ්‍ර සංවර්ධනය ඉදිරියේ ප්‍රධානතම බාධක වශයෙන් පැවති අතර ඇතැම් අංශ මුළුමනින්ම වාගේ අකර්මන්‍ය වීමට හා ආර්ථික සංවර්ධනය ගැන අන්තර් නාම්‍ය ආකල්පයකින් කටයුතු කිරීමටද හේතු විය. විදේශ විනිමය පාලන රෙගුලාසි යුද්ධ කාලය තුල පනවන ලද ඉතා වැදගත් සීමාකිරීම් විය. යුද්ධය අවසන්වූවාට පසුවද විදේශීය විනිමය ඉතිරිකරගැනීමේ පරමාර්ථය ඇතිව මෙම සීමාකිරීම් තවදුරටත් එලෙසම පවත්වාගෙන යන ලදී. විදේශීය වෙළඳාම ලාංකික කිරීමේ අදහස ඇතිව 1950 ස් ගණන්වලදී ආනයන සීමාකිරීම් ආරම්භ කිරීමෙන් පසුව ප්‍රධාන වශයෙන් බලපත් නිකුත් කරනු ලැබුයේ ලාංකික වෙළඳුන්ට හා ලාංකික සමාගම්වලටය. 1960 ට පසුව දැඩි සීමාකිරීම් පැනවීමෙන්, ගෙවුම් ශේෂ තත්ත්වය වර්ධනය කරගැනීමට හා කර්මාන්තවල ආයෝජනය වැඩිකර ගැනීමටත් හැකිවේ යයි පාලකයෝ විශ්වාස කළහ. විදේශ ධනය උපයාගත හැක්කේ අපනයන විවිධාංගී කරණය මගින් හා විදේශ ආයෝජන පොළඹවා ගැනීමෙන් නොව පවත්නා අපනයනවලින් හා ආනයන කපාහැරීමෙන්ය යන මතය ඇතිවීමට හේතුවූයේ එකල පැවති යල් පැනගිය ගෙවුම් ශේෂ පිළිබඳ සංකල්පය නිසයි.

පණස් ගණන්වල මුල් අවධියේ පැවති ලිහිල්වූ හා නිර්බාධ ආර්ථිකය වෙනුවට දැඩි සීමාකිරීම් සහිත ආර්ථිකයක් බිහිවිය. විදේශ ධන සංචිත ක්ෂය වෙමින් පවතින අවස්ථාවලදී කළ යුත්තේ සීමාකිරීම් පැනවීම නොව විදේශ ආයෝජන පොළඹවා ගැනීම බව පාලක පක්ෂයට නොවැටහිණ. ආර්ථිකය තුළ එතරම් සීමා කිරීම් නොවිණි නම් හා ජාතියෙහි ආර්ථික දේහය පාලනය කිරීමට රජය ඉදිරිපත් නොවිණි නම් ශ්‍රී ලංකාවේ සංවර්ධන කාර්යාවලිය මීට වඩා වෙනස් මාර්ගයක් ගැනීමට ඉඩ තිබිණි. විශේෂයෙන් දේශීය හා විදේශීය ව්‍යවසායයන් ජනසතු කිරීමේ ප්‍රතිපත්තිය හේතු කොටගෙන ආයෝජන සඳහා පැවති ආර්ථික වාතාවරණය අහිතකර වූ බැවින් 1956 ට පසු විදේශීය ආයෝජකයෝ මෙරටින් ඈත් වූහ. ආර්ථිකය විවිධාංගීකරණය සඳහාද එය අපනයනයට නැඹුරු කිරීම සඳහාද පියවර ගතහැක්කේ දැඩි පාලනයක් යටතේ නොව නීතිරීති ලිහිල් කළ වාතාවරණයක් යටතේය.

නිදහස් වෙළඳ කලාපයක් පිහිටුවීමේ යෝජනාව අගැයුම් කළ යුත්තේ අපනයන විවිධාංගීකරණයට හා අනුබල දීමට මෙන්ම දේශීය කර්මාන්ත සඳහා එතෙර වෙළඳපොළෙහි තැනක් ලබා ගැනීමටද ඇති ඉඩකඩ අනුසාරයෙනි. පසුගිය වසර දහගහ ඇතුලත දී ශ්‍රී ලංකාවේ සංවර්ධනය බෙහෙවින් කර්මාන්ත අංශයට නැඹුරුවී ඇත. කෘෂිකර්මයෙහි සැලකිය යුතු ප්‍රගතියක් දක්නට තිබුණද ප්‍රධාන ක්‍රම සම්පාදකයෝ නගරබද්ව අලුතින් පිහිටුවන ලද කර්මාන්තශාලාවල ශුභ සාධනය පිළිබඳව වඩා සැලකිලිමත් වූහ. ආරම්භයේ පටන් ඔවුනට අයබදු හා වෙනත් දිරිගැන්වීම් පිරිනමන ලදී. විවිධ ප්‍රමාණයෙන් යුතු නව කර්මාන්ත 2500 ක් පමණ ඇතත් මේවායින් වැඩි ගණනක්ම පවත්වාගෙන එන ලද්දේ අභ්‍යන්තර වෙළඳ පොළෙහි ඔවුන්ට ලබාදී තිබුණ දැඩි ආරක්ෂාව හේතුකොට ගෙනය. දැඩි ආරක්ෂාව සලසන තීරුබදු හා විදේශික වෙළඳ තරඟයෙන් ඔවුන් මුළුමනින්ම ආරක්ෂා කෙරුණු නිසා දේශීය විකුණුම් ඉතා ලාභදායක වී ඇත.

අපනයන වැඩ කටයුතු

සුරක්ෂිත වෙළඳ පොලක, භාණ්ඩ විරලවූ අවස්ථා යටතේ කර්මාන්ත කරුවෝ භාණ්ඩයක විකුණුම් මිල, ලාභාන්තය හා සිය නිෂ්පාදන වල තත්ත්වය පවා නිර්ණය කරති. විවිහිස, පරිවර්ත්‍ය රුපියල් ගිණුම්, අමුද්‍රව්‍ය හා යන්ත්‍රෝපකරණ සඳහා අඩු තීරුබදු, අපනයන භාණ්ඩ වෙනුවෙන් බදු සහන හා නොමසුරු ලෙස විදේශීය විනිමය වෙන්කරදීම් බඳුවූ කොතෙකුත් දිරිගැන්වීම් තිබුණද ශ්‍රී ලංකාවේ කර්මාන්තකරුවන් වැඩි දෙනෙක්ම භාණ්ඩ අපනයනය කිරීමට සමත්වී නැත. අපනයන සංවර්ධන කාර්යාංශය වැනි විශේෂඥ ආයතන පිහිටුවීමෙන් පවා ශ්‍රී ලංකාවේ අපනයන කටයුතුවල එතරම් වෙනසක් සිදුවී ඇති බවක් නොපෙනේ. කාර්මික හා නිෂ්පාදිත භාණ්ඩවල අපනයන සංඛ්‍යා අනුව පෙනීයන කරුණක් නම් මෙම අංශයේ ඉපැයුම්වලින් වැඩි කොටසක්ම ලැබී ඇත්තේ පිරිපහදු ඛණිජ තෙල් නිෂ්පාදන ද්‍රව්‍යවලින් වන බවය. 1976 නිෂ්පාදිත අපනයනයන්ගෙන් ලැබුණු රු. දශලක්ෂ 755.7 ක මුළු ඉපයුම්වලින් රු. දශලක්ෂ 505.2 ක්ම ලැබී ඇත්තේ ඛණිජ තෙල් නිෂ්පාදන ද්‍රව්‍යවලිනි. නිෂ්පාදකයන් රු. දශලක්ෂ 250.5 ක් පමණ උපයාගත් අතර එය මුළු අපනයන වටිනා කමෙන් 5% ක් වන අතර කාර්මික භාණ්ඩ අපනයනය කිරීමෙන් ලබාගත් ආදයමෙන් 30% ක් පමණි. භාණ්ඩ අපනයන කටයුතුවල නිෂ්පාදකයන් සාපේක්ෂක වශයෙන් බලන කල උදාසීන වීමට හේතුවූ සාධක කිහිපයකි. නිෂ්පාදනවල තත්ත්වය විදේශීය ගැනුම් කරුවන්ගේ නියම අවශ්‍යතාවලට අනුකූල නොවූ බැවින් නිෂ්පාදක යන්ට අපනයන ඇණවුම් පවත්වාගෙන යාම ලෙහෙසි පහසු කාර්ය යක් නොවිය. ස්ථාපිත වෙළඳ පොලවල් ඇති පිළිගත් ජාත්‍යන්තර සමාගම් සමඟ සම්බන්ධතා ඇතිකරගෙන ජනප්‍රිය වෙළඳ නාම යටතේ ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි නොකිරීමද මෙයට හේතුවූ තවත් කරුණකි.

අපනයන කෙරෙහි බලපෑම

අපනයන පිරිසැකසුම් කලාපයක් පිහිටුවීමේ එක් ප්‍රධාන පරමාර්ථ-යක් නම් නියත විදේශීය වෙළඳ පොලක් ලබාගත හැකි ඉතා උසස් තත්ත්වයෙන් යුතුවූ භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා දේශීය සහභාගිත්වය සහිතව හෝ රහිතව හෝ පිළිගත් සමාගම් ලවා භාණ්ඩ නිෂ්පාදනය කරවා ගැනීමය. ඉන්දියාවේ දේශීය වෙළඳ පොලට මෙන්ම අපනයනය සඳහාද භාණ්ඩ නිෂ්පාදනය කරන සමාගම් ගණනාවක්ම එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ජර්මනිය, ප්‍රංශය හා ජපානය යන රටවල ප්‍රධාන නිෂ්පාදන සමාගම් සමග බැඳීම් ඇතිකරගෙන ඇත. ඉන්දියාවේ භාණ්ඩ අපනයනය

බෙහෙවින්ම සාර්ථකවී ඇත්තේ මෙම සම්බන්ධතාවල ප්‍රතිඵලයක් වශයෙනි. මෙම පිළිවෙල අනුගමනය නොකළහොත් ශ්‍රී ලංකාවට සිය නිෂ්පාදන අපනයනය කිරීමෙහිලා එතරම් සාර්ථක ප්‍රතිඵල ලබාගත නොහැකිවනු ඇත. අපගේ අරමුණ විය යුත්තේ, කාර්මික නිෂ්පාදන අපනයන පිළිබඳ වර්තමාන මට්ටම රු. දශලක්ෂ 250 සිට රු. දශලක්ෂ 1000 දක්වා වැඩිකර ගැනීමය. උදහරණ වශයෙන් 1976 දී සම්ප්‍රදායික නිෂ්පාදන ද්‍රව්‍යයක් වන තේ විකුණුම්වලින් රු. දශලක්ෂ 2100 ක විදේශ විනිමය ලැබී ඇත.

අපනයන පිරිසැකසුම් කලාපය ක්‍රියාත්මක වීමෙන් පසුව එම කලාපයේ ආයෝජනය කරන ව්‍යාපාරිකයන් වෙත අපනයන කටයුතු සංවර්ධනය කිරීමේ ප්‍රධාන වගකීම පැවරේ. ඊට හේතුව නම් විදේශීය වෙළඳ පොළවල් ගැනද අපනයනය සඳහා භාණ්ඩ සකස්කිරීම, ඇහිරීම ගැනද අලෙවිකිරීමේ ශිල්පීය ක්‍රම ගැනද මනා අවබෝධයක් ඔවුන්ට ඇති බැවින් අපනයන සංවර්ධන අධිකාරිය වැනි නිල මට්ටමේ ආයතනවලට වඩා එතෙර වෙළඳාම දියුණු කිරීමට හැකි තත්ත්වයක ඔවුන් සිටීමයි. එසේවුවද දැනට පවත්නා අපනයන සංවර්ධන ආයතනවලට ශ්‍රී ලංකාවේ අපනයන පිරිසැකසුම් කලාපයෙන් පරිබාහිරවූ අපනයන පිළිබඳව තවදුරටත් කටයුතු කිරීමට භාර කළ යුතුය. කාර්මික සංවර්ධනයෙහි අන්තර් නම්‍ය ආකල්පය සහ ශ්‍රී ලංකාවේ සීමිත වෙළඳ පහසුකම්ද හේතු කොටගෙන කාර්මික ව්‍යාප්තිය සෑහෙන දුරට වැලකී ඇත. වර්තමාන ආදයම් මට්ටම සහ නිෂ්පාදන භාණ්ඩ සඳහා ඇති ඉල්ලුමද සලකා බලන විට, රටෙහි සම්පූර්ණ අවශ්‍යතාවන් සැපයීම සඳහා මධ්‍යම ප්‍රමාණයේ හෝ විශාල ප්‍රමාණයේ කර්මාන්තශාලා එකක් හෝ දෙකක් පමණක් ප්‍රමාණවත් වනු ඇත. රජයේ හා පෞද්ගලික අංශයේ ඇතැම් විශාල කර්මාන්තශාලාවලට සම්පූර්ණ ධාරිතාවයම යොද ගැනීමට නොහැකිවනුයේ වෙළඳ පොල සීමිත වන බැවින් හා මෙම සීමිත වෙළඳ පොළෙහි ව්‍යාප්තිය සඳහා ඉඩකඩ නොමැති වීමය. ශ්‍රී ලංකාවේ මුදල් හා සැබෑ ආදයම් මට්ටම් ඉහළ නැඟ නැති බැවින් අභ්‍යන්තර ඉල්ලුම වැඩිකිරීම සඳහා ක්‍රය ශක්තිය පළල්වීයාමක් සිදුවී නැත. ජනයා තමවත් සිය ආදයමෙන් වැඩි කොටසක් ආහාර හා ඇඳුම් පැළඳුම් වැනි මූලික අවශ්‍යතාවන් සඳහා වැය කිරීමට පුරුදුවී සිටිති. එපමණක්ද නොව පසුගිය අවුරුදු 4–5 දක්වා කාලය තුළ උද්ධමනය ඉහළ නැග එය සැබෑ ආදයම කෙරෙහි බලපෑ බැවින් නිෂ්පාදිත භාණ්ඩ සඳහා පවතින ඉල්ලුම, වැඩිවූ මුදල් ආදයම හා සමානුපාතිකව වැඩිවී නැත.

දැනට පවත්නා රාමුව තුළ කර්මාන්ත අංශයෙහි සේවානියුක්තිය වැඩිකළ හැක්කේ, ධාරිතා උපයෝගිතාවය වැඩිකොට නැතිනම් නව කර්මාන්ත ඇතිකොට වෙළෙඳපොල විශාල කරගැනීමෙන් සහ නිෂ්පාදන මට්ටම වැඩිකර ගැනීමෙනි. ශ්‍රී ලංකා නිෂ්පාදන සඳහා ඉල්ලුමෙහි සැලකිය යුතු වැඩිවීමක් ඇතිවිය හැක්කේ දේශීය ඉල්ලුම වැඩිකර ගැනීමෙන් නොව අපනයන මට්ටම වැඩිකර ගැනීමෙනි. මෙරට දශලක්ෂ 5.2 ක් පමණ වන මුළු සේවා නියුක්තියෙන් මේ වනතෙක් පුද්ගලික හා රාජ්‍ය අංශයේ කර්මාන්ත මගින් රැකියා සපයා ඇත්තේ 150,000 කට පමණි. එනම් මුළු ප්‍රමාණයෙන් සියයට දෙකකට පමණි. නිෂ්පාදනයෙහි හා නව රැකියා උත්පාදනයෙහි කාර්මික අංශයෙන් ඉටුවුණ සේවය ඉතාමත් සීමිතවූ අතර, පසුගිය වසර කිහිපය තුළ කාර්මික සේවාවල නියුක්තව සිටි මුළු සේවක සංඛ්‍යාවෙහි එතරම් වෙනසක් සිදුවී නැත. අතිරික්ත ධාරිතාව හා බොහෝවිට අනුචිත තාක්ෂණය ව්‍යවහාර කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් කර්මාන්තවල ශ්‍රම අවශෝෂණ ධාරිතාව බෙහෙවින් අඩුවී ඇත. වර්තමාන තත්ත්වය යටතේ අපනයන පිරිසැකසුම් කලාපය විසින් උත්ප්‍රේරකයක් වශයෙන් ක්‍රියාකොට මුළුමනින්ම පාහේ නිෂ්ක්‍රිය බවට පත්ව ඇති නිෂ්පාදන අංශය කර්මණ්‍ය බවට පත්කිරීම සඳහා අවශ්‍ය ප්‍රේරණය ලබාදිය හැකිය.

මෙම කලාපයේ වැඩ කටයුතු සාර්ථකවීම හා විදෙස් ආයෝජන ඇද ගැනීමේ හැකියාව රඳා පවතිනුයේ යෝග්‍ය ප්‍රතිපත්ති හා රජය මගින් සලසන අනුග්‍රහය මතය. පාලන නීතිරීති ලිහිල් කිරීමෙන් හා වඩාත් තාත්වික වූ විනිමය අනුපාතික හඳුන්වා දීමෙන්ද ආර්ථිකය නිදහස් කිරීම නිසා ආයෝජනය සඳහා සතුටුදයක වාතාවරණයක් ඇතිවෙනවා පමණක් නොව නිලධාරි තන්ත්‍රයේ පාලනයේ බලපෑම අඩුවී තමන් විසින්ම තීරණවලට එළඹීම සඳහා වැඩි නිදහසක් ලැබීමද ආයෝජකයන් දිරිගැන්වීමට හේතුවනු ඇත. රජයේ මැදිහත්වීම ඉතාමත් අල්පවන බැවින් ආයෝජකයා තුළ විශ්වාසයක් හා ධෛර්යයක්ද හටගනී.

කර්මාන්තවල ස්වභාවය හා බලපෑම

දේශීය කර්මාන්ත හිමියන්ට සිය කර්මාන්ත සංවර්ධනය කරගැනීමට අනුබල හා අනුග්‍රහ ගණනාවක්ම ලබාදී ඇත. එක්දහස් නමසිය හැට ගණන් හා හැත්තෑ ගණන්වල ආරම්භ කළ කර්මාන්තවලින් වැඩි ගණනක්ම වර්ධනයට හා පැවැතීමට ආධාරකවූ බදු විරාම, සංවර්ධන ප්‍රතිදාම සහන හා වෙනත් අනුබලදීම් ඔවුන් විසින් ප්‍රයෝජනයට ගත් කාලය දැන් අවසන් වී ඇත. අපනයන පිරිසැකසුම් කලාපයේ ආයෝජනවලින් තමන් නැත්තටම නැතිවේය යන බියක් දේශීය කර්මාන්තකරුවන් තුළ ඇතිවී ඇත. මෙය හේතු විරහිත බියකි. මක්නිසාද යත්, රටේ අනිකුත් අපනයන කර්මාන්තවලට ලබාදී ඇති අනුග්‍රහවලට වැඩියෙන් අනුග්‍රහ අපනයන පිරිසැකසුම් කලාපයට සලසාදීම සිදුවිය නොහැකිවන බැවිනි. එඩීම වුවහොත් ඔවුන්ට බදු විරාමයක් සහ ශ්‍රී ලංකාවේ අනිකුත් කර්මාන්තවල මූලාරම්භ වර්ෂයේදී භුක්ති විඳි අනිකුත් සියලුම වරප්‍රසාද ඔවුන්ටද හිමිවනු ඇත. මේ හැරුණු විට අපනයන පිරිසැකසුම් කලාපය විසින් භුක්ති විඳිනු ලබන අනිකුත් වැදගත්ම වාසිය නම් නිලධාරිවාදයේ පාලන නීතිරීති හා පරිපාලන අඩාල කිරීම්වලට හසුනොවී එහි ආයෝජකයන්ට සිය කටයුතු කරගෙන යාමට හැකිවීම හා රටට සාමාන්‍යයෙන් අදාලවන රේගු කාර්ය පටිපාටියෙන්ද ඇතිවන බලපෑම් බොහෝදුරට අඩුවීමය. අපනයන පිරිසැකසුම් කලාපයේ කර්මාන්ත තරඟ කරනුයේ අනිකුත් අපනයන කර්මාන්ත සමඟ මිස දේශීය වෙළඳ පොළට භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්තයන් හා සමඟ නොවේ. අපනයන කර්මාන්ත දේශීය වෙළෙඳ පොළ සඳහා භාණ්ඩ නිපදවන අනිකුත් කර්මාන්තවලට වඩා කාර්යක්ෂමය. එපමණක්ද නොව කලාපයෙහි නිපදවනු ලබන භාණ්ඩ සාමාන්‍යයෙන් මෙරට වෙළඳපොළට නොපිවිසෙන නමුදු ඒවා මෙහි අලෙවි කළහොත් සාමාන්‍ය තීරු ගාස්තු හා පිරිවැටුම් බදු ගෙවිය යුතුවේ. එමනිසා රටෙහි අනිකුත් කර්මාන්තවලට ආරක්ෂාව සැලසෙනු ඇත.

තමන් භාවිතාකරන තාක්ෂණයන්, නිෂ්පාදන ක්‍රම හා සිය නිෂ්පාදන භාණ්ඩවල කේවලත්වය නිර්ණය කරගැනීමේ නිදහස කලාපයේ ආයෝජකයන් සතුවනු ඇත. එමෙන්ම ඔවුන්ට උවමනා කවර භාණ්ඩයක් වුවද නිපදවීම ට ඔවුන්ට නිදහස ඇතැයි සැලකිය හැකිය. එතෙකුදු වුවත් එම නිෂ්පාදන සියල්ලම අපනයනය කළ යුතුවේ. කම්කරු නීති හා රෙගුලාසි වඩාත් ලිහිල්ව අදාලවනු ඇත. නිෂ්පාදන භාණ්ඩ අපනයනය සඳහා වන බැවින් නිෂ්පාදකයන් ස්ථිරවම ලෝක වෙළෙඳපොලෙහි සිය තත්ත්වය තහවුරු කර ගැනීමට නම් ඔවුන් විසින් ලොව සෙසු රටවල තාක්ෂණික අභිවර්ධනය හා කාලානුරූප විය යුතුය. කලාපය ඇතුලත යන්ත්‍ර සූත්‍රවලට ශ්‍රමිකයන් වැඩියෙන් යොදගන්නා තාක්ෂණ ක්‍රම ඒකාකාරවම භාවිතා කරනු ලැබේ යයි මින් අදහස් නොවේ. ඉලෙක්ට්‍රෝනික භාණ්ඩ, වාහන හා යන්ත්‍ර කොටස් හා රසායනික ද්‍රව්‍ය බඳුවූ නිෂ්පාදන සම්බන්ධයෙන් නව සංකීර්ණ උපකරණ ආනයනය කරනු ලැබීමට ඉඩ ඇති බැවින් මෙම කර්මාන්තවලින් සැලසෙන සේවා නියුක්තිය අපේක්ෂිත ප්‍රමාණයට වඩා අඩුවනු ඇත. ඇඳුම් පැළඳුම්, භාණ්ඩ එකලස් කිරීම, රසකැවිලි නිෂ්පාදනය, ටින්කැම ඇහිරීම හා කෘෂිපාදක කර්මාන්ත ක්ෂේත්‍රවල සේවා නියුක්තිය සඳහා සෑහෙන ඉඩ ප්‍රස්ථාව ඇත. සියළුම කර්මාන්ත සඳහා ශ්‍රමාධික තාක්ෂණ ක්‍රම උපයෝගි කර ගැනීම අපේක්ෂා කළ නොහේ.

එමනිසා කලාපය ඇතුලත කර්මාන්තවල සංකලනයක් දක්නට ලැබිය හැකිය. සමහර ඒවා නව සංකීර්ණ තාක්ෂණයන් පදනම් කර ඇති අතර අනිකුත් කර්මාන්ත ශ්‍රමාධික ඒවා වනු ඇත. එසේ වුවද මෙහි පිහිටුවනු ලබන කර්මාන්තවලින් වැඩි ගණනක්ම පිහිටුවනු ලබනුයේ අඩු වැටුප් පිරිවැයෙන් වාසි ලැබ ගැනීමට බැවින් කර්මාන්ත වැඩි ගණනක්ම ශ්‍රමාධික ක්‍රම උපයෝගී කරගැනීම හා ලාභදයක ලෙස ශ්‍රමය යෙදවිය හැකිවන ආයෝජන තෝරා

ගැනීමද කරනු ඇත. රජයේ මනාපයට ගැළපෙන කර්මාන්ත පිහිටුවීමට උපයෝගී කරගත හැකි එක් සාධකයකි මෙය. මේ පදනම මත කලාපය ඇතුලත මාස 18 කදී 50,000 කට සේවා නියුක්තිය සැලසිය හැකිවේ. බටහිර රටවල් රෙදිපිළි නිෂ්පාදනය සම්බන්ධයෙන් පනවා ඇති සලාක සීමා ගැන දැඩි ක්‍රියා මාර්ගයක් නොගන්නේ නම් වෙනත් රටවල්හි දැනටමත් නිෂ්පාදන කටයුතු වල නිරතව ඇති ඇඳුම් නිෂ්පාදකයෝ මෙහි පැමිණීමට ඉඩ ඇත. මුල් වර්ෂයේදී කලාපය තුළ ඇඳුම් නිෂ්පාදන ඒකක 10 ක් පිහිටුවුවහොත්, එමගින් මෙම කර්මාන්තවල පමණක් 30,000 හා 40,000 අතර රැකියා සංඛ්‍යාවක් ඇතිකළ හැකිවනු ඇත.

මීට අමතර වශයෙන් කලාපය තුළ ප්‍රාථමික සේවා නියුක්තිය හේතු කොටගෙන රටේ අනිකුත් කොටස්වල ඒ හා සමාන රැකියා සංඛ්‍යාවක් බිහිවනු ඇත. මේවා වැඩි වශයෙන් ප්‍රවාහණය, සන්නිවේදනය, දැන්වීම් පලකිරීම, බඩු ඇසිරීම, පාඩත්තු කිරීමේ කටයුතු, ආහාර අමුද්‍රව්‍ය හා විනෝදස්වාදය සැපයුම ආදී සේවා හා සම්බන්ධ වනු ඇත. කලාපය තුළ වැටුප් හා වේතන රටේ වෙනත් පලාත්වල වැටුප්වලට වඩා වැඩි විය හැකි අතර මෙම මුදල් කලාපය තුළ සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන් විසින් මෙරටෙහිදී වියදම් කරනු ලැබේ. කඩිනමින් සිය මෙහෙයුම් ආරම්භ කිරීමට උනන්දුවක් දක්වන කර්මාන්ත විසින් රටෙහි අනිකුත් කර්මාන්තවලින් පුහුණු සේවකයන් ලබාගැනීමට තැත්කිරීමට ඉඩ ඇති නිසා එබඳු සේවකයන් බඳවාගැනීමට වැඩි වැටුප් පිරිනැමිය යුතුවේ. පුහුණු සේවකයන් කලාපය තුළට ඇදීයාමෙන් රටේ වෙනත් පලාත්වල ස්ථාපිත පැරණි ආයතනවල පුහුණු කිරීමේ හා රැකියා සැලසීමේ නව මං විවෘත වනු ඇත. මෙම කාර්යාවලියෙන් පුහුණු සේවකයන් හා මධ්‍ය කළමනාකරණ විශේෂඥ දැනුම වැඩියෙන් විසරණය වීම සිදුවනු ඇත. කලාපයෙහි අලුත් රැකියා ඇතිවීමේ බලපෑම කලාපයට පමණක් සීමා නොවී නොයෙකුත් ආකාරයෙන් රටේ අනිකුත් ප්‍රදේශවලටද පැතිර යනු ඇත.

අපනයන පිරිසැකසුම් කලාපයේ ව්‍යාපාරමය කටයුතු නිෂ්පාදනයට පමණක් සීමා නොවනු ඇත. මූල්‍ය, බැංකු හා ආනයන අපනයන වාණිජ මධ්‍යස්ථාන බඳුවූ ක්ෂේත්‍රවල නව කටයුතුවල දියුණුවත් සමඟම කලාපයේ කටයුතු ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වීමට ඉඩ ඇත්තේය. කලාපයට ලබාදෙන අනුග්‍රහ මෙම අනිකුත් ව්‍යාපාර වර්ධනය වීමට උත්තේජකයක් වනු ඇත. නැවකින් තවත් නැවකට බඩු මාරු කිරීම, ප්‍රති-අපනයනය හෝ අපනයනය සඳහා භාණ්ඩ තවදුරටත් පිරිසැකසුම් කිරීමට හෝ දේශීය වෙළඳ පොළට ඒවා රේගු ගාස්තු නොගෙවා ආනයනය කිරීම සඳහා ගෙනයාම කළ හැකිය. රේගු ගාස්තු හා වෙනත් ගාස්තුවලින් ලැබෙන සහන භුක්ති විඳීම සඳහා කලාපය ඇතුළත ක්‍රියාත්මක වන සමාගම් විසින්, භාණ්ඩ එකලස් කිරීම, නිෂ්පාදනය කිරීම හෝ විසන්ධි කළ කොටස් ගබඩා කර තැබීම යනාදී කටයුතුවලද නිරතවනු ඇත. ශ්‍රී ලංකාව ඇතුළු වෙනත් බොහෝ රටවල් ඉතාමත් අධික රේගු ගාස්තු හා බදු අයකරන බැවින් අපනයන පිරිසැකසුම් කලාපයට ආනයනය කරනු ලබන භාණ්ඩ රටෙහි අනිකුත් පළාත්වලට අදාලවන බදු අයකිරීම් ගාස්තු හා එබඳු වෙනත් රෙගුලාසිවලින් නිදහස්වනු ඇත.

ක්‍රියාකාරවුම් සීමා

අපනයන පිරිසැකසුම් කලාපය ඇතුලත ක්‍රියාත්මක වන සමාගම්වලට බදු සහන හා අනුග්‍රහ අදාලවුවද එබඳු අනුග්‍රහ රටේ සිවිල්, වාණිජ හා බැංකු නීතිවලට යටත්වනු ඇත. වාණිජ හා බැංකු සමාගම් ලියාපදිංචි කිරීම මහජන සෞඛ්‍යය, ආරක්ෂාව, දණ්ඩ නීතිය හා පරිසර සංරක්ෂණය ආදිය පිළිබඳ නීති මීට ඇතුලත්වනු ඇත. කලාපය ඇතුලත ව්‍යාපාරමය හා පුද්ගලික බදු පවා අදාලවනු ඇත. සත්කාරක රටට සෘජු ආදායම ලැබෙනුයේ පුද්ගලික බදු හා නිෂ්පාදන වෙනුවෙන් අයකරනු ලබන සුළු ප්‍රමාණයක පිරිවැටුම් බදුවලිනි. කලාපය ව්‍යාප්තවීමත් සමඟම මෙය සැලකිය යුතු ආදායම් මාර්ගයක් බවට පත්වීමට ඉඩ ඇති අතර සපයනු ලබන සේවා වෙනුවෙන් අයකරන පිරිවැටුම් බද්දෙන්ද ආදායම් ලබාගත හැකිය. කලාපයේ නිපදවන ලද භාණ්ඩ පැහැදිලිවම නියම කළ යුතු මායිම්වලින් පිටත රටේ වෙනත් ප්‍රදේශවලට යැවීමේදී එම භාණ්ඩ තීරු ගාස්තුවකට යටත් විය යුතුය. හොර බඩු ජාවාරම් හා අනවසරයෙන් බඩු වෙළඳාම් කිරීම වැලැක්වීම සඳහා කලාපයට අයත් කඩවත් සීමාවල තීරුබදු අයකිරීමේ ක්‍රමයක් පවත්වාගෙන යාම අවශ්‍ය වනු ඇත.

කලාපය ඇතුලතට විවිධ වර්ගවල භාණ්ඩ ගෙනගිය හැකි වුවද, සාමාන්‍යයෙන් සත්කාරක රට තුළට ගෙනයාමට තහනම් කර ඇති භාණ්ඩ ගෙනගිය නොහැක. සාමාන්‍යයෙන් සත්කාරක රටතුළට ගෙනයාමට තහනම් කොට ඇති මත්ද්‍රව්‍ය, අනතුරුදායක බෙහෙත් ද්‍රව්‍ය, අවි ආයුධ, වෙඩි බෙහෙත්, අගනා ලෝහ හා අනර්ඝ මැණික් ආදිය කාර්මික අවශ්‍යතාවයන් සඳහා මිස අපනයන පිරිසැකසුම් කලාපය තුළට ගෙනාගිය නොහැක. කලාපය ඇතුලතදී එහි නිපදවූ භාණ්ඩ සිල්ලරට වෙළඳාම් කිරීම් තහනම් කළ යුතු අතර, යම් හෙයකින් සිල්ලර වෙළඳාමට අවසර ලබාදුනද එය රටට සාමාන්‍යයෙන් අදාල වන රෙගුලාසිවලට යටත්වනු ඇත.

තීරුගාස්තු හා වෙනත් බදුවලින් තොරව පාරිභෝගික භාණ්ඩ මිලදී ගතහැකි නිදහස් තොටුපළක් සමඟ සංසන්දනය කොට අපනයන පිරිසැකසුම් කලාපය වරදවා තේරුම් නොගත යුතුය. සංචාරකයන්ට හා විදේශීය අමුත්තන්ට විදෙස් මුදල් ගෙවා භාණ්ඩ මිලදී ගත හැකි තීරු බද්දෙන් නිදහස් සාප්පු සංකීර්ණයක් කලාපය තුළ තිබිය හැකිය. එපමණක් ද නොව, ව්‍යාපාරිකයන් ජ්‍යෙෂ්ඨ තාක්ෂණික, කළමනාකරණ හා විශේෂඥ නිලධාරීන් හැරුණු විට අපනයන පිරිසැකසුම් කලාපය තුළ සාමාන්‍ය ජනයාට පදිංචි වීමට ඉඩ නොදෙනු ලැබේ. සේවකයෝ සාමාන්‍යයෙන් කලාපය ඇතුලතට වැඩට පැමිණෙති. කලාපයෙන් විස්තීරණ ප්‍රදේශයක් ආවරණය නොවන බැවින්, එය තුළ වාසය සඳහා අනුබල නොදෙනු ඇත. ඉඩම් මිල අධිකවන බැවින්ද කලාපය ඇතුලත නිවෙස් ඉදිකිරීම සම්පත් අපතේ යැවීමක් වනු ඇත. එපමණක්ද නොව කලාපය ඇතුලත වෙසෙන ජන සංඛ්‍යාව අල්පවූ විට ආරක්ෂා විධිවිධාන පවත්වාගෙන යාමද පහසුවනු ඇත. කටුනායක අවට අපනයන පිරිසැකසුම් කලාපය මධ්‍යම හා කුඩා පරිමාණ කර්මාන්ත සඳහා වෙන්කර ඇති බැවින්, ප්‍රදේශය තුල නිවාස ඉදිකිරීමට අනුබල නොදෙනු ඇත. එසේවුවද තදාසන්න ප්‍රදේශවල නිවාස ඉදිකළ යුතුවේ.

ආයෝජකයන්ට ලැබෙන වාසි

විදේශීය ආයෝජකයන්ට අපනයන පිරිසැකසුම් කලාපයෙන් ලබාගතහැකි ප්‍රතිලාභ බොහෝය. මෙයින් වඩාත්ම වැදගත්වනුයේ ව්‍යාපාරිකයන්ට හා වෙළඳුන්ට තීරු ගාස්තු, ආනයන බදු ගෙවීම හෝ බන්ධිත භාණ්ඩ වෙනුවෙන් අරමුදල් හිර නොකර අරමුදල් උපයෝගී කරගැනීමට ඉඩ තිබීමය. විදේශ විනිමය ලබාගැනීමෙහි දුෂ්කරතාවයක් නොවන බැවින් ඔහුට ලෝක වෙළඳ පොළෙහි අමුද්‍රව්‍ය සඳහා පවතින අඩුමිලෙන් ප්‍රයෝජන ගෙන ඒවා තොග වශයෙන් ආනයනය කිරීම කළ හැකිය. අපනයන පිරිසැකසුම් කලාපයෙහි අමුද්‍රව්‍ය පිරිපහදු කිරීමට හෝ ඒවා යළි අපනයනය කිරීම සඳහා තවදුරටත් පිරිසැකසුම් කිරීමටද කර්මාන්ත ඇතිකළ හැකිය. එබඳු අවස්ථාවලදී එකතුවූ අගයෙහි අධිකයක් ඇතිවන අතර භාණ්ඩයේ කේවලත්වය උසස්වීම නිසා වටිනාකම අනුව නොව විශේෂිත පදනමක් මත බදු අයකළ හොත් ආනයන කරන රටට නැව්කුලී හා තීරු ගාස්තු සැහෙන ප්‍රමාණයක් ඉතිරි කරගත හැකි අතර අපනයනකරුටද වැඩි මිලක් ලැබෙනු ඇත. භාණ්ඩ පැකට් කිරීම, අලෙවි කිරීම හා ලේබල් කිරීම යන කටයුතු ගනුදෙනුකරුගේ රුචිකත්වය අනුව ඉටුකිරීමට වඩාත්ම යෝග්‍ය ස්ථානය අපනයන පිරිසැකසුම් කලාපයයි. එය එක්තරා වෙළඳ පොළක් උදෙසා පිරිවිතරවලට අනුකූලව භාණ්ඩ එකලස් කිරීම හා නිෂ්පාදකයින්ගේ මධ්‍යස්ථානයක් වශයෙන්ද පවතිනු ඇත. මෙම කලාපය තොග වෙළෙඳ සැපයුම් මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියා කළ හැකි අතර ඇනවුම් කිරීම හා භාණ්ඩ සැපයුම් අතර කාලය අඩුකර ගැනීමටද උපස්ථම්භක විය හැකිය. කලාපය ඇතුලත සමාගම් සත්කාරක රටෙන් ලැබෙන ඇනවුම් බලාපොරොත්තුවෙන් ඔවුන් වෙත අමුද්‍රව්‍ය හා නිමි භාණ්ඩ තොග ගබඩාකොට තබාගැනීමේ ක්‍රමයක් යොදාගත හැකි නම් කාර්යක්ෂමව හා සාර්ථක දේශීය සැපයුම් කාලසටහන් අනුව කටයුතු කළ හැකිය. අපනයන පිරිසැකසුම්

කලාපය තුළ නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ අනවරතයෙන්ම ප්‍රදර්ශනය කිරීම සඳහා පහසුකම් සලසාලීමෙන් ගැනුම්කරුවන් පොළඹවා ගැනීමද කළ හැකිය. කලාපය තුළ නව නිපැයුම් නිපදවීමත් සමගම ඒවා මිලදී ගැනීම හා භාණ්ඩ පිරිවිතරවලට ගැලපෙන සේ නිෂ්පාදනය කිරීමට වගබලාගනු පිණිස විදේශීය ගැනුම්කරුවන් එහිම සිය නියෝජිත කාර්යාල පිහිටුවීමට වඩාත් කැමැත්තක් දක්වනු ඇත.

අන්තර් ව්‍යුහය සැලසුම් කිරීම

කලාපය ඇතුලත ආයෝජනය කරන්නන්ට උපරිම සහයෝගය හා පහසුකම් ලබාදීම සඳහා සුනම්‍ය ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරවුවහොත් අපනයන පිරිසැකසුම් කලාපයෙන් සැලකිය යුතු ප්‍රතිඵල නෙළාගත හැකි බව වෙනත් ආසියාතික රටවල අත්දැකීම්වලින් පෙනී යයි. කලාපයේ පරිපාලනය ස්වතන්ත්‍ර අධිකාරියකට පැවරිය යුතුය. කඩිනමින් අන්තර් ව්‍යුහය සැලසීම සහතික කිරීම පිණිස කලාපයේ බලාධිකාරයට අනිකුත් සංවිධාන අභිබවා කටයුතු කිරීම සඳහා අවශ්‍ය බලතල පවරාදිය යුතුය. මෙම අධිකාරියට සාමාන්‍යයෙන් රාජ්‍ය සංස්ථාවලට මුහුණ පෑමට සිදුවන බාධකවලින් අවහිරයක් නොතිබිය යුතුය. නිලධාරි තන්ත්‍රයේ සීමා කිරීම්වලින් තොරව කටයුතු කිරීමට හා කිසිදු අවහිරයක් නොමැතිව තීරණවලට එළඹීමටද ප්‍රමුඛතා පදනමක් මත අනිකුත් රජයේ දෙපාර්තමේන්තු හා ආයතන මගින් ඉටුකළ යුතුවන කටයුතු කරවා ගැනීමටද ඉඩකඩ තිබිය යුතුය. කලාපයේ සාර්ථකත්වය වැඩි වශයෙන්ම රඳා පවතිනුයේ මූලික අන්තර් ව්‍යුහයේ තත්ත්වය හා එමගින් සැලසිය හැකි උපයෝගී සේවා මතය. කලාප අධිකාරිය විසින් ආයෝජනයට අදාල දත්තයන් හා අනිකුත් තොරතුරු පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ප්‍රස්තුත ආයෝජකයාට ලබාදිය යුතුය. රටෙහි ධනායෝජනය පිළිබඳ මුදල් රෙගුලාසි හා අනිකුත් විස්තර දැක්වෙන ලේඛනද ඔවුන්ට සැපයිය යුතුය.

ජාත්‍යන්තර පුද්ගලික ආයෝජනය අද ඉතාමත් තරඟකාරී තත්ත්වයක පවතින අතර දේශීය වාතාවරණය අනුව අතිශයින්ම වෙනස්වන සුළුය. විදේශීය ආයෝජකයාට සාමාන්‍යයෙන් විකල්ප කිහිපයක් ඇත. එමනිසා වඩාත් උත්කෘෂ්ඨ තත්ත්වයක් යටතේ සිය කර්මාන්ත පිහිටුවීමට ඔහු වැඩි රුචිකත්වයක් දක්වනු ඇත. අධිකාරිය විසින් එබඳු උත්කෘෂ්ඨ තත්ත්වයන් ඇතිකරලීමට යත්න දැරිය යුතුය. කලාපයේදී සලසනු ලබන සේවා වෙනත් ස්ථානවල ඇති ඒවාට වඩා තත්ත්වයෙන් උසස්විය යුතුය. කලාපය තුළ උසස් තත්ත්වයේ සේවාවක්වත් ඔවුන්ට නොලැබේ නම්, ආර්ථිකයේ දක්නට ඇති දුෂ්කරතා හා අහිතකර තත්ත්වයන්ද නොතකා විදේශීය ආයෝජකයන් ශ්‍රී ලංකාවට පැමිණෙතැයි සිතිය නොහේ.

අපනයන පිරිසැකසුම් කලාපයේ සාර්ථකත්වය හා විදේශීය ආයෝජකයන් ඇද ගැනීමේ හැකියාව රඳා පවතිනුයේ කලාපය පිහිටුවීමට තෝරාගන්නා ප්‍රදේශය සහ එහි සකස් කිරීම මතය. ආයෝජකයන් විසින් ආර්ථික ප්‍රතිපත්තිය හා කලාපයේ සාමාන්‍ය වාතාවරණයද සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කරනු ලැබේ. ඔවුන් වෙනත් රටවල පිරිනමා ඇති පහසුකම් සමඟ කලාපයේ වාසි හා අවාසි සන්සන්දනය කර බලනු ඇත. ඔවුන් මූලාරම්භයේදී කලාපයට අදාල ප්‍රතිපත්තීන් පමණක් නොව, විදේශීය ආයෝජන පිළිබඳ රජයේ ආකල්පය හා විදේශීය ආයෝජකයාට සලසනු ලබන ආරක්ෂා විධාන කවරේදැයි දැක්වෙන මූලික ප්‍රතිපත්ති ප්‍රකාශනයක්ද බලාපොරොත්තු වනු ඇත. කලාපයට අනුබලදීම සඳහා එතරම් පුළුල් ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කළ යුතුය. මෙරට ආර්ථික කටයුතුවලට, මුදල් කටයුතු පිළිබඳ ප්‍රධාන පෙළේ විදේශීය සඟරාවල සැලකිය යුතු ප්‍රචාරයක් ලබාදී නැත. ප්‍රචාරයෙන් තොරව ජාත්‍යන්තර මට්ටමෙහි ආයෝජකයාට ශ්‍රී ලංකාවෙන් පිළිගැන්වෙන දෑ පිළිබඳව අවබෝධයක් ලබාගත නොහැකිවාක් මෙන්ම එබඳු ප්‍රචාරක කටයුතු කල්වේලා ඇතිව ආරම්භ කළ යුතුද වේ.

සුපරීක්ෂාකාරීව අන්තර් ව්‍යුහය සැලසුම් කළ යුතු අතර, ආරම්භයේදී පමණක් නොව, පසුවද අවශ්‍යතා ගණනාවක්ම සපුරාලිය යුතු බැවින් කලාපය සඳහා නියමිත ප්‍රදේශය වාසි සහගත අන්දමින් පිහිටුවිය යුතු වූවක් මෙන්ම පැහැදිලිව මායිම් සලකුණු කළ ප්‍රදේශයක්ද විය යුතුය. වගුරු නොමැතිව නිසි ජලවහනය ඇති ප්‍රදේශයක්ද විය යුතුය. ප්‍රධාන මංමාවත්වලට පහසුවෙන් පිවිසිය හැකිවිය යුතුය. තදාසන්න ප්‍රදේශවල නිවාස කොලනි හා උප නගර සඳහා ඉඩකඩ තිබිය යුතුය. නැව් තොටවල් හා ගුවන් තොටුපළවලටද සංනිවේදන මධ්‍යස්ථානවලටද පහසුවෙන් ළඟා විය හැකි මාර්ග තිබිය යුතුය. මූලාරම්භක අදියරයන්හිදී එතරම් ඉඩකඩ අවශ්‍ය නොවූවද මුල් මාස 12 හා 18 අතර කාලසීමාවේදී කර්මාන්තශාලා 30 සිට 40 පමණ දක්වා ක්‍රියාත්මක කිරීමට ඉඩ ඇතැයි අනුමාන කළ හැක. මුලදී අක්කර 500 ක පමණ බිම් ප්‍රමාණයක් අවශ්‍ය විය හැකි නමුදු අනාගත ව්‍යාප්තිය සඳහා තවත් අක්කර 1500 ක් පමණ වෙන්කළ යුතුය.

කලාපයේ භෞතික සැලසුම් කිරීම පුද්ගලික අංශයට නැතහොත් රජයේ දෙපාර්තමේන්තුවලට පැවරිය යුතුද යන්න රජය මුලදීම තීරණය කළ යුතුය. නොකඩවා විදුලි බලය හා ජලය සැපයුම හා කාර්යක්ෂම විදුලි සන්දේශ සේවා නොමැතිකම දිවයින පුරා පුද්ගලික කර්මාන්තකරුවන්ට මුහුණ පෑමට සිදුව ඇති ප්‍රශ්නයකි. මෙම සේවා තුනටම උසස්ම ප්‍රමුඛත්වයක් ලබාදිය යුතුව ඇත. උපස්ථිත විදුලිබල ජනක යන්ත්‍ර නොමැතිව කර්මාන්තශාලා ක්‍රියාත්මක කරවිය හැකිවන අන්දමට විදුලිබල සැපයුම සතුටුදායක විය යුතුය. කර්මාන්ත සඳහා පමණක් නොව කලාපය අවට පිහිටි නිවාස ජනපදවලට ජලය සැපයුම සඳහා ස්ථිර ජල පවිත්‍රීකරණ යෝජනා ක්‍රමයක්ද ඇතිකළ යුතුය. කලාපය කටුනායක පිහිටවනු ලැබේ නම් කොළඹ ජල සැපයුම් ක්‍රමයෙන් කොළඹ හා කලාපයේ අවශ්‍යතාවයන් පිරිමසාලිය නොහැකි බැවින් කලාපයේ ජල සැපයුම කොළඹ ජල සැපයුම් ක්‍රමයට සම්බන්ධ නොකළ යුතුය. කලාපයේ ජලය සැපයුම කැළණි ගඟට සම්බන්ධ කළ තනි පවිත්‍රීකරණ පිරියතක් මගින් ලබාදීමට පියවරගත යුතු අතර එය ගඟෙහි උතුරට බර ස්ථානයක පිහිටුවිය යුතුය.

කර්මාන්තශාලා, ගොඩනැගිලි හා පිරියත් ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් හා ස්ථාපනය කිරීමේ කටයුතු පිළිබඳව විදේශීය ආයෝජකයන් විසින් නියම කර ඇති කෙටි සීමා ඇතුලත ඒවා නිමකිරීම සඳහා සේවා ගණනාවකටම සූදානම්ව සිටිය යුතුය. සිය රටවල නව සංකීර්ණ නිර්මාණාත්මක තාක්ෂණයන්ට පුරුදු වී ඇති ආයෝජකයන් ශ්‍රී ලංකාවේ අනුගමනය කරනු ලබන ශ්‍රම හා ඉදිකිරීම් කටයුතු කෙරෙන සුනංගු වේගයට නුපුරුදු අය විය හැකිය. මේ නිසා ඉදිකිරීම් සමාගම්, විශේෂයෙන් පුද්ගලික සමාගම් විදේශීය ආයෝජකයන්ගේ නියත අවශ්‍යතාවයන් සපුරාලීමට සූදානම් විය යුතුය. වැඩ සටහන ක්‍රියාත්මක කරගෙන යන අතරතුර ඉදිකිරීමේ අදියරෙහිදී හා පසුවත් කලාපය ඇතුලත කර්මාන්ත සඳහා ඇතැම් පුහුණු ශිල්පීන්ගේ හිඟයක් ඇතිවීමට ඉඩ තිබේ. තාක්ෂණික ශිල්පීන් හා පුහුණු සේවකයන් මැද පෙරදිගට සංක්‍රමණයවීම හේතුකොටගෙන කලාපයේ කර්මාන්ත සඳහා අවශ්‍ය කෞශල්‍යය අවශ්‍යතා පිරිමසාගැනීම සඳහා සෑම වර්ගයකටම අයත් තාක්ෂණ ශිල්පීන් හා මධ්‍යම කළමනාකරණ ශ්‍රේණිවල සේවක කොටස් පුහුණු කරවීමට යෝජනාක්‍රම දියත් කළ යුතුව ඇත.

ඇතැම් ලුහු කාර්මික අමුද්‍රව්‍යවලින් කොටසක් ගුවන් මගින් ගෙන්වා ගත හැකිවූවද කලාපයේ කර්මාන්ත සඳහා අවශ්‍ය උපකරණ හා අමුද්‍රව්‍ය වැඩි කොටසක් කොළඹ වරාය හරහා මෙහි ගෙන්වාගත යුතුව ඇත. මේ සම්බන්ධයෙන් ස්ථාන දෙකකදී කාර්යක්ෂම ලෙස කටයුතු කිරීම අවශ්‍ය වේ. එක් අතෙකට අමුද්‍රව්‍ය කොළඹ සිට ගෙන ඒම සඳහාද අනික් අතට කටුනායක සිට නිමි භාණ්ඩ ගෙනයාම සඳහාද කාර්යක්ෂම පරිවහන ක්‍රමයක් තිබිය යුතුය. මීට වඩා වැදගත් කාර්යය නම් කලාපයේ අවශ්‍යතා පිරිමසාලීම උදෙසා කොළඹ වරායද කර්මණ්‍ය බවට පත්කිරීමය. කොළඹ වරාය දැන් සංවිධානය කර ඇති අන්දමට එයට කලාපයේ අවශ්‍යතා සපුරාලීමට පුළුවන්කමක් නැත. කම්කරු ගැටළු හා අකාර්යක්ෂම කළමනාකරණය හැරුණු විට, වරායේ නැව් ලැගුම් ගැනීමේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හා බඩු පැටවීමේ හා බෑමේ පහසුකම්ද අසතුටුදායක තත්ත්වයක පවතී. අවිච්ඡින්න පදනමක් මත කලාපය දක්වා සහ කලාපයෙන් පිටතට පරිවහනය

කෙරෙන භාණ්ඩ පිළිබඳව කටයුතු කිරීම උදෙසා අතිරේක ගුදම් ඉඩකඩ සැපයිය යුතුය. එපමණක්ද නොව කලාපය වඩ වඩා වර්ධනය වීමේදී බහුවලින් වැඩි කොටසක්ම ඇසුරුම්වල බහාලූ ආකාරයෙන් වරායට ගෙන ඒම හෝ ඉන් ගෙන යාම හෝ සිදුවිය හැකි වුවද කොළඹ වරායෙහි ඇසුරුම්වල යෙදූ නැව් භාණ්ඩ සඳහා ලැගුම් පහසුකම් නැත. මෙම සියලුම කාර්යයන් සඳහා වරායේ පහසුකම් වැඩි දියුණු කිරීම අවශ්‍ය වන අතරම, ආයෝජකයින් තුළ මෙරට ආයෝජන කිරීම සම්බන්ධයෙන් බිය සැක පහළ නොවන අන්දමට මෙම සංවර්ධන කටයුතු කල් ඇතිව සම්පූර්ණ කළ යුතුය. නොඑසේ නම් අමුද්‍රව්‍ය හෝ නිමි භාණ්ඩ පරිවහනය සඳහා හොඳ ප්‍රවාහණ පහසුකම් නොමැතිවීම නිසා තමන් ලොකු අමාරුවක වැටේ යයි ආයෝජකයෝ ඒකාන්තයෙන්ම කල්පනා කරන්නාහුය.

VIDU52-4-14

ග්‍රාමීය නිෂ්පාදන බලවේග සංවර්ධනය කිරීම*

පී. වී. එස්. ද සිල්වා

"ලේක් හවුස් ඉන්වෙස්ට්මන්ට්ස්" විසින් 1973 දී පළකරන ලද "*Some Heretical thoughts on Economic Development*" කෘතියෙන් උපුටා ගත්තකි.

අද අප රටෙහි පවතින වැදගත් ආර්ථික ගැටළුව වූ කල් ග්‍රාමීය නිෂ්පාදන බලවේග සංවර්ධනය කිරීමේ ප්‍රශ්නයයි. නිෂ්පාදන බලවේග යනුවෙන් අදහස් කෙරෙනුයේ නිෂ්පාදනයට අදාළ මාර්ග හා තාක්ෂණයත්, ශ්‍රම නෛපුණ්‍යය හා ශ්‍රම ඵලදායිත්වය.

ඇයි අප ග්‍රාමීය අංශය ගැන පමණක් කතා කරන්නේ? නාගරික නිෂ්පාදන බලවේග ගැන හෝ නාගරික සහ ග්‍රාමීය යන අංශ දෙකම ගැන හෝ සලකා නොබලන්නේ ඇයි? නාගරික නිෂ්පාදන බලවේගවල සංවර්ධනය බොහෝ සෙයින්ම විදේශීය උපකරණ විදේශීය තාක්ෂණය, විදේශීය යෙදවුම් හා විදේශීය විශේෂඥ දැනුම පමණක් පිළිසරණ කොට ඇතිබව පළමුවෙන්ම කිව යුතුය. කාර්මික අංශයේ ආයත ආදේශන භාණ්ඩ නිෂ්පාදනයේ උපරිම සීමාවට අපි ළඟාවී සිටිමු. තවද විදේශ වෙළඳ පොළෙහි එම භාණ්ඩ සඳහා තැනක් ලබාගැනීමද දිනෙන් දිනම අසීරු තත්ත්වයකට පත්වෙමින් එයි. එමනිසා ඉතා බැරෑරුම් විදේශ විනිමය හිඟයක් යටතේ නාගරික ආර්ථිකය දියුණු වී යාම වෙනුවට මැරී යාමේ ලකුණු පහළව ඇත. මෙබඳු අවස්ථාවකදී නාගරික ආර්ථිකයට සංවර්ධනයක් ඇතිවිය හැක්කේ විදේශ මූලධනයේ උපාංගයක් ලෙස පමණි. රටක වාතාවරණය පිළිබඳව විදේශීය රටවල් අතිශයින් සැලකිලිමත්වන බැවින් හා උපාංග ආර්ථිකයක් පවත්වා ගෙන යාමට රටක් තෝරාගැනීමට මත්තෙන් ඒ පිළිබඳව එම රටවල් සූපරීක්ෂාකාරී වන නිසා මෙම මාර්ගයද දැන් ඇහිරී ඇත. දෙවනුව අප රටෙහි ලැබගත හැකි නාගරික තාක්ෂණය හා විශේෂඥ දැනුම විදේශීය මට්ටම් හා සමකර බලන විට ඉතාමත් පහත් තත්ත්වයකින් යුතු වුවද, පිටරටකට ගැති නොවී ස්වෝත්පාදකව නාගරික නිෂ්පාදන බලවේග සංවර්ධනය කිරීමට ප්‍රමාණවත් නොවුවද එය ගම්බද ප්‍රදේශවල තාක්ෂණික මට්ටමට වඩා නිසැකයෙන්ම උසස් වේ. අවම ප්‍රමාණයක් විදේශ විනිමය වැය කිරීමෙන් ග්‍රාමීය නිෂ්පාදන බලවේග ශීඝ්‍රයෙන් සංවර්ධනය කිරීමේ හැකියාවක්ද එයට ඇත. තෙවනුව කර්මාන්ත අංශයෙහි ආයාත ආදේශන මීට වඩා දියුණු කොට ප්‍රයෝජනයට ගැනීමට හැකියාවක් නොමැති වුවද කාර්මික නොවූ අංශය මෙම හැකියා මනාසේ දියුණු කළ හැකි සරු කෙතක්ව පවතී. අපගේ වාර්ෂික ආයාතයන්ගෙන් අඩක් පමණ ආහාර හා කෘෂි අමුද්‍රව්‍ය සඳහා තවමත් වැයවේ. එමනිසා අද අපට නිරතුරුව මුහුණ පෑමට සිදුවන විදේශ විනිමය ප්‍රශ්නයට විසඳුමක් ලබාගත හැකිවනුයේ ග්‍රාමීය අංශයේ තීරණාත්මක නව මං වලිනි.

නිෂ්පාදන බලවේග ශීඝ්‍රයෙන් සංවර්ධනය කිරීමට අවස්ථාව හා මාර්ගද ඇත්තේ නාගරික අංශයේ නොව ග්‍රාමීය අංශයෙහි බව මෙයින් පැහැදිලිවම පෙනේ. එපමණක්ද නොව, ග්‍රාමීය ආර්ථිකයේ සංවර්ධන වේගය නිර්ණය කෙරෙනුයේ නාගරික ආර්ථිකයේ සිට සම්පත්, තාක්ෂණය හා පුහුණු ශිල්පීන් ගම කරා යොමුකිරීමේ විශාලත්වය මතය. මේ නිසා ග්‍රාමීය හා නාගරික නිෂ්පාදන බලවේග දෙකම එක්විට සංවර්ධනය කළ හැකි නොවේ. ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය කිරීමේදී මීට ප්‍රතිවිරුද්ධ වූවක් සිදුවේ. එනම් නාගරික ආර්ථිකයේ ඇතැම් විස්තීර්ණ අංශ සංකෝචනය වීමද එමගින් සිදුවිය හැකිය. අප පිවිසි මාර්ගයෙහි කෙළවර ඇහිරී ඇත. තව දුරටත් මුරණ්ඩු ලෙස නිෂ්ඵල ව්‍යායාමයක නොයෙදී එම මාර්ගයේ ආපස්සට ඒම දැන්වත් කළ යුතු නොවේද? මෙය නාගරික ප්‍රතිපත්ති සැලසුම්කරුවන් විසින් තීරණය කළ නොහැකි දුෂ්කර කාර්යයකි. නාගරික අර්ථ ක්‍රමය පරිහානිය කරා එළඹී ඇතිබවත්, වඩ වඩාත් විදේශාධාර යෙදවුම්වලින් එම පිරිහීම පමා කර ගැනීම පමණක් සිදුකළ හැකි බවත් වටහාගතහොත් තීරණයක් ගැනීම වඩා පහසුවනු ඇත. අප මේ අවස්ථාවේදී පවා ආපස්සට ගමන් කොට අපට විවෘතව ඇති අනෙක් මාර්ගය ඔස්සේ ගමන් නොකළ හොත් පහර වැදෙන විට කිසිවක් කරකියා ගත නොහැකි තත්ත්වයකට අප පත්වනු ඇත. තවත් මාර්ගයක් විවෘතව පවතීද යන්න ගැන කුහුලක් ඇති නම් උතුරු වියට්නාම අත්දැකීම මෙනෙහි කිරීම වටී. වියට්නාමයේ නාගරික ජීවිතයට ඇමෙරිකානු ප්‍රහාර එල්ල වූ දීර්ඝ සමයේදී ඔවුන්ට ප්‍රාන්ත දේශවල බල සංචිත උපයෝගී කරගැනීමට පුළුවන්කමක් තිබිණ.

නාගරික අංශයෙහි සම්පත්, තාක්ෂණය, නිපුණතා හා විශේෂඥ දැනුම ග්‍රාමීය අංශයෙහි විශාලවශයෙන් යෙදවීම අවශ්‍ය වුවද, එය ග්‍රාමීය නිෂ්පාදන බලවේග සංවර්ධනය සඳහා ප්‍රමාණවත් සත්‍යයක් නොවේ. මෙම බලවේග ක්‍රියාත්මක වන්නාවූ රාමුව ඇතුළත ආර්ථික සම්බන්ධතා පරිණාමය වීමද ඒ හා සමාන වූ වැදගත්කමකින් යුතුවේ. ග්‍රාමීය ආර්ථිකයේ පසුබෑසීමට හේතුවන මූලික කරුණ නම් ග්‍රාමීය නිෂ්පාදන බලවේග වර්ධනයට බාධාවක්ව පවත්නා මෙබඳු ආර්ථික සම්බන්ධතාය. මෙබඳු සම්බන්ධතා වර්ධනයට හිතකර වූ අන්දමට හා උපකාරීවන අන්දමට වෙනස් කරගත යුතුව ඇත.

ග්‍රාමීය නිෂ්පාදන බලවේග වර්ධනයට බාධකවීමේ හේතුවෙන් වෙනසියාවට භාජනය කළයුතු ආර්ථික සම්බන්ධතා කවරේද? ඒවා නම් (අ) ග්‍රාමීය ආර්ථිකය හා නාගරික ආර්ථිකය අතර සම්බන්ධතා සහ (ආ) ග්‍රාමීය ආර්ථික තුළ පවත්නා සම්බන්ධතාය.

වර්තමාන ග්‍රාමීය–නාගරික සම්බන්ධතා පදනම්ව ඇත්තේ නගරය විසින් ගම්බද පළාත් සූරාකෑම මතය. සූරාකෑම යන්නෙන් අදහස් වනුයේ ග්‍රාමීය ආර්ථික අතිරික්තය නාගරික ආර්ථිකය විසින් අත්පත් කරගැනීමය. මෙම සූරාකෑම නොයෙකුත් ආකාරයන්ගෙන් සිදුවේ. ග්‍රාමීය නිෂ්පාදන උපයෝගී කොටගෙන නාගරික වෙළන්දුන් අසාධාරණ ලෙස උපයාගන්නා අධික ලාභ ගැන අප මැනවින් දන්නා නමුදු, ග්‍රාමීය හා නාගරික භාණ්ඩ පිළිබඳ වෙළඳ කොන්දේසි මගින් කෙරෙන සූරාකෑම (එනම්:මිල සම්බන්ධය) වඩාත් දරුණුය. වී බුසලක් සඳහා ගොවියාට රු. 18/- ක් ලැබේ.* කපු රෙද්දෙන් නිමැවුණු කමිසයක් සඳහාද මේ හා සමාන මිලක් ගෙවිය යුතුය. කිරි පට්ටිකාරයාට කිරි පයින්ට් එකකට ශත 40 ක් බැගින් ලැබෙන නමුදු ඔහු රටබීම බෝතලයකට ශත 50 ක්ද ඉවත දමන බෝල්පොයින්ට් පෑනකට රු. 1.25 ක්ද ගෙවිය යුතුය. අධික පොළියට මුදල් ණයට දීමෙන්ද ග්‍රාමීය අතිරික්තය නගරය මගින් උකහා ගනු ලැබේ. බොහෝ අවස්ථාවලදී වෙළෙන්දාද ණයහිමියා වන බැවින් ණය සහ පොළිය යන දෙකම කපාගනුයේ අධික ලාභ සහිතවය. නාගරික ප්‍රවාහණ කොන්ත්‍රාත්කරුවන් විසින්ද තමාගේ කොටස අත්පත්කර ගන්නා අතර ප්‍රවාසී ඉඩම් හිමි ක්‍රමය මගින්ද ග්‍රාමීය අතිරික්තය අවශෝෂනය කරගනු ලැබේ.

නාගරිකය මගින් ග්‍රාමීය ආර්ථිකය සූරාකෑම හා නාගරික ආර්ථිකය අධිරාජ්‍යවාදී අර්ථ ක්‍රම මගින් සූරාකෑමක් අතර සමානාත්මතාවයක් දක්නට ඇත. මෙම අවස්ථා දෙකෙහිදීම සිදුවනුයේ වෙළඳාම, ප්‍රවාහණය, ධනායෝජනය හා දේපල අයිතිය යනාදිය මගින් ආර්ථික අතිරික්තය අත්පත්කර ගැනුමයි. ග්‍රාමීය–නාගරික සම්බන්ධතාවයෙහි ලක්ෂණ ගැන විමසා බලන විට නාගරික විදේශ සම්බන්ධයෙහි පිළිබිඹුවක් වන බුද්ධි ගලනයද දැකගත හැකිය. තවද, විදේශීය ආර්ථිකය මගින් සූරාකනු ලබන නාගරික ආර්ථිකයේ උපාංගයක් බවට පත්වී හුදකලාව පවතින්නාක් ලෙස පෙනෙන ග්‍රාමීය අර්ථ ක්‍රමයද නාගරික අර්ථ ක්‍රමය මගින් ලෝක ධනවාදී ආධිපත්‍යය හා සූරාකෑමේ මහා ප්‍රවාහයට ඇදගනු ලබන්

* 1973 හි මිල ගණන් අනුවය.

නේය. අපගේ ග්‍රාමීය ආර්ථිකය මෙයාකාරයෙන් දෙවිධියක සූරාකෑමකට ගොදුරු වේ.

රජය විසින් ආයතනික හා වෙනත් උපක්‍රම මගින් මෙම පරතරය සම තත්ත්වයකට පමුණුවීමට උත්සාහ දරා ඇත. පාරිභෝගික සමුපකාර හා සේවා සමුපකාර දියුණු කිරීම පිණිස රජය මගින් අනුබලදී ඇති අතර සමුපකාර හා ග්‍රාමීය බැංකු ක්‍රමයටද රජය අතදී ඇත. රජය ඉඩම් ප්‍රතිසංස්කරණයක් ඇතිකිරීමට පවා පියවර ගෙන ඇත. රජයේ අලෙවිකිරීම් යෝජනා ක්‍රම ඇති කොට නිෂ්පාදන භාණ්ඩ සඳහා සහතික මිලද නියම කර ඇත. ව්‍යාප්ති හා උපදේශක සේවා සමූහයක් රජය පිහිටුවා ඇති අතර ඇතැම් භෝග සඳහා සහනාධාර ක්‍රම යටතේ පොහොර සපයා ඇත. දිස්ත්‍රික් සංවර්ධන මණ්ඩල හා විමධ්‍යගත අයවැය යටතේ ග්‍රාමීය ප්‍රදේශවලට අරමුදල් සැපයීමටද දූන් අදහස්කර ඇත. මෙම උපාය මාර්ග බෙහෙවින් චමත්කාර ජනක වන නමුදු ඒවායේ ප්‍රතිඵල සිත් ඇදගන්නා සුළු නොවේ. මීට හේතුවී ඇත්තේ මෙම ක්‍රියාදමයෙන් ග්‍රාමීය–නාගරික සංඝටනයට මුල්වූ කරුණු කෙරෙහි කිසිදු බලපෑමක් හෝ ග්‍රාමීය ආර්ථිකය ඇතුලත ආර්ථික සම්බන්ධතා වල වෙනසක් හෝ එමගින් සිදු නොවීමය. කම්කරු නීති මගින් මූලික ප්‍රාග්ධන, කම්කරු පරස්පර විරෝධතා, ලාභ බෙදාගැනීම, කොටස් විසරණය හා කම්කරු මණ්ඩල ආදී ප්‍රශ්න විසඳීමට ගන්නාලද උත්සාහය හෝ ආර්ථික සහයෝගිතාව, වෙළඳ භාණ්ඩ ගිවිසුම්, මූල්‍යාධාර සැපයුම හා අන්තර් ජාතික මුදල් මෙහෙයවීම් මගින් මූලික අධිරාජ්‍යවාදී – යටත් විජිතවාදී විරෝධතා විසඳා ගැනීමට තැත්කිරීම හෝ හුදෙක් ප්‍රතිසංස්කරණවාදී හා නිෂ්ඵල පියවරවල් බව සඳහන් කළ යුතුය.

ග්‍රාමීය නාගරික පරස්පර විරෝධතාවයේ සාරය නම් ග්‍රාමීය ආර්ථිකය නාගරික ආර්ථිකයේ ආධිපත්‍යයට හසුව තිබීමයි. සමාජයේ මෙන්ම සොභාව ධර්මයෙහිද එකිනෙකට පරස්පර විරෝධීවූ අංග දෙකක්, අන්‍යෝන්‍ය පරායත්තතාවයෙන් යුතුවන බැවින්, ඒකකයක් වශයෙන් පැවතිය හැකි නමුදු ඒවාට සම හවුල්කරුවන් වශයෙන් තනි තනිව පැවතිය නොහැක. එකක් ආධිපත්‍යය දරණ අතර අනික අධීනව පවතී. ඕනෑම ප්‍රපඤ්චයක ගති ලක්ෂණය නිර්ණය වනුයේ, එහි පරස්පර විරෝධතාවයේ ප්‍රබලතම ලක්ෂණ ඇසුරිනි. අංග දෙකක් අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධතාවයේ කවර වෙනසියාවක් හට ගැනුනද, වඩා ප්‍රබල අංගය ප්‍රබලව පවතී නම් ප්‍රපඤ්චයේ සොභාවයද මූලික වශයෙන් නොවෙනස්ව පවතී. ප්‍රමාණාත්මක වෙනස්කම් මෙන් නොව, ප්‍රපඤ්චයක් සාරාත්මක වශයෙන් හා ගුණාත්මක වශයෙන් වෙනස් වනුයේ ප්‍රබල අංගය යටපත්ව යටපත්වූ අංගය ප්‍රබල වුවහොත් පමණි. එමනිසා අන්‍යෝන්‍ය පරායත්තතාවයෙන් යුතු වූ හා සංඝටනයෙන් යුතුවූ ග්‍රාමීය–නාගරික සම්බන්ධතාවයෙහි ගුණාත්මක වෙනසියාවක් ඇතිවීමට නම්, ග්‍රාමීය ආර්ථිකය ප්‍රබලවී නාගරික ආර්ථිකය යටපත් විය යුතුය. දැනට උද්ගතව ඇති තත්ත්වය යටතේ, ග්‍රාමීය නිෂ්පාදන බලවේග බැඳ දමා ඇති යදම්වලින් එය මුදවාගත හැකි එකම මාර්ගය මෙයයි. මීට වඩා දුර්වල ප්‍රතිකර්මයකින් සහනශීලී විසඳුමක් පමණක් ලබාගත හැකිවූවද, එමගින් ග්‍රාමීය ආර්ථිකයේ මූලික වෙනසියාවක් ඇති නොවනු ඇත.

ඊටම ආවේණික වූ සොධීන ප්‍රවර්තන ශක්තියෙන් යුක්තවූ හා ග්‍රාමීය ආර්ථිකයද යටත් අංගයක් වශයෙන් උපයෝගී කරගන්නාවූ නාගරික ආර්ථිකයක් පවතින රටක නාගරික–ග්‍රාමීය සම්බන්ධතාවයේ මූලික වෙනසක් සිදු කිරීමට අවශ්‍ය නොවනු ඇත. එසේ වුවද, ස්වෝත්පාදක නොවන අර්ථ ක්‍රමයක් නැතිවූද විදේශීය තාක්ෂණය උපකරණ, යෙදවුම් හා කෞශල්‍යය ආදියෙහි පිහිටක් නැතිව සංවර්ධනය කරා යා නොහැකිවූද එසේ ලබන සේවා සඳහා ගෙවීමට ආදයම් මාර්ගයක් නැත්තාවූද නාගරික ආර්ථිකයක් පවතින ශ්‍රී ලංකාව බඳු රටවල එබඳු ආර්ථිකය දුර්වල තත්ත්වයට හා මුළුමනින්ම අනුන්ගෙන් යැපෙන තත්ත්වයට පත්වීගෙන එන්නේය. එම නිසා එබඳු ප්‍රපාතයකට මේ රට ඇද නොවැටීමට නම් නාගරික ආර්ථිකයට දෙවන තැන දිය යුතුය.

නාගරික ආර්ථිකය ග්‍රාමීය ආර්ථිකයෙන් යටපත් කිරීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? ආයෝජනය, පර්යේෂණ හා තාක්ෂණික නවීකරණය, පුහුණු සේවකයන් වියෝජනය කිරීම, අභ්‍යන්තර අලෙවිකිරීම් කටයුතු හා වෙළඳ කොන්දේසි, නිවාස සැපයීම්, ප්‍රවාහණය, අධ්‍යාපනය, සෞඛ්‍යය පරිපාලනය හා සංස්කෘතික කටයුතු ආදිය පිළිබඳ රජයේ ප්‍රමුඛතා, ප්‍රතිපත්ති, ආකල්ප හා චින්තනය මුළුමනින්ම වෙනස් කිරීමක් මින් අදහස් කෙරේ. මේ සඳහා රජය විසින් නාගරික ආර්ථිකයට වැය කළ යුතු සම්පත් ග්‍රාමීය ආර්ථිකය තුළ වැඩි වැඩියෙන් ආයෝජනය කළ යුතුය. නාගරික ආර්ථිකය සඳහා වෙන් කළ යුත්තේ ග්‍රාමීය නිෂ්පාදන බලවේග සංවර්ධන කිරීමෙහිලා උපස්ථම්භක වන සම්පත් පමණි. නාගරික ආර්ථිකය උපාංග තත්ත්වයකට පත්කර එහි සංවර්ධන අරමුණු හා වේගය ග්‍රාමීය ආර්ථිකයේ සංවර්ධන අවශ්‍යතා මගින් නිර්ණය කරනු ලැබිය යුතුය.

ආයෝජන ක්ෂේත්‍රයෙහි ලා රජය විසින් ගම්වලට විදුලිය සැපයීම සඳහා උසස් ප්‍රමුඛත්වයක් ලබාදිය යුතුය. ග්‍රාමීය නිෂ්පාදන බලවේගයන්හි බල ශක්ති පදනම වනුයේ විදුලියයි. මෙයින් අදහස් වනුයේ ග්‍රාමීය ආර්ථිකයට අඩු වියදමකින් බලය සැපයුමය. එමනිසා විදුලිය උත්පාදනය, සංප්‍රේෂණය, බෙදාහැරීම හා ආරක්ෂක ක්‍රම වියදම් අඩු ඒවා විය යුතුමය. ට්‍රාන්ස්පෝමර්, මෝටර්, මීටර්, ඉන්සියුලේටර්, පරිපථ කඩනයන් ආදිය නිපදවීම සඳහා අනුයාත විදුලි උපකරණ නිපදවීම පිණිස කර්මාන්තශාලා මුළුමනින්ම හෝ කොටස් වශයෙන් හෝ ගම්බදව පිහිටුවිය යුතුය. ගම්වලට විදුලිය සැපයීමත් සමගම ප්‍රමුඛත්වය ලබාදිය යුතු අනිකුත් ආයෝජන නම් කෘෂිකර්මය, කෘෂිකාර්මික ආම්පන්න නිෂ්පාදනය කිරීම හා කෘෂි පාදක ග්‍රාමීය කර්මාන්තය දිගුකලකින් ප්‍රතිඵල ලබාදෙන නව වාරිමාර්ග ක්‍රම දියත් කිරීමට මත්තෙන් වැව් ප්‍රතිසංස්කරණය කිරීමෙන් වගා කළහැකි වගුරු බිම් ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කළ යුතුය. ආහාර පරීක්ෂණය හා පිරිසැකසුම් කිරීම, සීනි හා කඩදාසි නිෂ්පාදනය, බලවේග රෙදිපිළි කර්මාන්තය, ද්‍රව පදම් කිරීම, සුසන්ධ තෙල් ආසවනය කිරීම, පොල්කටු, කොහුබත්, ලීකුඩු හා ඓන්ද්‍රීක කසල බඳු අපද්‍රව්‍ය උපයෝගී කරගැනීම ආදී වූ කෘෂිපාදක ග්‍රාමීය කර්මාන්තවලට අවශ්‍ය කෘෂිකාර්මික උපකරණ හා සරල මෙවලම් නිෂ්පාදනය කිරීමද කළ යුතුව ඇත. ආයෝජනයෙහි ලා මීලඟට ප්‍රමුඛත්වය දිය යුත්තේ ගැමි ධීවර කර්මාන්තය, බෝට්ටු තැනීම හා පිඟන් කර්මාන්තය හා දේශීය ගව පට්ටිවල තත්ත්වය උසස් කිරීම සඳහා පට්ටි ගොනුන් ලබාදීම හා සිංචන පහසුකම් සැලසීම සඳහාය.

ආයාතික උපකරණ හා ද්‍රව්‍ය පදනම් කර ඇති මිනිස් ශ්‍රමය නොව යන්ත්‍ර සූත්‍ර වැඩි වශයෙන් යොදගන්නා කර්මාන්තවලටද, විදේශීය යන්ත්‍රසූත්‍ර මත රඳා පවත්නාවූද විදේශීය වෙළඳ පොළෙහි දැඩි අස්ථිරත්වයටද භාජනය වන අපනයන අභිමුඛ කර්මාන්තවලටද නිමි භාණ්ඩ වැඩිහරියක් අපනයනය කරනු ලබන එකලස් ක්‍රමය මගින් භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්තවලටද මෙම ආයෝජන ක්‍රමය තුළ තැනක් නොලැබී යනු ඇත. විනිමය වෙන්කර දීම්, කපාහැරීම් නිසා මෙම එකලස් නිෂ්පාදන කර්මාන්ත දැනටමත් අභාවයට යමින් පවතී. වැඩිකල් යාමට මත්තෙන් විදේශීය යෙදවුම් මත රඳාපවත්නා සෑම කර්මාන්තයකටම විදේශ විනිමය දුෂ්කරතාවයනට මුහුණ පෑමට සිදුවනු ඇත. එමනිසා රජයේ ආයෝජන ප්‍රමුඛතා වෙනස්කර ග්‍රාමීය නිෂ්පාදන බලවේග සංවර්ධනය කිරීම උදෙසා සියළුම සම්පත් යෙදවීම රජය විසින් වහාම කළ යුතුව ඇත්තේය. මෙය වූ කලී නාගරික කම්කරුවන් සේවයෙන් ඉවත් කිරීමේ හා නාගරික ආර්ථිකය බිඳ වැටීමේ ප්‍රතිවිපාකවලින් එල්ලවන පහර මඳක් බාල කරගත හැකි එකම මාර්ගයයි.

මෙම පූර්ණ උපාය ක්‍රමයට අනුකූලව රජය විසින් පර්යේෂණ හා තාක්ෂණික නවීකරණය පිළිබඳ ප්‍රමුඛතා, විෂය ප්‍රමාණය, මාර්ග හා ආකල්පයන්ද වෙනස්කළ යුතුය. මෙම ක්ෂේත්‍රයන්හි ලබාගත හැකි සියළුම නිපුණතා හා දැනට ගම්බඳ තාක්ෂණික විප්ලවයක් ආරම්භ කිරීමේ අරමුණ උදෙසා යොමු කරවිය යුතුය. පර්යේෂණ විද්‍යාඥයන්, ඉංජිනේරුවන්, කාර්මික ශිල්පීන් හා වෙනත් පුහුණු සේවකයන් ඔවුන්ගේ රසායනාගාර, කාර්යාලීය මේස, සාකච්ඡා සභා හා සාපේක්ෂක වශයෙන් සැපවත්වූ නාගරික

දිවියෙන් මැත්ව ගැමියන්ට උගන්වන අතරම ඔවුන්ගෙන්ද ඉගෙන ගනිමින් (උගනිමින්) ගැමියන් අතර විසීමට හා ඔවුන් සමඟ එක්ව වැඩ කිරීමටද සැලැස්විය යුතුය. ගැමි ජනතාවගේ පූර්ණ හා බුද්ධිමත් සහභාගිත්වය ඇතිව කෘෂිකාර්මික පර්යේෂණ වගා බිමෙහිදීත්, තාක්ෂණික වැඩි දියුණු කිරීම් කටයුතු කම්මලේදීත් පැවැත්විය යුතුය. ඈත අතීතයේ සිට අනුන්ගෙන් යැපෙන්නට පුරුදුවීම නම් පාපයෙන් ගැමි ජනතාව මුදාගත යුතුය. ගම සදාකාලික නිද්‍රාවෙන් අවදිකළ යුතුය. ආත්මය සූරාකෑමෙන්ද, මනුෂ්‍යත්වය දීන භාවයට පැමිණවීමෙන්ද සිය පැවැත්ම උදෙසා නගර කරා ඇදීයාමෙන්ද ගැමි ජනතාව ගලවාගෙන බුද්ධිමය ප්‍රබෝධයක් ගැමියන් තුළ ඇතිකළ යුතුය. ඉගැන්වීමට හා ඉගෙනුමට උනන්දුවක් දක්වන නිපුණත්වයෙන් යුතු හා දැනුමැති නාගරික ජනයා ගම්වලට ගොස් සිත් ඇදගන්නා සුලු සාකච්ඡා මගින්ද, නිර්මාණාත්මක සිතුවිලි මගින්ද, තාක්ෂණික නවීකරණය මගින්ද නිෂ්පාදන කටයුතු මගින්ද ගමට නවෝදයක් ලබාදිය යුතුය.

රටේ අස්සක් මුල්ලක් නැර සමූපකාර අලෙවි කිරීම් හා ණය දෙන ආයතන සමූහයක් පිහිටුවීම මගින් අභ්‍යන්තර අලෙවිකිරීමේ විෂය පථයෙහි නාගරික අතර මැදියන් ග්‍රාමීය ආර්ථිකය සූරාකෑම සහමුලින්ම නවතාලිය යුතුය. මෙම කර්තව්‍ය කොතරම් භාරදූර හා අත්‍යාවශ්‍යද කිවහොත් එය මෙ දක්වා කළ පරිදි සමූපාකාර පරීක්ෂකවරු ටිකදෙනෙකු අතට පත් නොකළ යුතුය. රජය විසින් නාගරික ආර්ථිකයේ රාජ්‍ය හා පුද්ගලික අංශයන්හි සංවිධානාත්මක කළමනාකරණ හා ගණකාධිකරණ කුශලතා ඇති අය එයින් ඉවත් කරගෙන මෙම කාර්යයෙහි නියුතු කරවිය යුතුය. අද බොහෝ සෙයින් ඌන උපයෝගීකරණයට භාජනය වී ඇති නාගරික කුශලතාවන්හි හරය ග්‍රාමීය ආර්ථිකයේ පසුබෑස්ම නවතාලීමට දියත් කරනු ලබන සටනේ පෙරමුණට ගෙන ආ යුතුය. ක්‍රම සම්පාදන අධිකාරියේ මූලික වගකීම වියයුත්තේ මේ මුළු මහත් ව්‍යාපාරය සැලසුම් කිරීම, සංවිධානය කිරීම හා එය මෙහෙයවීමය.

ගම විසින් නගරය සිය ආධිපත්‍යය යටතට හසුකර ගැනීම යන්නෙන් මීට වඩා ගැඹුරු අර්ථයක් පළවේ. එනම් ග්‍රාමීය නිෂ්පාදකයාට නාගරික පාරිභෝගිකයාට වඩා වැදගත් තැනක් හා ග්‍රාමීය පාරිභෝගිකයාට නාගරික නිෂ්පාදකයාට වඩා වැදගත් තැනක් ලබාදීමද මෙයින් අදහස් කෙරේ. එමනිසා ග්‍රාමීය නාගරික වෙළඳ හණ්ඩවල වෙළඳ කොන්දේසි ග්‍රාමීය අංශයට වඩා හිතකර අන්දමට වෙනස්කළ යුතුය. එහි ප්‍රතිවිපාකයක් වශයෙන් නාගරික සමාජයේ සෑම අංශයකම ජීවන තත්ත්වය පහත වැටෙනු ඇත. මෙය ග්‍රාමීය ජීවන තත්ත්වය නංවාලීමෙහිදී පැහැර නොහැර ඉටුවිය යුතු අවශ්‍යතාවයක් ලෙස පිළිගත යුතුය. ග්‍රාමීය හා නාගරික ජීවන තත්ත්වයන් එක්වර නංවාලීමේ ආකල්පය වූ කලී තැවුලට පත් නාගරිකයන්ගේ සන්තානය සන්සුන් කිරීමට යොදගන්නා මිථ්‍යා සංකල්පයක් පමණි.

නාගරික නිවාස ඉදිකිරීම හා ප්‍රවාහණ පහසුකම් සැලසීම වෙනුවෙන් සම්පත් ආයෝජනය කිරීම නවතාලිය යුතුය. නාගරික නිවාස ප්‍රශ්නය හෝ ප්‍රවාහණ ප්‍රශ්නය හෝ නිරාකරණය කරගැනීමට අපොහොසත් තත්ත්වයක පවත්නා නාගරික අර්ථ ක්‍රමයට විසඳුමක් ලබාගත හැක්කේ ග්‍රාමීය ආර්ථිකයේ ශීඝ්‍ර සංවර්ධනයෙනි. එමගින් සංක්‍රමණ දිශාව මුළුමනින්ම වෙනස් වනු ඇත. මෙම අවධියේදී නාගරික නිවාස හා ප්‍රවාහණ වෙනුවෙන් මුදල් වැය කිරීම නොනිසි කාර්යයන් උදෙසා සම්පත් වැය කිරීමකි. උද්‍යොගිමත් ග්‍රාමීය ආර්ථිකයේ මිනිස් බල අවශ්‍යතාවලින් නාගරික නිවාස ප්‍රශ්නයට බුරුලක් ලැබෙන තෙක් නගරවල ජනයාට පැල්පත් හා මුඩුක්කුවල විසීමට සිදුවනු ඇත. තවත් අවුරුදු ගණනාවක් ඔවුහු තදබද වූ බස්රථ, අබලන් මෝටර් රථ හා වලවල් සහිත මහාමාර්ග ප්‍රයෝජනයට ගත යුත්තෝ වෙති. නාගරික මහාමාර්ග පුළුල් කිරීම, ගල්තාර දැමීම, රබර් මිශ්‍රණ යෙදීම වෙනුවට මංමාවත් හා ඇළ මාර්ග මගින් ග්‍රාමීය ආර්ථිකය නගරය සමඟ සම්බන්ධ කිරීමට ප්‍රමුඛත්වය ලබාදිය යුතුය. නාගරික ජනයා ප්‍රවාහණය කිරීමට වඩා ග්‍රාමීය නිෂ්පාදන භාණ්ඩ ප්‍රවාහණය කිරීමට ප්‍රමුඛත්වය ලබාදිය යුතුය. අධ්‍යාපනය හා සෞඛ්‍ය සේවා සම්බන්ධයෙන් පවත්නා ප්‍රමුඛතාවන්ද නගරයෙන් ගමට නැඹුරු කළ යුතුය. නගරයට කරන වියදම් නවතා දමා ගම්බද පාසැල් හා ආරෝග්‍ය ශාලාවලටද අවශ්‍ය සේවක මණ්ඩල හා උපකරණ සැපයීම කළ යුතුය. ගම්බද පළාත්වලට පුහුණු සේවක කොටස් යොමුකර වීමේදී ගුරුවරුන් හා වෛද්‍යවරුන්ද ඊට ඇතුළත් කළ යුතුය.

ග්‍රාමීය ආර්ථිකය වඩාත් ප්‍රබලවූ හවුල්කරු වන සංවර්ධන උපක්‍රමයකින්, පරිපාලනය හා තීරණ ගැනීම සම්බන්ධයෙන් ප්‍රබල වෙනස්කම්වලට තුඩුදෙන විමධ්‍යගත කිරීමක් අදහස් කෙරේ. රජයේ ආදායමෙන් අඩක් ගිල දමා එයිනුදු තෘප්තිමත් නොවන අනුන්ගෙන් යැපෙන නිලධාරී තන්ත්‍රය කඩා බිඳ දැමිය යුතුය. ලිපිගොනු ගෙනයන්නන්, ලියන්නන්, වාර්තා ලියන්නන්, පූර්වාදර්ශ ධූර්තයන්, සම්මේලනවලට සහභාගිවන්නන් රටේ ආර්ථිකයට දැරිය නොහැකි බරකි. මොවුහු වඩා ඵලදායී කර්තව්‍යයන්හි නියුතු කරවිය යුත්තෝය. ප්‍රශ්නය වී ඇත්තේ ඔවුන් දවසට පැය අටක් වැඩ කිරීමට සැලැස්වීම නොවේ. මක්නිසාද යත් ඔවුන් දවසට පැය දහසයක් 'වැඩ කළත්' ඔවුන්ට වැදගැම්මක් ඇති කිසිත් නිපදවිය නොහැකිවන අතර කඩදාසි, ලිපිගොනු, කැබිනෙට්ටු යතුරු ලියන, හා විදුලි බලය ආදිය වෙනුවෙන් වැයකිරීමට සිදුවන මුදල තවත් වැඩිවනු ඇත. නිලධාරීන් අඩුවෙන් වැඩකළ පමණට රටේ ආර්ථිකය මත පැටවී ඇති බර සැහැල්ලු වනු ඇත.

වර්තමාන නාගරික, ග්‍රාමීය සම්බන්ධතාවය වෙනස් කිරීමට මේ සියල්ල හැර කළයුතු තවත් බොහෝ දේ ඇත. ගමට නව ප්‍රබෝධයක් ලබාදීමේ කර්තව්‍යයෙහිදී අතපසු නොකළයුතු කරුණකි. එහි සංස්කෘතික පුනරුත්ථාපනය සම්ප්‍රදායික ගී හා නැටුම් වෙනසියාවේ හා ප්‍රගතියේ නව විෂය ප්‍රමාණය අනුව වර්ධනය කර සාරවත් කළ යුතුය. අව්‍යාජ ජාතික සංස්කෘතියක් බොහෝ සංස්කෘතීන්ගේ මිශ්‍රණයක්වූ නාගරික නිසරු මුඩු බිමෙහි කිසි විටෙක වැඩිදියුණු වන්නේ නැත. නාගරිකය යටපත් කිරීමේ කාර්යාවලියේ කොටසක් වශයෙන් නගරවල භාවිතවන උසස් සමාජයට වැද්ද නොගන්නා බස්වහර හා සංස්කෘතිය අද වැජඹෙන අග්‍ර ස්ථානයෙන් බිමට ඇද දැමිය යුතුය. ජීවිතයේ හා චින්තනයේ සෑම විෂය පථයකටම අයත් නාගරික වරප්‍රසාද හැමෙකක්ම කිසිදු අනුකම්පා විරහිතව මුලිනුපුටා දැමිය යුතුය. නාගරික ආර්ථිකය ග්‍රාමීය ආර්ථිකයෙන් යටපත් කිරීමේ මූලික අර්ථය මෙයයි.

අපගේ නගරවල අනාගතය කුමක්ද? මේවා ක්‍රමයෙන් පරිහානියට පත්ව අවසානයේදී අභාවයට පත්විය යුතුද? නැත. නාගරික–ග්‍රාමීය සම්බන්ධතාව පරස්පර විරෝධී වූ එකක් පමණක් නොව අන්‍යෝන්‍ය රැඳියාවෙන්ද යුතු වූවකි. නාගරික ආධිපත්‍යයට හසුවූ හා සූරාකෑම්වලට ගොදුරුව ඇති ග්‍රාමීය නිෂ්පාදන බලවේග එකී ග්‍රහණයෙන් මුදහළහොත් ශීඝ්‍ර හා ස්වාධීන වර්ධනය සඳහා ඉඩකඩ එයට ඇත. එමනිසා මේ සම්බන්ධය තුළ ගුණ විෂයක විප්ලවකාරී වෙනසියාවක් ඇතිකළ යුතුය. මෙය මුදුන්පත්කර ගත හැකිවනුයේ ආධිපත්‍ය කාර්යභාරය හා පරාධීන කාර්ය භාරයද විපර්යාසයකට පත්කළහොත් පමණි. මෙම ඝට්ටනය මෙයාකාරයෙන් නිරාකරණය කර ග්‍රාමීය ආර්ථිකයේ ආධිපත්‍යය ප්‍රතිෂ්ඨාපනය කළ පසු අන්‍යෝන්‍ය රැඳියාව ග්‍රාමීය–නාගරික සම්බන්ධතාවයේ මූලික අංගය බවට පත්වනු ඇත. ග්‍රාමීය ආර්ථිකයේ ඉහළ නැගීම සමඟම එහි කණිෂ්ඨ සහභාගිකයකු වශයෙන් නාගරික ආර්ථිකයද වර්ධනය වනු ඇත. නගර නැවතත් පණ ගැන්වෙනුයේ ග්‍රාමීය ආර්ථිකයේ පිළිලයක් වශයෙන් හා විදේශ අර්ථ ක්‍රම මගින් සූරා කෑමේ මධ්‍යස්ථානයක් වශයෙන් නොව, ග්‍රාමීය ආර්ථිකයට ආධාර කරන උපාංගයක් වශයෙනි. මෙම ක්‍රියාවලිය වනාහි මෙතැනින්ම අවසන් නොවන්නේය. ග්‍රාමීය නිෂ්පාදන බලවේග තවදුරටත් සංවර්ධනය වීම සමගම සමබර අර්ථක්‍රම පවත්වාගෙන යාමට හැකිවේ. මේ සඳහා නැවතත් කර්මාන්ත සේවා හා තීරණ ගැනීම නාගරික මධ්‍යස්ථානවල කේන්ද්‍රගත කිරීමේ අවශ්‍යතාව ඇතිවේ. ග්‍රාමීය ආර්ථිකයේ ගැබ්ව ඇති විකේන්ද්‍රනය, කේන්ද්‍රගත කිරීම සඳහා ඇති අවශ්‍යතාව සමඟ එවිට ගැටීමක් වීමට ඉඩ ඇත.

විකේන්ද්‍රනය හා කේන්ද්‍රනය නිරපේක්ෂ නොවේ. අද ග්‍රාමීය නිෂ්පාදන බලවේග මුදාහැරීම සඳහා අවශ්‍යව ඇති විකේන්ද්‍රනය, නාගරික නිෂ්පාදන බලවේග වර්ධනය කිරීමෙහිලා බාධකයක් වනු ඇත. 'නාගරික කේන්ද්‍රනය' අනාගත අර්ථ ශාස්ත්‍රඥයකුගේ මිථ්‍යාග්‍රාහී මතයක් වීමට ඉඩ ඇත. නාගරික ග්‍රාමීය සම්බන්ධතා වල චලනය හේතුකොටගෙන යළිත් එම සම්බන්ධතාවයේ අධිපති හා අධීන කාර්යභාරයන් විපර්යාස කිරීමට අවශ්‍යතාවක් උද්ගත වනු ඇත. නගර හා ග්‍රාම එකිනෙකින් වෙන්ව හඳුනාගත නොහැකි තත්ත්වයට පත් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් මේ දෙක අතර පවත්නා විරෝධය අවසාන වශයෙන් මැකීයන තෙක් මෙම සංඝටනය කෙළවර නොවනු ඇත. බොහෝ කාලයක් ගතවන තුරු මේ තත්ත්වය පවතිනු ඇත. අප රටෙහි අනාගත පරම්පරාවන් අපට බටහිරින් උරුම වූ අසීමිත නාගරික කාර්මික සංස්කෘතියට පිටුපා, ඊට ආවේනික වූ රුදුරු ඵලවිපාකවලින් මිදීම සඳහා එහි භෞතික වාදී ප්‍රතිලාභ ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇති බැවින්, අප ආර්ථික විශ්ලේෂකයාගේ විෂය පථයෙන් ඈත්ව ශාස්ත්‍රකාරයෙකුගේ විෂය පථයට වඩා සමීපවීමේ අන්තරායද මේ ප්‍රශ්නයේදී මතු වන්නේය. එසේ වුවහොත් නාගරික–ග්‍රාමීය දයලෙක්තිවාදය ඉතිහාසයේ පෙර නොවූවිරූ ලෙසකින් මෙරටේ විකාශනය වීමටද ඉඩ ඇත්තේය.

VIDUS2-4-18

අර්ථ ක්‍රමය බැඳ තබන දැඩි සීමාකිරීම් ඉවත්කිරීම දේශපාලන අර්ථ ක්‍රමය පිළිබඳ අදහසක්

තිලක් රත්නකාර

අංශ ප්‍රධාන, සමාජ විද්‍යා හා භාෂා පිළිබඳ දෙපාර්තමේන්තුව, කටුබැද්ද මණ්ඩපය

ඌන සංවර්ධිත රටවල් සඳහා නියමකර ඇති සියගණනක්වූ සංවර්ධන සැලැස්මවල් අනුව ආර්ථිකය දැඩි පාලනයට යටත් කිරීම හෝ ආර්ථික කටයුතු වල සෑම අංශයකටම රාජ්‍ය මැදිහත් වීම හෝ පිළිගෙන ඇතිබව අපට පෙනේ. අර්ථ ශාස්ත්‍රඥයන් කිහිප දෙනෙකු හැර සංවර්ධනාත්මක අර්ථ ක්‍රම පිළිබඳව ලියූ බොහෝ දෙනෙකුම, සමාජය දැඩි ශික්ෂණයකට යටත් කරවන පාලන හා සීමාකිරීම් රාශියක් අවශ්‍ය බව පවසා ඇත.

සෝවියට් රුසියාව හා මහජන චීන සමූහාණ්ඩුව ඉහළ පෙළේ ජගත් බලමුළු බවට පත්වී ඇති නිසා මෙබඳු සැලසුම්වල ආදර්ශ ඉදිරිපත් කිරීමට පෙළඹුණා විය හැක. එහෙත් එබඳු සංවර්ධන සැලසුම් යටතේ මිනිසාට විඳීමට සිදුවන ගැහැට, කළ යුතු පරිත්‍යාග, මනුෂ්‍ය අයිතිවාසිකම් අහිමිවීම හා ඇතිවිය හැකි කෘෂි කාර්මික අර්බුද පිළිබඳ නියත තර්ජන වැනි කැපකිරීම් රාශියක් නොසලකා හැර ඇති බව පෙනේ. ඌන සංවර්ධිත රටවල් එම රටවල අර්ථ ක්‍රමය පිළිගැනීමට පෙර එබඳු රටවල බහුල වශයෙන් පවත්නාවූද මෙතෙක් උපයෝගී කර නොගත් ස්වභාවික ධන සම්පත් පවා ගණන් ගෙන ඇති බවක් නොපෙනේ. මෙබඳු සංවර්ධන සැලසුම් ක්‍රමවලට ගැතිකම් දැක්වීමට ආර්ථික විද්‍යාඥයන් වඩාත්ම පෙළඹුණේ එම අර්ථක්‍රම යටතේ ආර්ථික විද්‍යාඥයන්ට එම සමාජ රටාවේ මහේශාක්‍ය ලීලාවෙන් වැජඹීමට තිබෙන ඉඩකඩ නිසාය. මෙය මනෝ විද්‍යාත්මක ප්‍රශ්නයකි.

ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රයත්නයෙහි ප්‍රතිවිපාක අනුසාරයෙන් බලන කල මීට ඉහතින් සඳහන් කළ කරුණු සත්‍ය බව ඔප්පුවේ. ශ්‍රී ලංකාව ලොව සෙසු ඌන සංවර්ධිත රටවල් බොහොමයක් විසින්ම අනුකරණය කළ යුතු රටක්ය යන මිථ්‍යා මතය, එක්දහස් නවසිය හැත්තෑ ගණන්වල මුල් අවධියේදී ප්‍රචලිත විය. මෙම මිථ්‍යා මතය ලෝක බැංකුවේ අධිපතිවරයා පවා සතුටු කිරීමට තරම් ප්‍රබල වූ අතර, ආදයම් සමසේ බෙදීයන ක්‍රමයට බාධාවක් නොවන සේ ආර්ථික සංවර්ධනයක් ඇතිකිරීමට ශ්‍රී ලංකාව උත්සාහයක් දරන්නේ යයි හෙතෙම ප්‍රශංසා කළේය. ඇත්ත වශයෙන්ම, සංවර්ධනය සමඟ අත්වැල් බැඳගෙන ආදයම් නැවත බෙදීයාම වැඩිකළ හැකි රටකට උදහරණයක් වශයෙන් ශ්‍රී ලංකාව පවතින බව එකල කරන ලද අධ්‍යයන කීපයකින්ම හෙළිවිය.[1]

වර්ධනය හා ආදයම් ප්‍රතිව්‍යාප්තියත් අතර කදිම සමතුලිත තාවයක් ඇතිකිරීමේ කාර්යය නිමිති කරගෙන ශ්‍රී ලංකාව කාගේත් ප්‍රශංසාවට ලක්වුවද, මෙම මිථ්‍යා මතය ගැන සැක පහළ කළ අර්ථ ශාස්ත්‍රඥයෝද වූහ. ඔවුන්ගේ හඬ නිහඬ කිරීම හෝ යටපත් කිරීම හෝ සිදුවූවා විය හැකිය. මූලික පර්යේෂණ කටයුතු සඳහා සාවද්‍ය විධි ක්‍රම උපයෝගී කරගැනීම, පළල් ලෙස සිතීමට නොහැකිවීම යන මේ සියල්ලකම ප්‍රතිඵලයක් වශයෙන් මෙම මිථ්‍යා මතය බිහිවිය.

පැරණි විලාසිතා මෙන් මෙම සිත් වශීකරවන අදහස් උදහස් අර්ථ ශාස්ත්‍රඥයන්ගේ සිත් වසඟ කරගත් පසු මතකයෙන් ඉවත්වී යන්නේය. මහාචාර්ය ඊ. ජේ. මිශාන් මහතා එක් අවස්ථාවකදී ගෙනහැර දැක්වූ අයුරු පැරණි පෙම්වතුන් මෙන් අර්ථ ශාස්ත්‍රඥයෝද පළමුව ලියා දෙවනුව පසුතැවිලි වෙති.[2]

එපමණක් නොව අපි මධ්‍යගත සැලසුම් කිරීමේ අදහසට ඉතා දැඩි ලෙස බැඳී සිටිමු. සය අවුරුදු සැලසුම්, දස අවුරුදු සැලසුම් හා පස් අවුරුදු සැලසුම් යනුවෙන් අපටම ආවේණික වූ සැලසුම් රාශියක් අපට තිබිණි. මෙම සියලුම සැලසුම් මගින්, සැලසුම් කාල සීමාව ඇතුලතදී ආර්ථිකය යොමුවිය යුතු මාර්ගය මැනවින් දක්වා තිබිණි. දේශීය වශයෙන් මෙන්ම ජාත්‍යන්තර වශයෙන්ද ඉලක්ක නියම කරනු ලැබූ අතර, ඉමහත් කාහල නාදයෙන් යුතුව හා කැපවීමේ උදරවත් ප්‍රතිඥා සහිතව මෙම සැලසුම් මහජනතාව වෙත ඉදිරිපත් කරන ලදී. මෙම සැලසුම් ගැන සිතන විට 'ව්‍යාජ සැලසුම් කිරීම' යනුවෙන් ඩඩ්ලි සියර්ස් මහතා ප්‍රකාශකළ කියමනක් මට සිහිවේ:—

''ව්‍යාජ සැලසුම් සම්පාදනය කිරීම සඳහා හේතුවන මූලික කරුණු සැමවිටම එක සමාන නොවේ. ඇතැම්විට, සැලැස්ම විදේශ විනිමය හෝ ඉතිරි කිරීම්වල දැඩි පරතරයක් පෙන්නුම් කරමින් ආධාර සඳහා කෙරෙන ආයාචනයක් පමණි.......''

''......සැලැස්මක් වූ කලී දේශපාලන නිධානයකි. මැතිවරණ ඇති තැනකදී එය ඡන්ද ලබාගැනීමේ උපාය මාර්ගයකි.''

''ඇතැම්විට සැලැස්මක ඉලක්ක කොතරම ශබ්ද නඟා ප්‍රචාරය කරනු ලැබේද කිවහොත්, සංවර්ධන ඉලක්ක මුද්‍රණය කොට ප්‍රකාශ කිරීමේදීම ඒවා ක්‍රියාත්මක කොට හමාරවී ඇතැයි යන මතය පහළවීමට තරම් අනවශ්‍ය ප්‍රචාරයක් දෙන බව රහසක් නොවේ.''

එසේවුවද ශ්‍රී ලංකාව ආදයම් ප්‍රති ව්‍යාප්තිය හා ආර්ථික වර්ධනය අතර කදිම සමතුලිතතාවයක් ඇතිකර ගෙන ඇති බව සනාථ කිරීමට ගෙනහැර දැක්වූ සංඛ්‍යා ලේඛනවලින්ම ඊට ප්‍රතිවිරුද්ධ වූ කරුණු සනාථ වන සාක්ෂි අනාවරණය විය. 1963 හා 1973 හි ශ්‍රී ලංකා මහ බැංකුව පැවැත්වූ පාරිභෝගික මුදල් සමීක්ෂණයෙන් 1973 හා 1973 අතර කාලය ඇතුලත සලාක සහල්වල ප්‍රතිශීර්ෂ පාරිභෝජනය, විශේෂයෙන් අඩු ආදයම් කොටස් සම්බන්ධයෙන් පහත වැටී ඇතිබව පෙන්නුම් කළේය.

සලාක සහල්වල ප්‍රතිශීර්ෂ පාරිභෝජනයේ වෙනස:—(වියදම් ඒකකයට මාස දෙකකට සහල් සේරු)

ආදයම් වර්ගය (මාස 2 ට රුපියල්)	1963	1973
0 — 50	13.87	5.94
51 — 100	19.30	8.48
101 — 200	14.75	10.23
201 — 400	14.55	12.28
401 — 800	12.86	12.26
801 — 1600	11.67	12.01

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහා බැංකුවේ 1963 හා 1973 පාරිභෝගික මුදල් පිළිබඳ සමීක්ෂණය)

මෙ සියල්ලටම අමතරව, රැකියා වියුක්තිය දශ ලක්ෂයද ඉක්මවා අතිශය බරපතළ ප්‍රශ්නයක් බවට පත්වෙමින් පැවතිණි. රැකියා වියුක්තිය ප්‍රශ්නය කවදාවත් නොවිසඳෙන නිදන්ගත රෝගයක් මෙන් රැකියා නොමැති අය පෙළීමට සමත් විය.

රටේ ආබාධයනට පිළියමක් වශයෙන් ඉදිරිපත්කොට ඇති නවතම සංකල්පය වන ආර්ථික සීමා ලිහිල් කිරීම සලකා බැලිය යුත්තේ මෙම පසුතලය යටතේය. දැන් කළයුතුව ඇත්තේ ආර්ථිකය ලිහිල් කිරීම යන පදය අතීත ප්‍රතිපත්ති අසාර්ථක වී

බලාපොරොත්තු සඩවීම නිසා ඇතිකරගත් සංකල්පයක්ද නැත හොත් අප රටට ගැලපෙන අර්ථවත් අදහසක්ද යන්න ගැන විමසා බැලීමය.

ක්‍රම විශ්ලේෂණ අංශය අනුව ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය දෙස බැලුවහොත් එය අර්ථවත් සංකල්පයකි. ආර්ථිකය ස්වයංධාරක ක්‍රමයක් ලෙස ගෙන සීමාවන්ට යටත්ව වුවද විභාගකොට බැලුවහොත්, ආර්ථිකයට ස්වයංධාරක විය හැකි පරිදි එහි අන්තර් ගත සෘණ ප්‍රතිලෝමන ක්‍රමය දෙස බැලිය යුතුවේ. උදහරණ වශයෙන් බඩු හිඟවීම නිසා මිල වැඩිවීමෙන් සෘණ ප්‍රතිලෝමන ක්‍රමය සක්‍රිය වීම නිසා අවශ්‍ය භාණ්ඩ නිපදවීමට නිෂ්පාදකයන් පොළඹවනු ලැබීමෙන් බඩු හිඟය නැතිවී බඩු මිලද පහත වැටෙනු ඇත. එමනිසා ඕනෑම අර්ථවත් සැලසුම් කිරීමක් මගින් අර්ථ ක්‍රමය තුළ ස්වයංජාත ආරක්ෂා විධි විනාශයට පත්නොකර තව තවත් කාර්යක්ෂම ලෙස ක්‍රියාකරවීම පිණිස ඒවා ශක්තිමත් කළ යුතුය.

ඉහතින් සඳහන් කළ කරුණු ඉතාමත් සරල ආර්ථික සිද්ධාන්ත වුවද, බොහෝවිට මේවා අමතක කරනු ලැබේ. ඇත්ත වශයෙන් අතීතයෙහි ශ්‍රී ලංකාවේදී සිදුවී ඇත්තේ දුරදිග නොබලා සහ දැඩි ලෙස රජය මැදිහත්වීම නිසා ආර්ථික ක්‍රමය තුළ ඉබේම පිහිටා ඇති ආරක්ෂා විධිවිධාන දුර්වල වීමය.

නිදහස ලැබීමෙන් පසු එළඹී දශක කිහිපය ඇතුලතදී රජයේ මැදිහත්වීම කොපමණ දුරට බාධාවක්ව පැවතුණේද යතහොත් ඇත්ත වශයෙන්ම ආර්ථිකය කප්පාදුවී යන තැනට වැඩ සැලසුණේය. පමණ ඉක්මවා මැදිහත්වීම හේතුකොටගෙන ආර්ථිකය කප්පාදුවූ අයුරු උදහරණ කිහිපයක් අනුසාරයෙන් සලකා බැලිම වටී.

අඩුම වශයෙන් කියනවා නම් ''නිෂ්පාදන විරෝධී'' යයි විස්තර කළහැකි පාරිභෝගික සහනාධාර හා සලාක ක්‍රමයක් අපට තිබිණ. නොමිලේ හෝ අධික සහනාධාර මිලකට පාරිභෝගිකයාට සහල් සැපයීමේදී එය මිල ක්‍රමය කෙරෙහි කොතරම් බලපෑමක් ඇතිකරන්නේද කිවහොත්, සහල් සඳහා සහතික මිලක් ගෙවා නිෂ්පාදකයා උනන්දු කරවීමට සිදු වන්නේය. මේ නිසා රජයට පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම සඳහා විදේශයෙන් අවම සහල් ප්‍රමාණයක් මිලදී ගැනීමට සිදුවන අතර, ඒ සඳහා වැඩි වැඩියෙන් විදේශ ධනය වැය කිරීමටද සිදුවන්නේය. අයවැය පරතරයක් ඇතිකොට ජීවන වියදම කෙරෙහි අහිතකර බලපෑමක් ඇතිකොට ප්‍රවර්තන ගිණුමේ රාජ්‍ය වැය පියවා ගැනීමට අසීරු තත්ත්වයක් උදකරලීමෙන් එය තවදුරටත් ආර්ථිකය කෙරෙහි බලපායි. එම නිසා ඇත්ත වශයෙන්ම සහනාධාර ලබා දුනද පාරිභෝගිකයාට එහි ප්‍රතිලාභ නොලැබෙයි. මක්නිසාද යත්, ප්‍රමාණවත් ආදයම් රැස්කර ගැනීම සඳහා රජය උත්සාහ දැරීම නිසා, නොකඩවා මිල මට්ටම් ඉහළ යන්නේය. මෙයින් සහනාධාර ක්‍රමවල මූලික අරමුණටම පහරක් වැදේ. එනම්: ඉහළ නගින ජීවන වියදම මැඩ පැවැත්වීමේ අදහසින් සහනාධාර හා සලාක ක්‍රම තවදුරටත් වැඩි කිරීමට හෝ රජයට සිදුවේ. මෙයින් තවදුරටත් අයවැය පරතර ඇතිවීම හා ජීවන වියදම ඉහළ නැගීමද සිදුවේ. සෘණ ප්‍රතිලෝමන ක්‍රමයේ අනික් පැත්ත හෙවත් ධන ප්‍රතිලෝමන ක්‍රමය ක්‍රියාත්මකවීම පිළිබඳ උදහරණයකි මේ. එනම්: සහනාධාර හා සලාක ක්‍රමයෙන් අයවැය පරතරය අධිකවීම හේතුකොටගෙන ජීවන වියදම් ඉහළ නැගීම නිසා සලාක හා සහනාධාර ක්‍රම වැඩි කිරීමට රජයට සිදුවේ. එසේ වරක් සහනාධාර සැලසීම නිසා නැවත නැවතත් සහනාධාර වැඩිකිරීමට සිදුවන්නේය.

සහල් සඳහා සහතික මිළ ගෙවීමේ ක්‍රමයෙන් පවා අපගේ ප්‍රධාන ආහාරය වන සහල් නිෂ්පාදනයෙහි ලා රට ස්වයංපෝෂිත කිරීමට අසමත්වී ඇත. අවුරුදු 40 කට අධික කාලයක් මුළුල්ලේ සහල් සඳහා සහතික මිල ගෙවීම හා වී වගා කෙරෙන ප්‍රදේශ ක්‍රමවත් ලෙස වැඩිකිරීම හා ගොවීන්ට වෙනත් ආධාර සේවා සැලසීම කළද සහල් නිෂ්පාදනය අතින් ස්වයංපෝෂිත වීමට තවමත් බැරිව සිටිමු. වෙනත් සාධක හැරුණු විට සහතික මිල ක්‍රමය අසාර්ථක වීමට හේතුවූ කරුණ නම් සහතික මිල ක්‍රමය යටතේ ගෙවූ මිල බොහෝ අවස්ථාවලදී වෙළඳපොළෙහි නියම මිල හා නිෂ්පාදන පිරිවැයටද වඩා අඩුවීමයි. දිගටම විශාලවන්නාවූ අයවැය පරතරය හා ආර්ථිකයේ සීමා කිරීම් සමූහයද හේතුකොට ගෙන බඩුමිල ඉහල යාම සිදුවී ඇත. අඛණ්ඩව ජලය සැපයුම් හා මිල අඩු පොහොර යනාදි වූ වැදගත් යෙදවුම් නොලැබීම නිසා සිය නිෂ්පාදනය වැඩිකර ගැනීමට ගොවියාට සහතික මිල ක්‍රමය යටතේ කිසිම අනුබලයක් නොලැබේ.

ආර්ථිකයේ දළදැඩි සීමාකිරීම් පිළිබඳ සිය ගණන් උදහරණ ගෙනහැර දැක්විය හැකි වුවද කාරණය දැන් පැහැදිලිවී ඇතැයි මම සිතමි.

ආර්ථික කටයුතුවල රජය බොහෝ සේ මැදිහත්වීමෙන්, ආර්ථිකයේ සෘණ ප්‍රතිලෝමන ක්‍රමය අඩපණවී ධන ප්‍රතිලෝමන ක්‍රමය ඉස්මතුවීමට මඟපෑදීම නිසා ආර්ථිකය තව තවත් ප්‍රපාතයට ඇද වැටුණි.

අප මෙයාකාරයෙන් ආර්ථිකය දෙස බැලුවහොත් ආර්ථිකය ලිහිල් කිරීම යන පදය අර්ථවත් වනු ඇත. රජය සෑම දෙයකටම මැදිහත් නොවීසිටීම හෝ රාජ්‍ය නිර්බාධ ධනවාදී ක්‍රමය හෝ ඉන් අදහස් නොකෙරේ. ඉන් අදහස්වනුයේ ආර්ථිකයේ සෘණ ප්‍රතිලෝමන ක්‍රමය ශක්තිමත් කිරීමට හා තහවුරු කිරීමට රටෙහි ආර්ථික කටයුතුවලට රජය මැදිහත්වීමය. ඉන් අදහස්වනුයේ අවශ්‍යවූ අවස්ථාවලදී ආර්ථිකයට මග පෙන්වීම මිස නාස්ලණුවෙන් දක්කාගෙන යාමක් නොවේ. එමනිසා ආර්ථිකය ලිහිල් කිරීම යනු සමාජය පිළිබඳ හැඟීමක් ඇති සෑම දෙනෙකුගේම දෝශ දර්ශනයට ලක්වූ ධනවාදය ඉතා දරුණු ස්වරූපයෙන් පැවති 19 වන සියවස කරා ආපසුයාමට මඟ එළිපෙහෙළි කිරීමක් නොවන බව සඳහන් කළ යුතුය.

එසේවුවද, සීමිත හා බාධිත ආර්ථිකයකින් වඩා නිදහස් නොබැඳි ආර්ථිකයකට පරිවර්තනය වීම පීඩාකාරී වියහැකි බැවින් සාමකාමී ලෙස නිදහස් ආර්ථිකයකට පරිවර්තනය විය හැකි අන්දමේ අවධිගත වැඩ සටහනක් තිබීම අවශ්‍යය. සහනාධාර හා සලාක ක්‍රමවලින් පාරිභෝගිකයාට වදින අනපේක්ෂිත ප්‍රහාර වලින් රැකගැනීම ඔහු සහනාධාර හා සලාක ක්‍රම මත රඳා පැවති නිසා මෙය හුදු ආර්ථික විද්‍යාවට අදළ දෙයක් නොව දේශපාලන අර්ථ ක්‍රමයට අදළ දෙයක් ලෙස සඳහන් කළ හැක. පාරිභෝගිකයා මෙම හදිසි වෙනස්වීම නුරුස්සනු ඇත. නැතහොත් ඔහුට එය විඳ දරා ගැනීමට අපහසු වනු ඇත. මෙම ලිපියට දේශපාලන අර්ථ ක්‍රමය යන මාතෘකාව යෙදීමට හේතුව මෙයයි. මක්නිසාද යත්, දේශපාලන අර්ථ ක්‍රමය අනුව බැලීමේදී, පරිවර්තනය වන කාලසීමාව ඇතුලත මහජනයාට කලින් සකස් කළ පොරොන්දු මාලාවක් ඉරිපත් කළයුතුය. මෙමගින් පරිවර්තන යුගයට අයත් වේදනා මර්ධනය වීමද, ශීඝ්‍ර හා ස්වයංධාරක සංවර්ධනය සඳහා ආර්ථිකය යොමුකරවීමටද අවශ්‍ය වන දේශපාලන ස්ථාවරභාවය ඇතිවන්නේය.

1. L. Jayawardena "Case Study of Sri Lanka" in A. Cherney et al "Redistribution with Growth" Oxford University Press, 1964.

2. Mishan, "Cost Benefit Analysis".

3. Dudley Seers, "The prevalence of pseudo planning". Mike Faber & Dudley Seers ed. "Crisis in Planning", Chatto & Windus, 1972.

විද්‍යාත්මක කටයුතු, ව්‍යාපෘති හා ප්‍රවර්තන පර්යේෂණ හා අදල කොරතුරු මෙන්ම විවේචන හා අදහස් පළකිරීම්ද ඉදිරිපත් කරනු ලැබේ නම් ඒවා සතුටින් පිළිගනු ලැබේ. ප්‍රවෘත්ති පරමාර්ථ කොටගෙන මෙම ප්‍රකාශනය පළ කෙරෙන බැවින්, කතුවරයන්ගේ මත හෝ ඉදිරිපත් කර ඇති කරුණු හෝ ඒවායේ අර්ථ නිරූපනයක් හෝ පිළිබඳව ජාතික විද්‍යා සභාව වගකීම භාර නොගනී.

විදුරාව මාර්තු, ජූනි, සැප්තැම්බර් හා දෙසැම්බර් යන මාස වලදී ත්‍රෛමාසිකව ඉංග්‍රීසි, සිංහල හා දෙමළ යන භාෂාවලින් පළකරනු ලැබේ.

මෙහි පළකිරීම සඳහා එවනු ලබන ලිපිලේඛන හා අදල ලිපි ගනුදෙනු පහත සඳහන් අය වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

සංස්කාරක, විදුරාව,
ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභාව,
47/5, මෙට්ලන්ඩ් පෙදෙස,
කොළඹ 7.